# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2016** මාර්තු **21** වන සඳුදා
2016 பங்குனி 21 திங்கட் கிழமை
Monday 21st March 2016

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை .ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.32 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.32 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.32 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# නිවේදනය
## ANNOUNCEMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පසුගිය සභා රැස්වීම් දිනයේදී එනම්, 2016.03.08 දින එළැඹුණු එකඟතාවයට අනුව, හෙට හා අනිද්දා එනම්, මාර්තු මස 22 හා 23 යන දිනයන් සභා රැස්වීම් නොපැවැත්වෙන දිනයන් වන බව සියලු දෙනා වෙත දැනුම් දෙනවා.

අද දින න්‍යාය පත්‍රය සමඟත් මෙම දැනුම් දීම ගරු මන්ත්‍රීවරුන් වෙත කර තිබෙන බව කාරුණිකව දැනුම් දෙනවා.

# ලිපි ලේඛන පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩුකාර ලේකම් විසින් අංක 2/1/2/9 හා 2015.09.17 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි විගණකාධිපතිතුමා විසින් 2015.08.31 දිනැතිව ඉදිරිපත් කරනු ලැබූ, විස්තරාත්මක වාර්තාව 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය පරිදි මෙම පළාත් සභාවට ඉදිරිපත් කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව දන්වා තිබෙනවා.

ඒ අනුව ශීර්ෂ අංක 108 යටතේ එයට අදාළ වූ 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක වාර්තා මම මෙම සභාවට ඉදිරිපත් කරනවා.

***එකී විගණකාධිපති වාර්තාව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ලේකම්වරයාට නියෝග කරන ලදී.***
*The Secretary was ordered by the Hon. Chairman to refer the aforesaid Auditor General's Report to the Provincial Public Accounts Committee.*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා රැස්වීම් වාර්තා මම පිළිගන්වනවා.

i. 2016.03.09 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

ii. 2016.01.29 දින පැවති පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු සන්ධ්‍යා සිරිවර්ධන**
Hon. Sandya Siriwardana

ගරු සභාපතිතුමනි, පහළගම, කළගෙඩිහේන, තිහාරිය අංක 541 හි පදිංචි බී.එම්.පී. ගුණරත්න යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, පුවක්පිටිය, කිරිවන්දල, අංක ඒ/14, නිවාස 500 හි පදිංචි ඩබ්ලිව්.ජී. චන්දන පුෂ්පකුමාර යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුමිත් ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumith Lal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, කළුතර, නාගොඩ රෝහල පාර, අංක 38/බී, 'බුද්ධිවිලා' හි පදිංචි එච්. චතුරි බුද්ධිකා ද සිල්වා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ගරු අධ්‍යාපන ඇමතිතුමාට යොමු කිරීමට අවස්ථාව. මේ අවස්ථාවේදී මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) [ගරු අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Animal Production and Health and Agrarian Development.) [On Behalf of Minister of Education]

ගරු සභාපතිතුමනි, පළමු වන ප්‍රශ්නයට පිළිතුර සභාගත කරනවා.

*** *[සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. 2015.12.31 වන විට කලාප හා පළාත් වශයෙන් ගුරු හා විදුහල්පති සේවාවල සිදු කරන ලද විනය පරීක්ෂණ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?*

***පිළිතුර :***

*අ. 2015 වසරේ ගුරු සේවයට අදාළ විනය පරීක්ෂණ සංඛ්‍යා*

| *අංකය* | *කලාපය* | *ගුරු සේවයේ විනය පරීක්ෂණ* |
|---|---|---|
| *01.* | *කොළඹ* | *01* |
| *02.* | *ශ්‍රී ජයවර්ධනපුර* | *02* |
| *03.* | *හෝමාගම* | *03* |
| *04.* | *පිළියන්දල* | *02* |
| *05.* | *ගම්පහ* | *02* |
| *06.* | *කැලණිය* | *02* |
| *07.* | *මිනුවන්ගොඩ* | *04* |
| *08.* | *මීගමුව* | *02* |
| *09.* | *කළුතර* | *01* |
| *10.* | *මතුගම* | *-* |
| *11.* | *හොරණ* | *02* |
| | *එකතුව* | *21* |

*විදුහල්පති සේවයේ කරන ලද විනය පරීක්ෂණ සම්බන්ධයෙන් පිළිතුරු සැපයීම සඳහා සති දෙකක කාලයක් ලබා දෙන ලෙස සභාවට දන්වා සිටිමි.*

***ප්‍රශ්නය :***

*ආ. ඉන් මූලික විමර්ශන මත යැයි සඳහන් කරමින් ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධරයින්ගේ නාම ලේඛන හා ඊට අදාළ දින වකවානු මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?*

***පිළිතුර :***

*ආ. මූලික විමර්ශන මත ස්ථාන මාරු කර ඇති ගුරු සේවයේ නිලධරයන්ගේ විස්තර*

| *අංකය* | *නිලධාරියාගේ නම* | *ස්ථාන මාරු කළ දිනය* |
|---|---|---|
| *01* | *එම්.එම්.එස්. ද කොස්තා මිය* | *2015.12.15* |
| *02.* | *ජේ.එල්. ජයන්ත මහතා* | *2015.06.* |
| *03.* | *ආර්.ඩී. ලංකා වසන්තා මිය* | *2015.01.30* |
| *04.* | *පූජ්‍ය කල්පේ ධම්මාලෝක හිමි* | *2015.06.08* |
| *05.* | *ඊ.එම්. සුනීතා සිල්වා මිය* | *2015.05.08* |
| *06.* | *තුෂාරි පෙරේරා මිය* | *2015.10.08 ලිපිය මගින් 2016.01.08 දින සිට* |
| *07.* | *ඒ.එල්.ඒ.ඒ.ඩී. විජයරත්න මයා* | *2015.10.08 ලිපිය මගින් 2016.01.08 දින සිට* |

| | | |
|---|---|---|
| *08.* | *ජී.එම්.යූ. ලලින්ද්‍ර මයා* | *2015.10.08 ලිපිය මගින් 2016.01.08 දින සිට* |
| *09.* | *පූජ්‍ය එච්. චන්දිම හිමි* | *2015.10.08 ලිපිය මගින් 2016.01.08 දින සිට* |
| *10.* | *වයි.ඒ.ඒ.ඩී. කරුණාරත්න මයා* | *2015.04.27* |
| *11.* | *ආර්.එස්.එස්. විරන්ත වීරසිංහ මයා* | *2015.07.07* |
| *12.* | *අරුණ ලාල් ගමගේ මයා* | *2015.01.29* |
| *13.* | *කේ.වී.ජේ. ප්‍රසන්න මයා* | *2015.10.16* |
| *14.* | *එම්.එච්.පී.කේ. දයානාත් මයා* | *2016.01.08* |
| *15.* | *ඊ.එම්.එම්.කේ. සොයිසා මයා* | *2015.10.13* |
| *16.* | *පී.පී.ආර්. බණ්ඩාර මයා* | *2015.10.13* |
| *17.* | *පී.ජී.එන්. ප්‍රියන්ත මයා* | *2015.10.13* |

***ප්‍රශ්නය :***

*ඇ. එම විනය පරීක්ෂණ පැවැත්වෙන නිලධරයන්ගෙන් මාස 03 ක් ඉක්මවා තිබියදීත් චෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීමට කටයුතු නොකළ නිලධාරීන් කවරේද?*

***පිළිතුර :***

*ඇ. විධිමත් විනය පරීක්ෂණ පැවැත්වෙන සියලු නිලධරයන් වෙත චෝදනා පත්‍ර නිකුත් කර ඇත.*

***ප්‍රශ්නය :***

*ඈ. ඒ පිළිබඳව වෙන් වෙන් වශයෙන් මෙම ගරු සභාවට කරුණු දක්වන්නේද?*

***පිළිතුර :***

*ඈ. අදාළ නොවේ.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 02 ත් ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමාගේ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [ගරු අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Minister of Education]

ඒ සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

03 වන ප්‍රශ්නයත් ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමාගේ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [ගරු අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Minister of Education]

ඒ සඳහාත් සති දෙකකට කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

04 වන ප්‍රශ්නය ගරු අශෝක රන්වල ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ගරු කෘෂිකර්ම ඇමතිතුමා වෙත යොමු කිරීමට අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු සභාගත කරනවා.

*** *[සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්ක මායිම් කරමින් කි.මී. 40 කට වැඩි දුර ප්‍රමාණයක් ගෙවමින් ගලා යන කැලණි ගඟෙහි වම් සහ දකුණු ඉවුරු ආශ්‍රිතව එම දිස්ත්‍රික්ක තුළ පවතින පොදු තොටුපල සංඛ්‍යාව කොපමණද?*

***පිළිතුර :***

*අ. තොටුපල සංඛ්‍යාව 31 කි.*

***ප්‍රශ්නය :***

*ආ. එම තොටුපල නාම ලේඛනය මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද?*

***පිළිතුර :***

*ආ. ඔව්.*

*දකුණු පස ඇති තොටුපලවල නම්,*

- *සමනබැද්ද පට්ටිවිදාන වත්තේ තොටුපල*
- *සමනබැද්ද පොදු සුසාන භූමිය අසල තොටුපල*
- *සමනබැද්ද යට්ටෝවිට පල්ලිය අසන තොටුපල*
- *වෙල්ගම මහවත්ත තොටුපල*
- *උඩමාපිටිගම කපාපු තොටුපල*
- *රණාල තොටුපල*
- *මල්වාන තොටුපල*

* කිරියාමුල්ල තොටුපල
* පට්ටිවිල තොටුපල
* බොල්ලෑගල තොටුපල
* කපුගොඩ තොටුපල
* නිකවල පල්ලියවත්ත තොටුපල
* මෝදරවත්ත තොටුපල
* ඕවිටිගම තොටුපල
* කුමාරිමුල්ල තොටුපල
* පූගොඩ තොටුපල
* හද්දොව්ව තොටුපල
* තල්වත්ත තොටුපල
* රුග්ගහවත්ත තොටුපල
* මල්වානට හැරෙන හන්දිය අසල තොටුපල
* බියගම විලේජ් අසල තොටුපල
* බියර් කොම්පැණිය අසල තොටුපල
* තරාල තොටුපල
* දෙවිදූගම තොටුපල
* උඩුගම තොටුපල
* රන්වල තොටුපල
* පැලවත්ත තොටුපල

වම් පස ඇති තොටුපලවල නම්,

* ඇස්වටුඔයේ සිට කිලෝමීටර් 0.5 ක පමණ ප්‍රමාණයකින් අවිස්සාවේල්ල දෙසට ඔරු ප්‍රවාහනය කරන තොටුපල
* ඇළේ සිට කිලෝමීටර් 01 ක් පමණ කඩුවෙල දෙසට ඔරු ප්‍රවාහනය කරන තොටුපල
* ඇළ මාර්ගයේ සිට කිලෝමීටර් 0.5 ක් පමණ දුරින් පිහිටි තොටුපල
* ඇළ මාර්ගයේ සිට කිලෝමීටර් 1 ක් පමණ කඩුවෙල දෙසට පිහිටි තොටුපල

**ප්‍රශ්නය :**

ඈ. කැලණි ගඟ වෙත ගමන් කරනු ලබන ඇළ වේලි සංඛ්‍යාව (ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්ක බල ප්‍රදේශයන්ට අදාළව) කොපමණද?

**පිළිතුර :**

ඈ. ඇළවේලි සංඛ්‍යාව 29 කි.

**ප්‍රශ්නය :**

ඈ. එම ඇළ වේලි නාම ලේඛනය මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද?

**පිළිතුර :**

ඈ. ඔව්.

* හැමිල්ටන් ඇළ
* කළු ඇළ
* පට්ටිවිල මහ ඇළ
* මා බිම වතුරපාන ඇළ
* පහුරුඔය මහ ඇළ
* වෙදකුඹුරු ඇළ
* ආටිගල යාය ඇළ
* සමනබැද්ද ඇළ
* යටිටෝවිල ඇළ
* නිකවල ඇළ
* කපුගොඩ ඇළ
* පූගොඩ ඇළ
* මීතිරිගල ඇළ
* මැදගොඩ ඇළ
* ලන්දේසි ඇළ
* පෙඩෙස්ට්‍රියන් ඇළ
* කිරිවන්ද ඇළ
* වනාගොඩ ඇළ
* ඇඹුල්ගම වල්විට බලවල ඇළ
* රණාල ඇළ
* උඩුගොඩ ඇළ
* මඩපෙන ඇළ
* රන්වල මුත්තෙට්ටු හෙළ ඇළ
* රදා ඇළ
* හේවගම ඇළ
* අඹතලේ ඇළ
* නිර්මාවිල ඇළ
* කැලණිමුල්ල ඇළ
* සේදවත්ත කිත්තම්පහුව ඇළ

ගංගාවන් - 01

* සීතාවක ගඟ

ඔයවල් - 05

* පුවක්පිටිය ඔය
* ඇස්වටු ඔය
* කළුඅග්ගල වක් ඔය
* පුස්ඇල ඔය
* හෙට්ටිගේ ඔය

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 05 යටතේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ධීවර, මාර්ග, ප්‍රවාහන ඇමතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලලිත් වනිගරත්න** (ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Fisheries, Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, පිළිතුරු සභාගත කරනවා.

*** [සභාගත කරන ලද පිළිතුර]**
*[Tabled Answer]*

*ප්‍රශ්නය :*

*අ. මදුරාවල සමුපකාර සමිතියට ඉන්ධන පිරවුම්හලක් ලබා දීම සඳහා නිව්වැටල් වතු යායේ ඉඩමක් වෙන් කර ඇති බව ඔබතුමා දන්නෙහිද?*

*පිළිතුර :*

*අ. ඔව්.*

*ප්‍රශ්නය :*

*ආ. එම ඉන්ධන පිරවුම්හල තැනීමට මුල්ගල තබා ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීමට සකස් කළ බව ඔබතුමා දන්නවාද?*

*පිළිතුර :*

*ආ. ඔව්. 2010.11.22 දින මුල් ගල තබා ඇත.*

*ප්‍රශ්නය :*

*ඇ. එය අතරමග නතර වී ඇත්තේ කුමන හේතුවක් නිසාද?*

*පිළිතුර :*

*ඇ. මූලික අනුමැතිය 2008.02.08 වන දින ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලැබී ඇතත් එම ආයතනයෙන් දන්වා ඇති පරිදි බදු කාලය අවුරුදු 15 දක්වා දීර්ඝ කර ගෙන නොමැති වීම හා ගොඩනැගිලි සැලැස්ම ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් අනුමැතිය ලබාගෙන නොමැති වීම.*

*ප්‍රශ්නය :*

*ඈ. එම ඉන්ධන පිරවුම්හල ඉදි කරන්නේ නම් එය ප්‍රදේශවාසීන්ට සේවාවක් වන අතර, සමුපකාර සමිතියට ආදායම් ඉපැයීමේ මාර්ගයක් බව ඔබතුමා දන්නෙහිද?*

*පිළිතුර :*

*ඈ. ඔව්.*

*ප්‍රශ්නය :*

*ඉ. එම ව්‍යාපෘතිය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?*

*පිළිතුර :*

*ඉ. ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් දන්වා ඇති පරිදි බදු කාලය අවුරුදු 15 ක් දක්වා දීර්ඝ කර ගැනීමට හා ගොඩනැගිලි සැලැස්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් අනුමැතිය ලබා ගැනීමට සමිතියට උපදෙස් දී ඇත.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 06 රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාගේ නමින් තිබෙන්නේ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත යොමු කිරීමට අවස්ථාව.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන ඇමතිතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, ඒ සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 07 ත් රොයිස් විජිත ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේමයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන ඇමතිතුමා වෙනුවෙන්]**
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, ඒ සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 08 යටතේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව. දෙදෙනාම සභා ගර්භයේ නැහැ. ඒ නිසා ප්‍රශ්නය ඊළඟ සභාවට යොමු කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, ඇමතිවරු නොහිටියා නම් කොපමණ කෑ ගහනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව් නේද?

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ප්‍රශ්නය අහන මන්ත්‍රීතුමාත් නැහැ. ඒකයි කනගාටුදායක තත්ත්වය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

09 වන ප්‍රශ්නයත් අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා [ගරු අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන්]**
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Minister of Education]

ගරු සභාපතිතුමනි, ඒ සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

10 වන ප්‍රශ්නය නන්දන පද්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා [ගරු අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන්]**
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Minister of Education]

ගරු සභාපතිතුමනි, ඒ සඳහාත් සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

11 වන ප්‍රශ්නය ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු අධ්‍යාපන ඇමතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව. එතුමියත් නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා [ගරු අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන්]**
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Minister of Education]

ගරු සභාපතිතුමනි, ඒ සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

12 වන ප්‍රශ්නයත් එතුමියගේමයි. ගරු අධ්‍යාපන ඇමතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා [ගරු අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන්]**
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Minister of Education]

ගරු සභාපතිතුමනි, ඒ සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීට පෙර සභාවලදී ඇමතිතුමාට දෝෂාරෝපණය කළා ඇමතිතුමන්ලා සූදානම් නැහැ. ප්‍රශ්නවලට උත්තර දෙන්න වෙලාවට එන්නේ නැහැයි කියලා. නමුත් අද ප්‍රශ්න අහන අය නැහැ. ඒකත් කනගාටුදායක සිද්ධියක්.

# නොපැමිණ සිටීමේ අවසරය
LEAVE OF ABSENCE

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, අමල් පුෂ්පකුමාර සිල්වා ගරු මන්ත්‍රීතුමාට මාසයක කාලයක් සඳහා නිවාඩු අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පෞද්ගලික පැහැදිලි කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ මාළඹේ ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලයේ මතුව ඇති ප්‍රශ්නය පිළිබඳව සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, කාලය ලබා දීම ගැන බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මාළඹේ ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලයේ ඇති වී තිබෙන තත්ත්වය නීතිය හමුවට යා යුතු එකක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. මම නියෝජ්‍ය පොලිස්පතිතුමාට ලිපියක් මඟින් මේ පිළිබඳව දැනුම් දුන්නා. ඒ ලිපියේ සඳහන් කළා, විශේෂයෙන් මේ සිද්ධිය පිළිබඳව කිසිදු පියවරක් නොගැනීම ගැන. ගරු සභාපතිතුමනි, 2016.02.28 වැනිදා උදේ 8.30 ට පමණ මේ විදුහල්පතිතුමිය පාසල් සංවර්ධන සමිතිය රැස් කරනවා. ඒ නියමිත කාලයට කලින් රැස් කරලා, ඇයට අවශ්‍ය නිලධාරීන් පිරිසක් මේකට පත් කර ගැනීමට උත්සාහ කරනවා. ඒකේදී විදුහල්පතිතුමිය උත්සාහ කරනවා, එතුමියට කැමැති කෙනෙක් ලේකම් ධුරයට පත් කර ගන්න. එතැන යම් කථා බහක් සිද්ධ වෙලා විදුහල්පතිතුමියගේ මෙහෙයවීමෙන් හිටපු ලේකම්වරයාට බරපතළ විදියට පහර දෙනවා. පහර දුන්නාට පස්සේ, මේ ලේකම්වරයා දවස් තුනක් රෝහලේ ප්‍රතිකාර ලබනවා. ඊට පස්සේ මේ පිළිබඳව එදිනම පැමිණිල්ලක් කරනවා. එදිනම පැමිණිල්ලක් කරලත් පොලීසිය මෙතෙක් විධිමත් පරීක්ෂණයක් පවත්වලා නැහැ. ඉතාම මන්දගාමී විධියට වැඩේ යන්නේ. මේ පහර දීමට ලක් වූ පුද්ගලයා බලන්න පොලීසිය යන්නේ පහුවදා රාත්‍රී 9.30 ට. දැන් ඇත්ත වශයෙන්ම මේ නිලධාරීන් පොලීසියට දැනුම් දෙනවා. ඡායාරූප මා ළඟ තිබෙනවා. පහර දුන් පුද්ගලයාගේ ඡායාරූප පවා දැනුම් දෙනවා. CCTV කැමරා දර්ශන තිබෙනවා. විදුහල්පතිතුමිය මේ සංවර්ධන සමිතියේදී කරපු ප්‍රකාශය, මේ උසිගන්වන සුළු ප්‍රකාශ පිළිබඳ CD පටි තිබෙනවා. මේ සියල්ල තිබිලත් පොලීසිය මේ සම්බන්ධව පරීක්ෂණ නොකිරීම බරපතළ ප්‍රශ්නයක්. මම මේ පිළිබඳව ඇමතිතුමාට දැනුම් දුන්නාම ඇමතිතුමා කිව්වා, ඒ අලුතෙන් පත් කර ගත් සමිතිය වහාම අහෝසි කරලා අලුතෙන් ඡන්දයක් තියන්න කියලා. නමුත් ඒකත් තවම ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ වාගේම මම කලාප අධ්‍යක්ෂවරියට දැනුම් දුන්නා. ඇමතිතුමාට කිව්වා. ලේකම්තුමාට කිව්වා. වහාම පරීක්ෂණයක් කරන්න. මේ විදුහල්පතිනියට විරුද්ධව බරපතළ චෝදනා තිබෙනවා. මේ විදුහල්පතිනිය එන කොට මේ පාසලේ උසස් පෙළ A 3 ගත්ත ළමයින් 17 දෙනෙක් හිටියා. පසුගිය අවුරුද්ද වන කොට A 3 ගත්ත ළමයින් 03 දෙනා දක්වා පහළ වැටී තිබෙනවා. ඒ වාගේම 2013 දී පහ වසර ශිෂ්‍යත්වය සමත් ළමයින් 30 කට අධික සංඛ්‍යාවක් හිටියා. පසුගිය අවුරුද්ද වන කොට ඒක 15 ට බැහැලා තිබෙනවා. ඒ නිසා මේ C.K. වික්‍රමාරච්චි කියන විදුහල්පතිනිය සම්බන්ධයෙන් බරපතළ චෝදනා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මෙතුමිය මේ පාසලට පත් කරන්න තරම් අධ්‍යාපන සුදුසුකම් පවා නැහැ. ඒ පිළිබඳව ඉතා වගකීමෙන් ප්‍රකාශ කරනවා. ඒ වාගේම මෙතුමිය පත් වුණේ කොහොමද? ගෙනාවේ කවුද? මේ පිටුපස්සේ ඉන්නේ කවුද? කියලා තව කතන්දර තිබෙනවා. නමුත් ඒවා මෙතැනට අදාළ නැහැයි කියලා මම හිතනවා.

ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වන්නය කියලා අපි අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ පාසල මේ පළාතේ තිබෙන හොඳම පාසලක්. මේ පාසලේ ළමයින් 3500 ක් විතර ඉන්නවා. ඒ නිසා මේ ළමයි 150, 200 ක් හිටපු පාසලක ඉඳලා, මේ නුසුදුසු විදුහල්පතිනියක් මෙතැනට ගෙනැල්ලා මේ පාසල සම්පූර්ණයෙන් විනාශ කරන තත්ත්වයට දැන් පත් වෙලා තිබෙනවා. මම හිතන්නේ, මේ විදුහල්පතිතුමිය සම්බන්ධයෙන්

[ ගරු සුසිල් කිඳෙල්පිටිය ]

පරීක්ෂණය ඉතාම මන්දගාමී විධියට තමයි කලාප කාර්යාලයෙනුත් කෙරෙන්නේ. මේ ඇයව ආරක්ෂා කරන්න උත්සාහ කරන සමහරු ඉන්නවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් බරපතළ තීරණයක් ගන්න ඕනෑ. එතුමියට විරුද්ධව නඩුවක් පවා පවරලා තිබෙනවා. එතුමියගේ පත්වීම අභියෝගයට ලක් කරලා. දැන් මේ විදුහල්පතිතුමිය පත් වන කොට - මේ විදුහල්පතිනිය තෝරා ගන්නේ අන්තිම සම්මුඛ පරීක්ෂණයෙන් දීපු ලකුණු කිහිපයකින්. මා ළඟ තිබෙනවා පරීක්ෂණ මණ්ඩල වාර්තාව. මේ පරීක්ෂණ මණ්ඩල වාර්තාවේ එතුමියගේ නම යටින් ලියලා තිබෙනවා, පුමුඛතා ඉල්ලීම අනුව කියලා. ඒ කියන්නේ මේ විදුහල්පතිතුමිය පත් කරන්නේ, යම් යම් දේශපාලන අධිකාරියේ යම් යම් අයගේ ඉල්ලීම් මත. ඒ නිසා මේ පාසල විනාශ වෙන්න දෙන්න එපා. කරුණාකරලා මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වන්න. පවත්වලා නීත්‍යානුකූලව මේ සමිතිය යළි පත් කරලා, මේ විදුහල්පතිනිය සම්බන්ධයෙන් වහාම ක්‍රියාමාර්ගයක් ගන්න. ඒ වාගේම මේ පහර දීමට සම්බන්ධ පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සඳහා කටයුතු කරන්න. පරීක්ෂණ පවත්වන්න කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, කඩුවෙල කොට්ඨාශය නියෝජනය කරන, ව්‍යුහ කමිටුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට දැන් මෙතුමා සඳහන් කළ විධියට කඩුවෙල මන්ත්‍රීවරු කවුද කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මට ඔබතුමාට අවස්ථාවක් දෙන්න බැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මගේ වරප්‍රසාද ගැන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාවක් දෙන්න බැහැ. පෞද්ගලික පැහැදිලි කිරීම්වලට දෙන්න බැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

දැන් මන්ත්‍රීවරු ආරක්ෂා කරනවාය කිව්වාම මමත් මේකට අදාළ වෙනවා. මට එහෙම කිසිම අදාළත්වයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කමක් නැහැ. ඔබතුමා නිශ්ශබ්දව ඉන්න. අදාළ නැත්නම් -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මගේ නිවස ආසන්නයේ තිබෙන්නේ. මන්ත්‍රීවරු කිව්වාම - මම එහෙම නම් එතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒකේ මම සම්බන්ධ නැහැයි කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම්වලට වාද විවාද යන්න ගියොත් එහෙම මේ සභාව කරගෙන යන්න බැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මන්ත්‍රීතුමාගේ ඉල්ලීම සාධාරණයි. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න ඕනෑ. ඔබතුමා අවධානය යොමු කළෙත් නැහැ හරියට, මෙතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මම අවධානය යොමු කළා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඒ නිසා මෙතුමා කියන කාරණා ගැන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කිව්වේ, සුදුසුකම් නැති විදුහල්පතිවරයෙක් පත්කරලා තිබෙනවා. ඒකයි අවුල කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම වගකීමෙන් කියනවා. සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාව ඉලක්ක කර ගෙන මම එහෙම ප්‍රකාශයක් කළේ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, එතකොට ඉලක්ක වෙනවා අපි. ඔබතුමා මෙහෙම අදහස් ප්‍රකාශ කරන්න දුන්නාම අපි කියන්නේ මොකක්ද? එහෙම නම් මන්ත්‍රීතුමා කවුද කියලා කියන්න, ආරක්ෂා කරන.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

තොප්පිය හරි නම් දා ගන්න පුළුවන්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

තොප්පිය නොවෙයි. ඔබතුමා ඉලක්ක කරනවා නම් - මේක කඩුවෙල සිද්ධියක්. කඩුවෙල ආසනයේ ව්‍යුහ කමිටුවේ විශේෂයෙන්ම මෙතුමා එන්න පෙර මේ ව්‍යුහ කමිටුවේ අපි ඉන්නේ. මන්ත්‍රී වරප්‍රසාද පාවිච්චි කරලා මේ විදුහල්පතිතුමිය නුසුදුසුයි කියලා එහෙම කියන එක බරපතළ වැරැද්දක්. එක් පැත්තකින් මන්ත්‍රී වරප්‍රසාද පාවිච්චි -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම දන්නවා ඔබතුමාට අමාරුයි කියලා. ඔබතුමාත් සම්බන්ධ වුණා මෙයාව ගේන්න. නැහැයි කියනවාද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපට කිසිම අමාරුවක් නැහැ. කඩුවෙල ආසනයේ විදුහල්පතිවරු පත් කිරීමේදී -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම මේ ගැන ඔබතුමාට කථා කළාම ඔබතුමා මට මොකක්ද කිව්වේ? මම ඔබතුමා එක්ක මේ ගැන දුරකථනයෙන් කථා කළා ද? නැද්ද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔව්. ඉතින් -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙමනම් ඔබතුමාත් මෙයාව ආරක්ෂා කිරීම පිටිපස්සේ ඉන්නවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මෙතුමා ගේන කුණු ගොඩවල් ඔක්කෝටම ඔව් කියන්න හා කියන්න අපි ලැහැස්ති නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම මෙතුමාට ඔව් කියන්න කිව්වේ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මෙතුමා මේකේ ඉන්නේ මිනිස්සුන්ට ලෙඩ අදින්න නම්, ඒක එතුමාගේ කාර්යභාරය වෙන්න ඇති. හැබැයි, අපට වගකීමක් තිබෙනවා. විදුහල්පතිවරයෙකුට හෝ විදුහල්පතිවරියකට චෝදනාවක් කරනවා නම්, ඒ සම්බන්ධව නිවැරදි ආකාරයෙන් ඉදිරිපත් කරන්න. අපි දන්නේ නැහැ මේ සිද්ධිය සම්බන්ධව. පොලීසියට පැමිණිල්ලක් තිබෙනවා නම් -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඉතින් ඔබතුමාට සම්බන්ධ නැත්නම් ඉන්න. ඔබතුමාට අදාළ නැහැ මේක. ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා, මේ ගැන පරීක්ෂණයක් අපි -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පොලීසියේ තිබෙන පැමිණිල්ලට අදාළව කටයුතු කරන්න ඕනෑ. හැබැයි, පොලීසියේ පැමිණිල්ලක් තිබෙනවා කියලා මෙතුමා ඉතාම පහත් විධියට ඒ නිලධාරීන්ට චෝදනා කිරීම වැරදියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම කිසි කෙනෙකුගේ නම් සඳහන් කළේ නැහැ. මම කඩුවෙල මන්ත්‍රීවරයෙක් කියලා කිව්වෙත් නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මෙතුමා විදුහල්පති සුදු ද? කළු ද? ඒ පාසල මොකක්ද? ඒ පාසලේ ඉන්න ප්‍රමාණයවත් හරියට දන්නේ නැහැ. කිසිම තොරතුරක් දන්නේ නැතිවයි මේ කියන්නේ. මෙතුමා කිසි දෙයක් දන්නේ නැතිවයි මේ කාරණාව කියන්නේ. මෙතුමා පට්ටපල් බොරු කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඉතින් එතුමාවත් වාඩි කරවන්න කෝ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම හිතුවේ මේකට වෙන කෙනෙක් සම්බන්ධයි කියලා. බලන කොට මෙතුමා නේ සම්බන්ධ. මම හිතුවේ මෙතුමා සම්බන්ධ නැහැයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපේ කිසි සම්බන්ධයක් නැහැ. නමුත් කඩුවෙල ආසනයේ පාසල්වල -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මන්ත්‍රීතුමා, කොළඹ දිස්ත්‍රික්කයේ ඕනෑම පාසලක් ගැන අපි කථා කරනවා. මොකක්ද තිබෙන වැරැද්ද? මොකද, කඩුවෙල මිනිස්සු අපටත් ඡන්දය දීලා තිබෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමාට ඡන්දය දීපු එකේ කිසි ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා ඉලක්ක කරලා මන්ත්‍රීවරු -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම ව්‍යුහ කමිටුවේ සාමාජිකයෙක්. මට අයිතියක් තිබෙනවා කථා කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

හරි. දී කිරට බළල්ලුත් සාක්ෂි කියලා අපි දන්නවා. ඔබතුමාගේ එක්කෙනෙක් නිදහස් වෙන්න අනික් මන්ත්‍රීවරු -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හරි දේට සාක්ෂි. වැරදි දේට උදව් කරන්න එපා. හරි දේට උදව් කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ පට්ටපල් බොරු කියන්නේ. මේ සභාවේ වරප්‍රසාද පාවිච්චි කරලා පට්ට පල් බොරු කියන එක නවත්වන්නය කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා දෙන්නාම වාඩි වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම නම් ඒ ප්‍රමුඛතා ඉල්ලීමට මෙතුමාත් සම්බන්ධයි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගොන් කථා කියන්න එපා මන්ත්‍රීතුමා. ඔයා එන්නත් ඉස්සෙල්ලා ආවේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාගේ වෙන සම්බන්ධයක් නැත්නම් මොකක්ද තිබෙන සම්බන්ධය.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එතුමිය 850 ක දරුවෝ ඉන්න පාසලක ඉඳන් මෙතැනට ආවේ. මෙලෝ දෙයක් දන්නේ නැහැ. පට්ටපල් බොරු.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා අනවශ්‍ය විවාදවලට යන්න එපා. ගරු මන්ත්‍රීවරුන් දෙන්නාම කරුණාකරලා වාඩි වෙන්න. දැන් ඉවරයි නේ? පෞද්ගලික පැහැදිලි කිරීම් කරන කොට අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න ගියොත් එහෙම අනික් මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් සිද්ධ වෙනවා. මොකද, අනික් ගරු මන්ත්‍රීතුමාගේ කාලය ගන්නේ මේ. අනික් පැත්තෙන් පෞද්ගලික පැහැදිලි කිරීම් කරන කොට - මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒවා හරියට සොයලා බලලා කියන්න. මන්ත්‍රීවරු කිව්වාම ඔක්කොම මන්ත්‍රීවරු අයිති වෙනවා. ඒ ආසනයේ ඉන්න හැම පක්ෂයේම අය. ඒ නිසා හැකිතාක් දුරට -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම කිසි කෙනෙකුගේ නම් ප්‍රකාශ කළේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඒක තමයි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා එක්කෙනෙක් නිදහස් කළා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කඩුවෙල මන්ත්‍රීවරු ගැන කිව්වේ නැහැ. හැබැයි, මම කියන ප්‍රකාශ මෙතුමා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කඩුවෙල කිව්වා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කඩුවෙල මන්ත්‍රීවරු කිව්වේ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා සරත් පතිරණ මන්ත්‍රීතුමාව නිදහස් කළේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම කිව්වේ නැහැ කඩුවෙල මන්ත්‍රීවරු කියලා. වගකීමෙන් කියන්නේ. කඩුවෙල මන්ත්‍රීවරු කියනවා නම්, එහෙම නම් මම පුවත්පත් වාර්තා පෙන්වන්නම්. සම්බන්ධකම්. හැබැයි, මම ඒවා මෙතැන කිව්වේ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔයා ඕනෑ සම්බන්ධකමක් පෙන්වන්න. අපේ කිසි සම්බන්ධයක් නැහැ. හැබැයි, ඔබතුමා එහෙම එක්කෙනෙක් ආරක්ෂා කරලා චෝදනා කරන එක වැරදියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාට ඇඟිල්ල දික් කළේ නැහැ මම. හැබැයි, ඔබතුමා තොප්පිය හරි නම් දා ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට කළුපහන කනිෂ්ට විද්‍යාලයේ ඇති ගැටළු - ඔක්කොම අධ්‍යාපන ප්‍රශ්න තිබෙන්නේ. ප්‍රශ්නවලින් 09 ක්ම තිබුණේ අධ්‍යාපන ඇමතිතුමාට. දැන් පටන් ගත්ත වෙලාවේ ඉඳන් ඉස්කෝල ප්‍රශ්න. මේකේ ලොකු බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, ඒක කළුපහන නොවෙයි. තක්ෂිලා කනිෂ්ට විද්‍යාලය.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අධ්‍යාපන ඇමතිතුමා නැති එක ගැන කනගාටුයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ලියලා තිබෙන්නේ කළුපහන.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කුළුපන.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කුළුපනත් අයිතියි ඒකට. ගරු සභාපතිතුමනි, තක්ෂිලා කනිෂ්ට විද්‍යාලයේ තට්ටු තුනක ඉදි වෙමින් පවතින ගොඩනැගිල්ලක බැම් බැඳලා නැහැ. තට්ටුව විතරයි දාලා තිබුණේ. කුළුපන විද්‍යාලය, පොකුණුවිට, බැල්ලපිටිය විද්‍යාලයේ හය වන ශ්‍රේණිය සමත් සිසුන් එම විදුහලට ඇතුළත් කර ගැනීම සඳහා භාර දීලා තිබෙනවා. මේ ළමයින්ව ඇතුළත් කර ගත්තාට, ඒ අයට වාඩි වෙන්න අපේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ශාලාවක් හදලා දෙනවාය කිව්වාට ඒ ශාලාව කොන්ක්‍රීට් කණු දාලා, ස්ලැබ් එක දාලා විතරයි තිබෙන්නේ. විදුහල්පතිවරයාට කර කියා ගන්න දෙයක් නැතිව ඉන්නවා. ඒ ස්ලැබ් එක දාලා තිබුණු තුන්වැනි තට්ටුවේ, දෙවැනි තට්ටුවේ මේ ළමයින්ව වාඩි කරවලා උණ බම්බුවලින් වටේ වට කරලා මේ පන්ති පවත්වාගෙන යන්න කටයුතු සූදානම් කරලා තිබුණා. ඊට පස්සේ ඒ ප්‍රදේශයේ දෙමව්පියන් විසින් අග්‍රාමාත්‍ය කාර්යාලයට දැනුම් දීමක් කරලා, එම කාර්යාලය මගින් මට දැනුම් දීමක් කළා, ඒ පාසලට ගිහිල්ලා ස්ථාන පරීක්ෂණයක් පවත්වන්නය කියලා. ඒ ස්ථාන පරීක්ෂණය පවත්වන්න ගිය අවස්ථාවේදී මම විදුහල්පතිතුමාට දුරකථනයෙන් කථා කරලා කිව්වා, මෙන්න මේ වාගේ ක්‍රියාකලාපයක් ඔබතුමා විසින් කර ගෙන ගිහිල්ලා තිබෙනවා. වහාම මේ ළමයින් ටික එහෙම අනාරක්ෂිත තත්ත්වයේ ඉන්නවා නම් එම බිල්ඩින්වල පල්ලෙහාට දාලා ඒකට අවශ්‍ය වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්නය කියලා.

ගරු සභාපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා. විදුහල්පතිතුමා ඒ භයානක තත්ත්වයෙන් ඉවත්ව, ළමයින් ටික පල්ලෙහාට දාලා - ස්ථාන පරීක්ෂණයට ගිය අවස්ථාවේදී මම දැක්කා, ඒ වටේ උණ බම්බුවකින් වට කරලා ළමයින් ටික උඩට දාලා තිබුණා. හදිසියේ ළමයෙකු යම්කිසි ප්‍රශ්නයක් ඇති වෙලා එහාට මෙහාට දුවන්න ගියා නම් උණ බම්බුව කඩාගෙන බිමට වැටෙනවා. බිමට වැටුණොම ළමයා මැරෙනවා. මැරුණාම ඇති වන දේවල් පිළිබඳව අපි කථා කරන කොට ලොකු අවනම්බුවක් මේ පළාත් සභාවට ඇති වෙනවා. ඒ වාගේම අධ්‍යාපනය ලබන දරුවන් සඳහා මේ වාගේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම නිසා ඒ අය අනාරක්ෂිත තත්ත්වයේ පවතින බව ඔබතුමාගේ මාර්ගයෙන් මම මේ සභාවට දැනුම් දෙන්න කැමැතියි.

ඊළඟට මම තව ඉල්ලීමක් කරන්න කැමැතියි. අධ්‍යාපන ඇමතිතුමා මේ ස්ථානයේ නැහැ. වැඩ බලන අධ්‍යාපන ඇමතිතුමා ඉන්නවා. අපේ හිතවත් ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමා. ඔබතුමාගේ මාර්ගයෙන් මම ඉල්ලීමක් කරනවා -

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන ඇමතිතුමා අසනීපයෙන් පසු වෙන නිසා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒකේ ප්‍රශ්නයක් නැහැ. අපි වැඩ බලන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මෙම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා - ගරු සභාපතිතුමනි, අපේ පළාත් අධ්‍යාපන වැය ශීර්ෂය අරගෙන බැලුවාම 2016 වර්ෂයට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. අනික් අමාත්‍යාංශවලට වඩා. මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා. ඉංජිනේරු කාර්යාලයෙන් ඇස්තමේන්තු වාර්තාවක් ගන්න. ටෙන්ඩර් පටිපාටි ගැන හිතන්නේ නැතිව ඉක්මණට අත්‍යවශ්‍ය සේවාවක් හැටියට මේක ක්‍රියාත්මක කරලා මෙම ගොඩනැගිල්ලේ දෙපැත්ත බැඳලා, කම්බි දැලක් ගහන්න. මේ ළමයින් ටික අද ගස් යට ඉන්නේ. ඊයේ පෙරෙයිදා දෙකේම මේක රූපවාහිනියේ ප්‍රවෘත්තිවලට ගියා. මෙන්න මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න වැඩ කටයුතු කරන්නය කියන එක ඉල්ලමින් මෙය ඉතාමත්ම ඉක්මණින් ඔබගේ දැනුම ලබා දීලා, ඉංජිනේරු අංශයට යොමු කරලා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා අවශ්‍ය වැඩ කටයුතු කරන්නය කියන එක ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දවසේ න්‍යාය පත්‍රයේ ප්‍රශ්න 12 ක් තිබුණා. ඒ ප්‍රශ්න 12 න් ප්‍රශ්න 07 ක් ම තිබුණේ අධ්‍යාපන ඇමතිතුමාට. පෞද්ගලික පැහැදිලි කිරීමිනුත් දැනටමත් දෙකක්ම තිබුණේ අධ්‍යාපන ඇමතිතුමාට. ඉතින් එතුමා මම දන්නවා අද සනීප නැතිව ඉන්නේ. අපි එතුමාට සමාව දෙමු. එතුමා වෙනුවෙන් පෙනී සිටින ජ්‍යෙෂ්ට ඇමතිවරයෙක් ඉන්නවා. අපේ ගාමිණී තිලකසිරි අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. මේ ප්‍රශ්නය පිළිබඳව කඩිනම් අවධානය යොමු කර සුදුසු පියවරක් ගන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අද පෞද්ගලික මන්ත්‍රී යෝජනාවත් අධ්‍යාපනයට සම්බන්ධව තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකත් අද ගමු. ප්‍රශ්නයක් නැහැ. පළාත් සභා ප්‍රතිපාදන වෙන් කිරීමේදී මහජන නියෝජිතයන් හට වෙනස් පරිමාණවලින් ලබා දීම හේතුවෙන් මතුව ඇති ගැටළු පිළිබඳව සභාවේ අවධානය යොමු කිරීමට රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මෙහිදී මම විශේෂයෙන්ම සියලුම අමාත්‍යවරුන්ගේ, ඒ වාගේම අපේ මන්ත්‍රීතුමන්ලාගේ අවධානය යොමු කරන්න කැමැතියි. ප්‍රතිපාදන වෙන් කිරීමේදී අපි දන්නවා අපේ මහ ඇමතිතුමා රුපියල් ලක්ෂ 50 ක ප්‍රතිපාදන සියලු දෙනාටම වෙන් කළා. ඇත්ත වශයෙන්ම අපි ඒකට ස්තූතිය ප්‍රකාශ කරන්න ඕනෑ. ඊට අමතරව අපි දැක්කා, තවත් ලක්ෂ 15 ක් මහා මාර්ග සඳහා කියලා ලිපි මාර්ගයෙන් වෙන් කරලා තිබෙනවා. මේ ක්‍රමවේදය අනුව ඇත්ත වශයෙන්ම මේ සභාවට පත් වුණු මන්ත්‍රීවරු හැටියට විටින් විට අපට ගැටළු මතු වෙනවා. මොකද, සමහර කොට්ඨාශයකට ලිපියක් මාර්ගයෙන් නිකුත් කරනවා. අනික් අය දන්නේ නැහැ. ඒ ලිපිය අපට අහු වුණාම තමයි අපි දැන ගන්නේ. ඒක අපි සභාවේ කථා කරන්න යන කොට අපිටත් දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමියට ලක්ෂ 15 හම්බ වුණා නේ? ලක්ෂ 15 ක් දුන්නා නේ වැඩිපුර.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ වාගේම අමාත්‍යාංශවලට. දැන් මට ඊයේ පෙරෙයිදා දුරකථන ඇමතුමකින් කියනවා, අපේ වනිගරත්න ඇමතිතුමාගේ නිවාස ආධාර කිහිපයක් දෙන්න කියලා නම් කිහිපයක් එවන්නය කියලා. මම කියන්නේ, එහෙම නොවෙයි. යම්කිසි නිසි ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. දැන් අපි -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක නේ. ඇමතිතුමා දීලා මොකක්ද කර ගත්තා වාගේ එකක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැහැ. මෙතැන තිබෙන ගැටළුව අපි දැන් මේ අරමුදල් වෙන් කරන්න ඕනෑ අත්‍යාවශ්‍ය දේවල්වලට. දැන් සමහර විට මේකේ අරමුණ තනිකරම දේශපාලන අරමුණ විතරයි. අත්‍යාවශ්‍ය දේ නොවෙයි කරන්නේ. දැන් මම ගරු සභාපතිතුමාගේ අවධානයට යොමු කරන්නේ. මේ අය දේශපාලනයමයි මේකෙන් කරන්නේ. මේක දේශපාලනය නොවෙයි කරන්න ඕනෑ. දැන් මම දැක්කා, ඊයේ පෙරෙයිදා කාපට් කරපු පාරක් ගලවලා ආයිත් කාපට් දානවා. එතකොට හදපු නැති, යන්න බැරි පාරවල් අනන්තවත් තිබෙනවා. ඉතින් මේ ප්‍රතිපාදන වෙන් කිරීමේ ක්‍රමවේදය, ඒවා පාවිච්චි කිරීමේ ක්‍රමවේදය පිළිවෙළකට වෙන්නේ නැහැ. ඒ කියන්නේ කවුරු හරි දේශපාලන උදව් කරපු කෙනෙක් ඇවිල්ලා කියපු ගමන් හදපු පාරක් කඩලා හරි ආයිත් හදනවා. ඉතින් මේ ක්‍රමවේදය දකින කොට අපි මේක අවධානයට යොමු කළේ නැත්නම් මේක දිගින් දිගටම සිද්ධ වෙනවා. දැන් අපට යම්කිසි නිවාස ආධාරයක් දෙනවා නම්, විපක්ෂයේ මන්ත්‍රීවරු ඉන්නවා. අපේ ඒ සියලු දෙනාටම යම්කිසි ලිපියක් මාර්ගයෙන් ක්‍රමවේදයකට අනුව දැනුම් දෙන්න. එතකොට අපි ඒකට අවශ්‍ය කරන විධියට වැඩ කටයුතු කරනවා. මම කියන්නේ, මේ ක්‍රමය දැන් ඉස්සරහාටවත් නවත්වන්න ඕනෑ. දැන් යහපාලනයක්

තිබෙන්නේ. හැමෝම සම්බන්ධ වෙලා ආණ්ඩු කරන්නේ. (බාධා කිරීම්) එහෙම නම් ඔබතුමන්ලා මැරිලා ඉපදෙන්න ඕනෑ. ඉසුර මන්ත්‍රීතුමාගේ ප්‍රතිපාදන ඉල්ලා ගන්න කට්ටිය. එහෙම නම් මැරිලා ඉපදිලා එන්න ඕනෑ. එහෙම නම් ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමාගෙන් ප්‍රතිපාදන ගන්න එපා. යහපාලනයෙන් තමයි මහ ඇමතිවරයාව දැම්මේ. ඒ නිසා තමුන්නාන්සේලා කරුණාකරලා ඒ ප්‍රතිපාදන ටික, ඒ ගත්ත ඒවා අපට දෙන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කවුරු දැම්මත් මේක එක්සත් ජනතා නිදහස් සන්ධානයට දුන්න ජනවරමක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාවේ අවධානය යොමු කරනවා. ඇත්ත වශයෙන්ම ගරු සභාපතිතුමනි, ගම්වල කරන්න අත්‍යවශ්‍ය කාරණා ගොඩක් තිබෙනවා. පාසල්වල ගුරුවරු නැති ප්‍රශ්න. සමහර පාසල් කඩාගෙන වැටෙනවා. ඒවාට ප්‍රතිපාදන දෙන්න ඕනෑ. මම අහන්නේ ඇයි කාපට් කරලා තිබෙන ඒවා කඩලා ආයිත් කාපට් කරන්නේ? මේ අඩි තුනක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය බරපතළ ප්‍රකාශයක් කරන්නේ. ඇමතිතුමාත් ඉන්නවා. මොකද, කාපට් පාරක් කඩලා ආයිත් කාපට් කරනවා නම් එහෙම. ගරු ඇමතිතුමා ඒ ගැන අවධානය යොමු කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කඳවල පල්ලිය ඉස්සරහා කාපට් කරපු එක කඩලා -

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, ඒක කඩලා නොවෙයි. එතැන ඇක්සිඩන්ට් වෙනවා. කන්දක් වාගේ තිබුණේ. තුන් හතර දෙනෙක් මැරුණා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අනේ මේ සීගිරිය වාගේ කන්දක් නොවෙයි එතැන තිබුණේ. පල්ලමක් තිබෙනවා නම් වටේට බොරළු ටිකක් දාන්න ඕනෑ. කාපට් කරපු එක ගලවලා ආයිත් දානවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමිය අවදි කාරක සභාවට යොමු කරවන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ දැන් තිබෙන්නේ UNP ආණ්ඩුවක් කියලා කියන්නේ. එතකොට ඒ දෝෂාරෝපණය එන්නේ අපට. ඒ නිසා මේ ප්‍රතිපාදන යොමු කරන කොට හරියට යොමු කරන්න ඕනෑ. මම ඒ ගැන සභාවේ අවධානයට යොමු කර සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බස්නාහිර පළාතේ පළාත් පාසල්වල ගුරු පුරප්පාඩු සම්බන්ධව පැහැදිලි කිරීමට මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම කනගාටු වෙනවා අද පළාත් සභාව තුළ අධ්‍යාපන ඇමතිවරයා නැති වීම ගැන. මොකද, ඔබතුමාත් කිව්වා වාගේම අද විශේෂයෙන්ම ප්‍රශ්න ගණනාවක් තිබියදීත්, ඒ වාගේම පෞද්ගලික පැහැදිලි කිරීම්වලදීත් අද අධ්‍යාපන අමාත්‍යාංශය ගැන තමයි මන්ත්‍රීවරු ගණනාවක් කථා කළේ. මම මේ කථා කරන්නේ ගරු සභාපතිතුමනි, ගුරු පුරප්පාඩු සම්බන්ධව. මීට ඉහත මේ පළාත් සභාව තුළත්, ගියවර අයවැය තුළදීත් අපි කථා කළා. නමුත් අද වන තුරු මේ ගුරු පුරප්පාඩුවලට විසඳුමක් ලැබිලා නැහැ. පාසල් 1270 ක් තිබෙනවා. ඒ වාගේම ගුරුවරු 36,000 කට ආසන්න සංඛ්‍යාවක් ඉන්නවා. දරුවන් ලක්ෂ හතකට වැඩි සංඛ්‍යාවක් මේ පාසල් තුළ ඉගෙන ගන්නවා. ඒ වාගේම ගුරු පුරප්පාඩු හැටියට පුරප්පාඩු නැතිව මේ වන කොට ගුරු කාඩර් එකේ ඉඳගෙන ගුරු උපදේශකවරු 722 ක් ඉන්නවා. ඒ වාගේම වැඩ බලන විදුහල්පතිවරු 443 ක් ඉන්නවා. ගුරු උපදේශකවරු

සහ විදුහල්පතිවරු ගුරු කාඩර් එකේ 1165 ක් ඉඳගෙන ඉන්නවා. මීට ඉහත අපි මේක පැහැදිලි කරලා කිව්වා. එහෙම නම් ගුරු උපදේශක හැටියට ඉන්න අය සේවය ස්ථාපිත කරලා, මධ්‍යම ආණ්ඩුවත් එක්ක කථා කරලා ඒ සේවය අයින් කරලා අපට ගුරු කාඩර් එකට බඳවා ගන්න අවස්ථාවක් ලබා දෙන්නය කියලා. නමුත් අද වන තුරු ඒක ඉෂ්ට වෙලා නැහැ. වැඩ බලන විදුහල්පතිවරු ඉන්නවා. මේ වන කොට විදුහල්පති විභාගය තියලා, ඒ වාගේම සම්මුඛ පරීක්ෂණ පවත්වලා තව නොබෝ දිනකින් විදුහල්පතිවරු හැටියට පත් කරනවාය කියලා ඒ අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා.

නමුත් ගුරු උපදේශක ප්‍රශ්නය මම හිතන්නේ ගිය සභාවේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාත්, යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාත් කථා කළා. ඒ කථා කරපු අවස්ථාවේදීත් අපි දැක්කා, ගුරු උපදේශකවරු ගිය නොවැම්බර් මාසයේ සිට මේ දක්වාම වෘත්තීය සමිති ක්‍රියාමාර්ග අරගෙන ස්ට්‍රයික් එකක ඉන්නේ. මේ වන තුරු වැඩ කරන්නේ නැහැ. නමුත් ගුරු කාඩර් එකේ ඉඳගෙන පඩි ගනිමින්, ඒ ගුරු උපදේශකවරු 722 ම වැඩ නොකර ඉන්නවා. පාසල් අධීක්ෂණයට යන්නේ නැහැ. ඒ වාගේම විෂය මට්ටමින් ගිහිල්ලා පාසල්වල උගන්වන්නේ නැහැ. ඒ කිසි දෙයකට සහභාගී වෙන්නේ නැහැ. හැබැයි, විභාග පරීක්ෂණවලට යනවා. ඒ වාගේම ප්‍රශ්න පත්‍ර බැලීමට යනවා. ඒ දෙකටම යනවා. නමුත් පැහැදිලිව අධ්‍යාපන අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේදී අපි කිව්වා, ගුරු උපදේශකවරුන් ගුරුවරුන් හැටියට පාසල්වලින් පඩි අරගෙන ගුරු උපදේශක තනතුරේ ඉන්නවා නම්, ගුරු උපදේශක තනතුරේ වගකීම සහ තමුන්ගේ රාජකාරී ඉෂ්ට කරන්න ඕනෑ. ඒක ඉෂ්ට වෙන්නේත් නැහැ. එතකොට පන්තියට ගුරුවරයාත් නැහැ. එක පැත්තකින් සේවය ස්ථාපිත කරලා මේ ගුරු උපදේශකවරු පත් කරලා ඉවර කරන්න ඕනෑ. එහෙම නැත්නම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් මේ අයව ගුරු කාඩර් එකෙන් ඉවත් කරලා ගුරුවරු බඳවා ගන්න අවස්ථාව ලබා දෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේ අය ස්ට්‍රයික් නොකර තමුන්ගේ රාජකාරියේ වැඩ කරන්නේ නැත්නම් පාසලට ගිහිල්ලා දරුවන්ට උගන්වන්න ඕනෑ. අද මේ දෙකම වෙන්නේ නැහැ. පාසලේ දරුවන්ට උගන්වන්න ගුරුවරයාත් නැහැ.

හැබැයි, ගුරු උපදේශක තනතුරේ අවශ්‍ය රාජකාරිය කෙරෙන්නෙත් නැහැ. දැන් ඒකට තීන්දුවක් අරගෙන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ වැඩ නොකරන අයට වහාම ක්‍රියාත්මක වන පරිදි පළාත් අධ්‍යක්ෂතුමා ලිපියක් ඇරියා, කලාප මට්ටමට ගිහිල්ලා ගුරුවරු හැටියට උගන්වන්නය කියලා. මේ වන කොට නැවත ආණ්ඩුකාරතුමා හරහා ලිපියක් එවලා තිබෙනවා. ඒක තාවකාලිකව නවත්වලා, සාකච්ඡාවක් පවත්වන තෙක් ඒ අයට උපදේශක තනතුරේ ඉන්න දෙන්නය කියලා. අපි ආණ්ඩුකාරතුමාට කියනවා, අමාත්‍යවරයා, අමාත්‍යාංශයේ ලේකම්වරයා, පළාත් සභාවේ ඉන්න අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ගෙනැල්ලා සාකච්ඡා කරලා මේ තීන්දුව ගත්තේ මාස පහක් වැඩ නොකර පඩි ගන්න නිසයි. මෙය ගුරු උපදේශකවරුන්ගේ සේවය ස්ථාපිත කරනවාට විරුද්ධව නොවෙයි. ඒ අයගේ රාජකාරී ඉෂ්ට නොකරන නිසයි මේ තීන්දුව ගත්තේ.

ඒ නිසා අද ගරු සභාපතිතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමාට පැහැදිලිව කියන්න ඕනෑ. ගුරු උපදේශක සහ විදුහල්පතිවරු 1165 යි. 1165 ම පුරප්පාඩු තියාගෙන අපට බඳවා ගන්න පුළුවන්කමක් නැහැ. විදේශ ගතවීම් තිබෙනවා මාස තුනට වැඩි 112 යි. දින තුනට වැඩි මාස තුනට අඩු 1162 යි. විදේශ ගතවීම් තිබෙනවා, 1274 ක්. ඒ වාගේම අධ්‍යයන නිවාඩු තිබෙනවා. සතියකට ගත් අය 610 යි. අධ්‍යයන නිවාඩු විශ්ව විද්‍යාලට ගත් අය 49 යි. අවුරුදු 1 ට අඩු 216 යි. අවුරුදු 2 ට අඩු 71 යි. ගුරු විද්‍යාල පුහුණුවලට ගිය. අවුරුදු 3 ට වැඩිය ගිය අය 74 යි. එතැන ඉන්නවා 1020 ක්. ඒ වාගේම වෘත්තිය සමිතිවලට 15 ක් නිදහස් වෙලා ඉන්නවා. අධ්‍යාපන සේවා පරිපාලන කාර්යාලයට 22 ක් අනුයුක්ත වෙලා තිබෙනවා. හමුදා සක්‍රියවලට අනුයුක්ත වෙලා ඉන්නවා 12 ක්. ඔක්කොම 49 ක් ඉන්නවා. 3508 ක් ඉන්නවා. මේ 3508 ට අමතරව මේ බස්නාහිර පළාතේ ජනවාරි මාසය වන කොට ප්‍රසූත නිවාඩු ගිය ගුරු සංඛ්‍යාව 848 යි. ගරු සභාපතිතුමනි, මේ වන කොට 4356 ක් පාසල්වල නැහැ. එතකොට ඉන්න 36,000 න් - කලාප 11 යි තිබෙන්නේ. එක කලාපයක දළ වශයෙන් ගත්තත් තුන්දහස් දෙසිය ගණනයි එක කලාපයකට ඉන්නේ. එක කලාපයකටත් වැඩි ප්‍රමාණයක් ගුරුවරු නැහැ, අද උගන්වන්න. මේක පැහැදිලිව අධ්‍යාපන ඇමතිතුමාට අපි දැන් වාර ගණනාවක් කිව්වා. මීට ඉහත හිටපු අධ්‍යාපන ඇමතිතුමා, ගරු ප්‍රධාන ඇමතිතුමා. මේ ගුරුවරුන් බඳවා ගැනීමේදී මාස හයකට ඉදිරියට විශ්‍රාම යන ගුරුවරුන්ගේ නාම ලේඛනයක් අරගෙන ඒ ලේඛනයට, විභාගය තියපු ගුරු උපාධිධාරීන්, විෂයයන්

[ ගරු මෙරිල් පෙරේරා ]

අනුව තෝරා ගෙන ඒ අයට පාසල්වල ස්වේච්ඡාවෙන් උගන්වන්න අවස්ථාව ලබා දුන්නා. ඒකෙන් අපට ගුරු පුරප්පාඩු හිඟය පෙනුනේ නැහැ. ඒ වාගේම මාස තුනෙන් තුනට, මාසයෙන් මාසයට, මාස දෙකෙන් දෙකට ගුරුවරු බඳවා ගත්තා. අද මේ වන කොට මාස හයකට ආසන්න වෙනවා. එක ගුරුවරයෙක් බඳවා ගෙන නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පළාත් සභාව වෙනස් වුණේ නැහැ නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ පළාත් සභාව තමයි තිබෙන්නේ. අපි අහන්නේ, මේ ක්‍රමවේදයට මීට ඉහත අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරුවරු බඳවා ගත්තා නම් මාසයකට වරක්, මාස දෙකකට වරක්, මාස තුනකට වරක් විශ්‍රාම යන අය වෙනුවට බඳවා ගත්තා. ස්වේච්ඡාවෙන් බඳවා ගෙන, ස්වේච්ඡාවෙන් වැඩ කරන අයට, විශ්‍රාම ගියාට පස්සේ ඒ පාසලේ පුරප්පාඩුවලට පත්වීම් ලබා දුන්නා. ඒ ක්‍රමවේදය මේ මාස හය තුළම ක්‍රියාත්මක කළේ නැහැ. අමාත්‍යතුමා මේකේ වගකීම භාර ගන්න ඕනෑ. ඒ වාගේම අමාත්‍යාංශ ලේකම්තුමා, ඒ වාගේම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සහ සහකාර ලේකම්වරු මීට ඉහත ක්‍රියාත්මක කරපු ක්‍රමවේදය ක්‍රියාත්මක කළා නම්, මේ පුරප්පාඩු සංඛ්‍යාව මෙහෙම වෙන්නේ නැහැ. අද පාසලට ගියාම අපි දන්නවා. එක පාසලක පළමුවැනි පන්තියට උගන්වන ගුරුවරයා නැහැ. දැන් මාස ගණනාවක්, දෙවැනි පන්තියට උගන්වන ගුරුවරයෙක් නැහැ. මම උදේ කථා කරන කොට ගාමිණී තිලකසිරි අමාත්‍යතුමා, ඒ වාගේම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා. අද ඒක සමහර කලාපවලින් ගිහිල්ලා. ගුරුවරු අඩු වුණාම පන්ති එකතු කරලා. අපි නම් අපේ ප්‍රදේශයේ පන්තියේ 40 සීමාවට වැඩි නම්, එක ළමයෙක් හරි වැඩි නම් අපි එකතු කරන්න දෙන්නේ නැහැ. නමුත් සමහර කලාපවලින් පාසල්වලට ගිහිල්ලා පන්ති තුනට 120 ක් ඉන්නවා නම්, ඒ වාගේම ඒ පන්ති තුනට එක ගුරුවරයෙක් නැත්නම්, ගුරුවරු දෙන්නෙක් නම් ඉන්නේ, 120 බෙදලා, පන්ති දෙක කරලා. මේක උත්තරයක් නොවෙයි. පන්ති ගණනාවක් මෙහෙම ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම අද අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා මෙතැන පෙනී සිටින නිසා ඉල්ලීමක් කරනවා මේ ප්‍රශ්නය විසඳන්න. නැත්නම් මේක දවසින් දවස වැඩි වෙලා ගිහිල්ලා ගණනාවක් වන කොට 4356 ට විසඳුමක් ලබා දුන්නේ නැත්නම් ඉදිරියේදී ප්‍රතිඵල සංවර්ධනය වෙන්නෙත් නැහැ. පාසල් කඩා වැටෙනවාය කියලා මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණය ඇත්ත. මම පෞද්ගලිකව දන්නවා. ඒක බරපතළ ප්‍රශ්නයක් අපේ පළාත් සභාවට. අද අධ්‍යාපන ඇමතිතුමා සභා ගර්භයේ නැහැ. ගම්පහත් අපට ඔය ප්‍රශ්නය තිබෙනවා. මම හිතන්නේ, ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා, ඔබතුමා මේ කාරණය ගැන අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න. මම හිතන්නේ විජේතුංග මහත්තයාත් සභාවේ ඉන්නවා. ඔබතුමාත් කරුණාකරලා මේ කාරණය ගැන අවධානය යොමු කරන්න.

මීළඟට කැලණි ගඟේ ජලය දූෂණය වීම කාරණාව පිළිබඳව සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. දැන් පෙරෙයිදා කඩුවෙල නගර මධ්‍යයේ යනවා පෙළපාලියක්. ගරු සභාපතිතුමනි, පෙළපාලිය මොකක්ද කියලා මම ගිහිල්ලා සොයා බැලුවාම ජාත්‍යන්තර ජල දිනයට සමගාමීව පෙළපාලියක් යනවා. ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන් සහ නිලධාරිනියන් කඩුවෙල නගරයේ ඉඳලා අඹතලේ දක්වා පෙළපාලියක් යනවා. ඔවුන්ගේ ඉල්ලීම වුණේ කැලණි ගඟේ ජලය දූෂණය වෙලා. දූෂණය කිරීමෙන් වළක්වන්නය කියලා. එතකොට මේ සම්බන්ධයෙන් මම 2008 සිට - 2012 ඒ හැන්සාඩ් වාර්තා තිබෙනවා. 2012 දී මම පවිත්‍ර ගංගා වැඩ සටහන යටතේ ඒ ඉදිරිපත් කරපු, එක එක ස්ථානයන්ගෙන් ගත් ජල සාම්පල්වල පරීක්ෂණ වාර්තාව සභාගත කළා. එදා හිටියේ, එවකට කෘෂිකර්ම හා පරිසර ඇමතිවරයා වශයෙන් උදය ගම්මන්පිල - අර දේශප්‍රේමීත්වය ගැන, අපේ රට ගැන, මාතෘ භූමිය ගැන කථා කරන ඒ ඇමතිතුමා තමයි

කෘෂිකර්මය සහ පරිසරය භාරව හිටියේ. දැන් එතුමාට කිව්වාම එතුමා කියනවා, කැලණි ගඟ අපට අයිති නැහැයි කියලා. මම කිව්වා, කැලණි ගඟ අයිති නැත්නම් ඔබතුමාට ඇළ මාර්ග ටිකෙන් තමයි විශාල ලෙස කැලණි ගඟ අපවිත්‍ර වෙන්නේ. කර්මාන්ත ශාලාවලින් නිකුත් කරන අපවිත්‍ර ජලය. ඒ වාගේම මළ නාලිකාවලින් ඉවත් කරන ජලය ඇළ මාර්ග හරහා විශාල ප්‍රමාණයක් කැලණි ගඟට එකතු වෙනවා. එතකොට මේ එකතු වන ජලය තමයි අඹතලේ හරහා පොම්ප කරලා අපට දෙන්නේ. පවිත්‍ර කරනවාය කියලා කියනවා. හැබැයි, ඒ පවිත්‍ර කිරීමේ සීමාවන් දැන් ක්ලෝරීන් දාලා පිරිසිඳු කළ හැකි සීමාවන් ඉක්මවලා ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා දැන් වහාම කළ යුතු කාරණය වෙන්නේ කැලණි ගඟට අපද්‍රව්‍ය එකතු වීම නතර කිරීම. මේ නතර කිරීම සම්බන්ධයෙන් අපේ අලුත් ප්‍රධාන ඇමතිතුමා පත් වුණාට පස්සේ, පළමුවැනි උපදේශක කාරක සභාවේ මගේ යෝජනාව හැටියට දැම්මා. එතකොට පසුගිය උපදේශක කාරක සභා රැස්වීමේදී අපේ උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා තමයි ඒකේ සභාපති ධූරය හෙබවූයේ. එතකොට එදා සභාපතිවරයා හැටියට එතුමා තීන්දුවක් දුන්නා, මේ සම්බන්ධයෙන් සොයා බලන්න කමිටුවක් පත් කරන්නය කියලා. එතකොට පසුගිය පළාත් සභාව වෙලාවේ මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඇහුවා, තවම ඒ කමිටුව පත් කළේ නැහැ නේද කියලා. පස්සේ අර කාමරයේ ඉඳගෙන නම් කළා. මම, අශෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා, ජෝර්ජ් පෙරේරා ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සහ තවත් මන්ත්‍රීවරයෙකුගේ නම් සඳහන් කරලා කිව්වා, මෙන්න මේ අය කමිටුවට දා ගන්නය කියලා. නමුත් අද වනකනුත් ඒ කමිටුව කැඳවීමක්වත්, මේ සම්බන්ධයෙන් සොයා බැලීමක්වත් නැහැ.

හැබැයි, මහ ඇමතිතුමා සිරස ගම්මැද්ද වැඩ සටහනට ගිහිල්ලා - සිරස ගම්මැද්ද වැඩ සටහනෙන් මේ කැලණි ගඟේ ජල දූෂණය සම්බන්ධයෙන් විශේෂ වැඩ සටහනක් කළා. මාධ්‍ය නාලිකාවක් හැටියට මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා සිරස එවැනි වැඩ සටහන් කිරීම සම්බන්ධව. හැබැයි, එතැනදී එතුමා දෙන උත්තර - එතුමා උත්තර දෙනවා මම දන්නවා මේ සියල්ල. කොහොමද මේක වෙන්නේ? මොන මොන කර්මාන්ත ශාලා හරහා ද කැලණි ගඟට මේ අපද්‍රව්‍ය එකතු කරන්නේ කියලා. හැබැයි, එතුමා මම උපදේශක කාරක සභාවේදී ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් තවම මේ වන තෙක් කිසිදු සොයා බැලීමක් කළේ නැහැ. කමිටුවක් පත් කරනවාය කිව්වා. කමිටුව නම් කළා. කමිටුව කැඳවීමක් නැහැ. දවසින් දවස කැලණි ගඟේ ජලය මේ විධියට අපවිත්‍ර වීමෙන් හෙට දවසේ උපදින දරුවන්ට ඇති වන ලෙඩ රෝග සම්බන්ධයෙන් වගකියන්න ඕනෑ මේ ප්‍රධාන අමාත්‍යවරයා සහ අද පළාත් සභාව පාලනය කරන බලධාරීන්. ඒ වාගේම රජයේ බලධාරීන්. ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව අවධානය යොමු නොකර - අද දවස අපි කැලණි ගඟේ වතුර ටික බොන්නේ පවිත්‍ර කරලා. එදා අතීතයේ, ඒ අතීත මිනිස්සු මේක ආරක්ෂා කරලා දීපු නිසා. ඒ නිසා අද දවසේ අපේ වගකීම තමයි හෙට පරම්පරාවට මේක ආරක්ෂා කරලා දීම. නමුත් මේ වන තෙක් මේ බලධාරීන්ගේ අවධානය යොමු නොවීම සම්බන්ධයෙන් කනගාටු වෙනවා. මම නැවතත් ගරු සභාපතිතුමා හරහා මතක් කරනවා. මේ සම්බන්ධයෙන් පළාත් සභාව හැටියට ගත හැකි උපරිම ක්‍රියාමාර්ග ගෙන කැලණි ගඟේ ජලය දූෂණය වීම වහාම නතර කරන්න ඉදිරි ක්‍රියාමාර්ග ගන්නය කියලා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රට පුරා සිදු වෙමින් පවතින අපරාධ රැල්ල හා නීතිය විධිමත්ව ක්‍රියාත්මක නොකිරීම කියන කාරණාව පිළිබඳව ජගත් කුමාර මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, වසරකට ආසන්න කාලයකට පෙර සේයා සදෙව්මි දැරියගේ සිද්ධියත් එක්ක රට තුළ විවිධ ප්‍රදේශවල දරුවන්ට සිදු වන අපරාධ, ඒ වාගේම උතුරේ දරුවෙකුට සිදු වූ අපරාධය ආදී වශයෙන් අපරාධ රැල්ලක් ඇති වුණා. ඒ වාගේම ඒ අපරාධ හා සමානවම පසුගිය දිනවලත් එක වාහනයේ පස් දෙනා මරලා, අළු කරලා 89 භීෂණය වාගේ භීෂණයක් පෙන්වන තත්ත්වයට රට තුළ මහා කැලඹීමක් ඇති වුණා. ඒ වාගේම පසුගිය දිනවල එක නිවසේ හතර පස් දෙනා මිය යන, ඝාතනය වන සිදුවීම් මේ රට පුරා සිදුවෙමින් තිබෙනවා. පසුගිය කාලයේ යුද්ධයෙන් විශාල වශයෙන් තරුණ ජීවිත, මිනිස් ජීවිත අහිමි වුණා. එවැනි තත්ත්වයක් තිබුණු රටක්, යුද්ධය අවසන් කරලා, නිදහස් කර ගෙන අපට හොඳ හෙටක් හදා ගන්න අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉඩකඩ විවර කළා. ඉන් පස්සේ අද අපි නැවත ඒ කාලයේ කිව්වේ

[ ගරු ජගත් කුමාර ]

සුදු වැන් සංස්කෘතියක් තිබෙනවා. රටේ වෙනත් බිල්ලෝ ඉන්නවාය කියලා. හැබැයි, අද සුදු වැන් නැති වුණාට, ඩිෆෙන්ඩර් කුමාරිකාවන් ඉඳලා ඒ සමහර අය උස්සලා නීතිය අමුතු විධියට ක්‍රියාත්මක කළා. ඒ වාගේම සමහර ඇමතිවරු තමන්ගේ වාහනවලට තරුණයෝ හප්පලා, අද ඒ තරුණයන්ට කිසිදු වගවිභාගයක් නැතිව අසරණ වන තැනට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම පසුගිය කාලයේ කිව්වා, අපරාධ තිබෙනවා. මේ අපරාධවලට පවතින රජය වගකිව යුතුයි කියලා. ඒ න්‍යායෙන් බැලුවොත් අද මේ සිදු වන සියලු දේට පවතින රජය වගකියන්න ඕනෑ. නමුත් අපි එහෙම වගකීමක් දාන්නේ නැහැ. සමහර අපරාධවලට විවිධ පාර්ශව මර්දනය කළ යුතුයි. පාතාලය අවදි වෙලා, පාතාලයට නිදහස ලැබිලා, පාතාලය අද මුළු රටම කළඹවමින් තිබෙනවා. මේක මර්දනය කරන්න කවුරුවත් නැහැ. ඒ වාගේම පොලීසිය එක පැත්තකින් ඇමතිවරු සම්බන්ධව චෝදනාවක් එල්ල කළාම සාක්ෂි නැහැයි කියනවා. අර ඇඹිලිපිටිය ප්‍රදේශයේ තරුණයාගේ ඇති වුණු සිද්ධියට පොලීසිය තවමත් සමහර අය අත්අඩංගුවට අරගෙන නැහැ. ඒ වාගේම කොළඹදී ඇති වුණු අපේ සමහර ඇමතිවරු සම්බන්ධ වෙලා කරන අපරාධ සම්බන්ධ දේවල්වලදී පොලීසිය කියනවා, සාක්ෂි නැහැයි කියලා. හැබැයි, ඔහුගේ මිත්‍රයෝ කියනවා මෙන්න මේ ඇමතිවරයා, මේ පුද්ගලයා හිටියා ය කියලා. මේ වාගේ රට තුළ ඇති වන යම් යම් දේවල්වලට රජයේ පාර්ශවයේ වගකීමක් ඇති වන තත්ත්වයන්වලදීත් පොලීසිය ඉතාම පහත් විධියට නීතිය මගහරිමින් කටයුතු කරන්න උත්සාහ කරනවා.

ඒ වාගේම තමයි දැන් මගේ නිවසට පැනලා, මගේ වාහනවලට පහර දීලා, මගේ දේපළ හානි කරලා අදට මාසයකුත් දවස් පහකට ආසන්න කාලයක් වෙනවා. මේ කාල පරිච්ඡේදය තුළ පොලීසිය කරපු එකම දේ තමයි සිද්ධිය වුණු වෙලාවේ අපේ නිවසට ඇවිල්ලා ගිය එක ඇර, අපේ නිවසට පහර දුන් අය සම්බන්ධව - මම එදා කථා කරන කොට අපේ නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා එහෙම කිව්වා, මේකට කඩුවෙල බුද්ධදාසලයි සම්බන්ධ. ආණ්ඩුවට නොවෙයි වගකීම කියලා. මම ඊට පස්සේ පොලිස්පතිතුමාට ලිව්වා. මට තර්ජන තිබෙන පාර්ශව කිහිපයක් තිබෙනවා. ඒ අතර මම ප්‍රශ්නය මතු කළා නගර සභාවේ සේවකයෝ තමන්ගේ බිරිඳට, බුද්ධදාසගේ නෝනාට, ඒ වාගේම පුතා මංජුල බුද්ධදාසට, තවත් අයට යොදා ගෙන තිබෙනවා. මේක වැරදියි. තුන් දෙනෙක් සේවකයෝ යොදා ගත් එක වැරදියි. ඒ නිසා ඒ පැත්තෙනුත් තර්ජනයක් එන්න පුළුවන් කියලා. හැබැයි, ඒ එක්කම මම කිව්වා, මේ සභාවේදීත් මන්ත්‍රීවරයෙක් කියලා තිබෙනවා. මේක එතුමා මොනවා හරි දන්නවා ඇති. ඒ නිසා මම ලිඛිතවම දුන්නා පොලිස්පතිතුමාට. මේක සොයලා බලන්න. ඒ විතරක් නොවෙයි. මම කිව්වා, ඒ ප්‍රදේශයේ CCTV පද්ධතිය බලන්න. ඒ වාගේම ඒ නිශ්චිත කාල සීමාවක් ඇතුළේ දුරකථනවලට සවන් දුන්නා නම් ඒ දුරකථන පණිවුඩවලින් සොයා ගන්න පුළුවන් අපරාධකරුවන්ව. දැන් එහෙම සොයන ක්‍රමවේද තිබෙනවා. හැබැයි, පොලීසිය නිශ්ශබ්දයි. ඒ නිසා නඩුත් හාමුදුරුවන්ගේ බඩුත් හාමුදුරුවන්ගේ කියන කාරණාව පැහැදිලි වෙමින් තිබෙන්නේ.

ඒ නිසා විශේෂයෙන්ම රට තුළ මේ ඇති වන අපරාධ රැල්ලත්, අපට සිදු වුණු ඒ අපරාධය නීතියට හසු නොවීම තුළ පවතින රජයට වගකීමෙන් මිදෙන්න බැහැ. වර්තමාන ජනාධිපතිතුමා විටෙක ප්‍රමාද වෙලා මට කථා කළා. ගොඩක් ප්‍රමාද වෙලා. දන්නේ නැහැ. පත්තරවලින් දැක්කේ කිව්වා. කථා කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. ඒ වෙලාවේ කිව්වා, ඇයි ආණ්ඩුවට දොස් කියන්නේ කියලා. මම කිව්වා, ආණ්ඩුවට වගකීමක් තිබෙනවා. ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා මේක සොයලා බලන්න. ඒ නිසා සොයලා බලන්න. එතුමා කිව්වා පොලිස්පතිතුමාට කියන්නම් කියලා. මම දන්නේ නැහැ ජනාධිපතිතුමා කිව්වාමත් පොලීසිය සොයන්නේ නැද්ද කියලා. තවම අබමල් රේණුවකවත් නීතිය ක්‍රියාත්මක වීමක් සිද්ධ වෙන්නේ නැහැ මගේ නිවසට - අනික් ඒවා ගැන කථා කරලා වැඩක් නැහැ. මගේ නිවසට ඇතුළු වෙලා පහර දුන්න එක. ඒ අලාභ කරපු එක. තර්ජනය කරපු එක. අවසානයේ අපි මේක පොලීසිය, රටේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැති නිසා පාර්ලිමේන්තු වට රවුමේ මම විශාල උද්ඝෝෂණයක් කළා. හැබැයි, එදාම ගෙනාවා අධිකරණ තීන්දුවක් උද්ඝෝෂණ කරන්න බැහැයි කියලා. මේ සාමකාමී උද්ඝෝෂණ. හැබැයි, එක්සත් ජාතික පක්ෂයේ කට්ටිය උද්ඝෝෂණය කරනවා මහා දවල් පාරවල් වහලා. අපට අධිකරණ තීන්දු එනවා. හැබැයි, අපි අපේ කාර්යභාරය කළා. ඉන් පස්සෙත් බැරිම තැන මම මෝදර කෝවිල් ගිහිල්ලා පොල් ගැහුවා. මට හිතෙන්නේ පොල් නම් හොඳට වැඩ කරනවා. මේ ස්වභාව ධර්මය වැඩ කරනවා. දෙවියෝ ඉන්නවා. ඒ යම් පාර්ශවලට අද හානි වෙලා තිබෙනවා. හැබැයි, පොඩි පොඩි එවුන්ගේ පිටින්

මේවා යන එක වැරදියි. මේක යන්න ඕනෑ මේවාට අණ දුන්න, මේවාට බලකරපු අය මතින්. තවම පොල් ගහලා ඉවර නැහැයි කියලත් මම මේ වෙලාවේ ඒ අයට දැන ගන්න කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, පොල් ගහන එක වෙනම මගේ ආධ්‍යාත්මික කාරණාවක්. හැබැයි, රටේ නීතිය ක්‍රියාත්මක කිරීම ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු වගකිවයුත්තන්ගේ, පොලිස්පතිතුමාගේ තීරණයක්. ඒ නිසා ගරු ඔබතුමාගේ මාර්ගයෙන් අපට ඇති වෙලා තිබෙන තර්ජන, නැවතත් නිවස ඉදිරිපිටට බයිසිකල් එනවා. යම් යම් දේවල් වෙනවා. මේ සම්බන්ධව පරීක්ෂණයක් සිද්ධ කරලා, මට විතරක් නොවෙයි අනික් මන්ත්‍රීවරුන්ගේත් ජීවිත පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සම්බන්ධවත් - පාර්ලිමේන්තුවට ගියාම විතරක් අමුතු ආරක්ෂාවක් දෙන එක නොවෙයි නේ? අපිත් දිස්ත්‍රික්කයක මන්ත්‍රීවරු. දිස්ත්‍රික්කයක වැඩ කරනවා. ඒ නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරන්නය කියලා මම මේ වෙලාවේ ඉල්ලා සිටිනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපේ ගෙවල් පිච්චුවා. සිරස පිච්චුවා. ඒවා සොයලත් නැහැ තවම.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

සොයන්න කෝ. ඕගොල්ලන්ගේ ආණ්ඩුව නේ? දැන් කුණුගොඩවල් සොයන්නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දැන් සොයනවා. ගෙවල් පිටින් පිච්චුවා. ඔහොම නොවෙයි. අපි සොයනවා දැන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, මතුගම කන්නන්ගර ජාතික පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය අද පැවැත්වෙනවා. මේ වන කොට මුළු රටේම ක්‍රීඩා උත්සව පවත්වලා ඉවරයි. පෙබරවාරි මාසයේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අධ්‍යාපන ඇමතිතුමා නැහැ.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

අධ්‍යාපන ඇමතිතුමා නැති වුණත් කියන්න ඕනෑ. විදුහල්පතිතුමිය අත්තනෝමතිකව තීන්දු කළා ක්‍රීඩා උත්සවය තියන්නේ නැහැයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට ඔබතුමාට කාලය දෙන්න අමාරුයි. මොකද හේතුව, වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

නැහැ. අපි සියලු දෙනාගේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඉස්කෝල ප්‍රශ්නයක්.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

මම දැක්කා ඔබතුමා කියනවා, ඔබතුමාට ආරාධනා කළේ නැහැයි කියලා ඔබතුමාගේ නිවසට ආසන්න විද්‍යාලයෙන්. දැන් මේ මගේ නිවසට ආසන්නම විද්‍යාලය. අවුරුදු 25 ක් තිස්සේ මම ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති. අද අපට කිසිම ආරාධනයක් නැහැ. කිසිම දේශපාලඥයෙකුට. සෙනල් වෙල්ගම ගරු මන්ත්‍රීතුමාට නැහැ. මට නැහැ. අධ්‍යාපන ඇමතිතුමාට නැහැ. අපේ පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට නැහැ. කාටවත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඉතින් ඒ පාසලේ තීන්දුවක්.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ආසන්නම පාසල. මේ බලන්න. මේ ආරාධනා පත්‍රයේ තිබෙන්නේ කලාප අධ්‍යක්ෂ. ලක්ෂ 07 ක් මම වෙන් කරලා දුන්නා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක ජාතික පාසලක් නේද? ජාතික පාසල් සම්බන්ධයෙන් අපට තීන්දු ගන්න බැහැ.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ගරු සභාපතිතුමනි, ජාතික පාසල් හරි මේ ලංකාවේ තිබෙන පාසලක්. ළඟම තිබෙන විද්‍යාලය. මම ඒ විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා තමයි වගකියන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේක වරප්‍රසාද ප්‍රශ්නයක් කියලා ගත්තාට මට අදාළ වෙන්නේ නැහැ ඒක.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

මේක ඔබතුමා අදාළ වෙන්නේ නැහැයි කියලා අපව යටපත් කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට අදාළ වෙන්නේ නැහැ මෙය.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ජාතික පාසල් අපට කිසි කන්ට්‍රෝල් එකක් නැහැ. පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාටත් බලය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මේකට තීන්දුවක් ගන්න බැහැ. ඔබතුමා ඒක අකිල විරාජ් අධ්‍යාපන ඇමතිතුමාට කියන්න. ඉසුරුපායට.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

තමුන්නාන්සේ එහෙම ඇඟ බේරා ගන්න හදන්න එපා. අපේ වරප්‍රසාද කැඩුණාම අපට මෙතැන නොවෙයි නම් කොහේද කියන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අගමැතිතුමාට කියන්න. ආණ්ඩුවේ නායකයාට කියන්න. අපට කියලා වැඩක් නැහැ. පළාත් සභාවට.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

අගමැතිතුමාට අපි කියනවා. නමුත් මෙතැනත් අපි කියනවා. අපේ මේ මන්ත්‍රීවරු ඔක්කෝගේම වරප්‍රසාද කඩ කරලා තිබෙනවා. ඔබතුමා මේ ගැන පොඩ්ඩක් අවධානය යොමු කරන්න. අපට ඇහුම්කන් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඇහුම්කන් දෙනවා. මේ සභාවට අදාළ නැහැ ඒක.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, කමක් නැහැ පව් නේ? එතුමා කියන්න එපැයි. ආණ්ඩුවට කියලා අහන්නේ නැත්නම් එතුමා මෙහේ හරි කියන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් සභා පාසලක් නොවෙයි ඒක.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ඔබතුමා කොහොමත් ඇඟ බේරා ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නොවෙයි. පළාත් සභා පාසලක් නම් අපි කථා කරලා මොකක් හරි තීන්දුවක් ගන්නවා. අපේ ඇමතිතුමාට තීන්දු ගන්න පුළුවන්. නමුත් ජාතික පාසල් ප්‍රශ්නයක් ඔබතුමා කියන්නේ. ඇඟ බේරා ගන්නවා නොවෙයි. අපි අවශ්‍ය දේවල් ක්‍රියාත්මක කරනවා. ඔබතුමා මේ රටේ තිබෙන ප්‍රශ්න මෙතැනට ගෙනාවාට වැඩක් නැහැ. රටේම තිබෙන ප්‍රශ්න ගැන කථා කරන්න බැහැ මෙතැන වරප්‍රසාද ප්‍රශ්න කියලා.

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : I
PRIVATE MEMBERS MOTION: I

## දූෂ්කර පාසල්වල විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට යතුරු පැදියක් ලබා දීම
PROVIDING A MOTORCYCLE FOR PRINCIPALS AND TEACHERS OF SCHOOL IN REMOTE AREAS

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

*"බස්නාහිර පළාත තුළ වතු ආශ්‍රිතව විශාල ජනතාවක් ජීවත් වන අතර, ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය යහපත් කිරීමේ සහ ඔවුන් මෙරට ආර්ථිකයේ ශක්තිමත් කොටස්කරුවන් බවට පත් කිරීමේ අරමුණෙන් වතු පාසල් විශාල සංඛ්‍යාවක් පිහිටුවා ඇත. මෙම වතු පාසල්වල දරුවන් හට අධ්‍යාපනය නිසි පරිදි ලබා දීමට පහසුකම් රැසක් ස්ථාපිත කර ඇතත්, ඔවුන්ට අධ්‍යාපනය ලබා දෙන ගුරුවරුන්ට දූෂ්කරතා රැසකට මුහුණදීමට සිදුව ඇත.*

*එම ගුරුවරුන් පත් වන දූෂ්කරතාවයන් අතර පාසලට ළඟා වීමට ඇති ප්‍රවාහන අපහසුතාවය ප්‍රධානතම කරුණක් වන අතර, එයට විසඳුමක් ලෙස බස්නාහිර පළාතේ සේවය කරනු ලබන සියලු වතු පාසල්වල විදුහල්පතිවරුන් සහ ගුරුවරුන්ට ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම සඳහා බස්නාහිර පළාත් සභාවේ මැදිහත්වීමෙන් යතුරු පැදියක් ලබා දීමට කටයුතු කිරීම සුදුසු යැයි මෙම පළාත් සභාව අදහස් කරයි."*

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[ පූ.භා. 10.25 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා අද දවසේ මේ යෝජනාව සභාව තුළ සාකච්ඡා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව. ගරු සභාපතිතුමනි, දැන් මේ යෝජනාව ඉදිරිපත් කරලා දැනට මාස අටකටත් වැඩි කාලයක් ගෙවිලා තිබෙනවා. මාස අටක් විතර මේක න්‍යාය පත්‍රයේ තිබුණා. සාකච්ඡාවට ගන්න බැරි වුණා. අද ලංකාවේ දේශපාලඥයෝ විතරක් නොවෙයි, ලංකාවේ බොහෝ දෙමව්පියෝ වැඩියෙන්ම අවධානය යොමු කරන්නේ, අධ්‍යාපනය කියන කාරණයට කියන එක ඉතාම පැහැදිලි වුණා. අද දවසේ මේ සභාව පටන් ගත්තාට පස්සේ, සභාවේ තිබුණු ප්‍රශ්නවලින් ප්‍රශ්න හතක්ම තිබුණේ අධ්‍යාපනයට අදාළව. සභාවේ තිබුණු පෞද්ගලික පැහැදිලි කිරීම්වලින් තුනක්ම තිබුණේ අධ්‍යාපනයට අදාළව. ඒ වාගේම මේ යෝජනාවත්, න්‍යාය පත්‍රයේ තිබෙන යෝජනා දෙකෙන් පළමුවන යෝජනාවත් අධ්‍යාපනයට අදාළව තමයි තිබෙන්නේ. ඒ නිසා ඉතාම පැහැදිලියි, අධ්‍යාපනයට තිබෙන උනන්දුව මේ රටේ කොයි තරම් ප්‍රමාණයක්ද කියලා. නමුත් අවාසනාවට අධ්‍යාපනය සිද්ධ කරන බලධාරීන් මේ උනන්දුව ගැන අවධානය තිබෙනවාද කියන කාරණය මේ යෝජනාව ඉදිරිපත් කරන මේ මොහොතේදීත් අපට මතු වෙමින් තිබෙනවා. ඒකට ප්‍රධානම කාරණය තමයි අධ්‍යාපන ඇමතිතුමා මේ සභාවේ නැහැ. එතුමා අසනීපයෙන් කියලා කිව්වා. එතුමා වෙනුවෙන් වැඩ බලන්න ගරු කෘෂිකර්ම ඇමතිතුමාව පත් කරලා තිබෙනවාය කියලා කිව්වා. නමුත් අපි විශ්වාස කරනවා අධ්‍යාපන ඇමතිතුමා සභාවේ නැත්නම් අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්න මේ තරම් ප්‍රමාණයක් සභාව තුළ සාකච්ඡා කරනවා නම්, බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන ඇමතිතුමා ඇරුණාම ඊළඟට ඉන්න ලොකුම බලධාරියා, අඩුම තරමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා මේ සභාවේ ගෙනැල්ලා වාඩි කරවන්න අධ්‍යාපන ඇමතිතුමාට වගකීමක් තිබෙනවා. නමුත් ඒ වගකීමවත් ඉෂ්ට වෙලා නැහැ. මේ නිලධාරීන් ඉන්න කාමරයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේ විජේතුංග මහතා ඉන්නවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හැබැයි, අතිරේක ලේකම්වරයා ඉන්නවා. අපි සතුටු වෙනවා. නමුත් ලේකම්වරයා හිටියා නම් ඊට වඩා තීන්දු ගන්න පුළුවන්කම තිබෙනවා. නමුත් ලේකම්වරයා සහභාගී වෙලා නැහැ. ඒ ගැන අපි කනගාටු වෙනවා.

ගරු සභාපතිතුමනි, මම මේකේදී කියන්න ඕනෑ මේ යෝජනාව දාද්දීම මම යෝජනාව ලිව්වෙත් වතු පාසල් කියලා. හැබැයි, වතු පාසල් කියන එක මේ රටේ අධ්‍යාපනය ගැන සාකච්ඡා කරන හැම සාකච්ඡාවේදීම වතු පාසල් කියන නම ඉස්සෙල්ලාම අයින් කරලා දාන්න ඕනෑ. මේවා පාසල් බවට පත් කරන්න ඕනෑ. වතු පාසල් කියලා කිව්වාම වෙනම අනන්‍යතාවයක් මතු වෙන්නේ. එහෙම අනන්‍යතාවයක් අධ්‍යාපනයේ මතු වෙන්න විධියක් නැහැ. අධ්‍යාපනයේ අයිතිවාසිකම් මේ රටේ දරුවන් සියලු දෙනාට එක සමානව බෙදනවා නම් මේ රටේ පාසලුත් එක සමානව තිබෙන්න ඕනෑ. ජාතික පාසල්, වෙනත් පාසල්, වතු පාසල් කියලා පාසල් වර්ගීකරණය සිද්ධ කිරීම හොඳ නැහැ. ඒ නිසා වතු පාසල් කියන නම පාසල් ශබ්ද කෝෂයෙන්, අධ්‍යාපන ශබ්ද කෝෂයෙන් අයින් කරන්නය කියන යෝජනාව මුලින්ම මම කරනවා.

ගරු සභාපතිතුමනි, මේ වතු ආශ්‍රිතව පාසල් ගණනාවක් බස්නාහිර පළාතේ පිහිටුවලා තිබෙනවා. අවිස්සාවේල්ල ආසනයේ එවැනි පාසල් හයක් තිබෙනවා. මම දන්නවා. මතුගම සහ අගලවත්ත කියන ප්‍රදේශවලත් මෙවැනි පාසල් රාශියක් තිබෙනවා. මේ පාසල්වල ඉගෙන ගන්න දරුවෝත් රටේ සාමාන්‍ය පුරවැසියන්ගේ දරුවෝ සහ සාමාන්‍ය දරුවෝ. රටේ සාමාන්‍ය පාසල්වල තිබෙන අයිතිවාසිකම් සියල්ල මේ පාසල්වල දරුවන්ටත් තිබෙන්න ඕනෑය කියන විශ්වාසය තමයි අපට තිබෙන්නේ. අපේ පාසල් හයේ, අවිස්සාවේල්ල ආසනයේ තිබෙන පාසල් හයේ ගුරුවරු 78 ක් සේවය කරනවා. වතු පාසල් 06 ක් තිබෙනවා. වගවත්ත පාසල, පාදුක්ක වත්ත පාසල, සාලාව වත්ත පාසල, සිරිනිවාස වත්තේ තිබෙන පාසල, පුවක්පිටිය දෙමළ සීසී කනිෂ්ට විද්‍යාලය සහ පුවක්පිටිය දෙමළ සීසී මහා විද්‍යාලය. පාසල් 06 ක්. දරුවෝ 1530 ක් මේ පාසල් හයේ ඉගෙන ගන්නවා. දරුවෝ 1530 ක්. මේ පාසල් හැම එකකටම ප්‍රවාහන පහසුකම ඉතාම දුෂ්කරයි. ප්‍රවාහන පහසුකම ඉතාම දුෂ්කර තත්ත්වයක තිබෙන්නේ. ප්‍රවාහන පහසුකම් තිබෙන පාරෙත් ප්‍රවාහන පහසුකම තිබෙන්නේ පැය තුනකට, හතරකට වරක්. එහෙම තමයි බස් රථ ක්‍රියාත්මක වෙන්නේ. ඒ බස් රථයේ ඇවිල්ලත් පාසලට ළඟා වෙන්න හැම පාසලටම කිලෝ මීටර් තුනක් විතර ගුරුවරු යන්න තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා, ඉතාම මානසික සතුටකින් ගුරුවරයෙක් පාසලට ආවේ නැත්නම් ඒ ගුරුවරයාගේ සේවාව ඉතාම සුභදායක විධියට දරුවන්ට ගලාගෙන එන්නේ නැහැ. ගුරුවරයා කිලෝ මීටර් තුනක් නම් පයින් එන්නේ. විශේෂයෙන්ම මේ දවස්වල. ඔබතුමා දන්නවා මේ දවස්වල පරිසරයේ තිබෙන තත්ත්වය කොහොමද කියලා. අධික රස්නයක් තිබෙනවා. උදේටත් එකයි. රෑටත් එකයි. හැන්දෑවටත් එකයි. මිනිස්සු ජීවත් වෙන්නේ හරිම අමාරුවෙන්. මේ රස්නේ හින්දා ගුරුවරයෙක් කිලෝ මීටර් තුනක් විතර පයින් ආවොත්, ඒ ගුරුවරයා පාසලට එන්නේ දහඩිය පෙරාගෙන. ගතට දැඩි වෙහෙසක් ඇතිව එන්නේ. ඔහු දාඩිය නිවා ගන්න වෙනම කාලයක් ගත කරනවා. පාසලේ ඊට පස්සේ තිබෙන වෙහෙස නිවා ගන්න වෙනම කාලයක් ගත කරනවා. මේ වෙහෙසත් එක්ක පන්ති කාමරයට යනවා. ඊට පස්සේ පන්ති කාමරයේ මතු වන ප්‍රශ්නවලදී මානසිකව බලපාපු මේ වෙහෙස, පීඩනය, මේ සියල්ල එකතු කර ගෙන තමයි පන්ති කාමරයේ වැඩ කරන්නේ. එතකොට නිවැරදිව දරුවාට තමන්ගේ පාඩම සන්නිවේදනය කරන්න අවශ්‍ය මානසික ශක්තිය ගුරුවරයාට නැහැ. මේක මේ පාසල්වල හැමදාම තිබෙන තත්ත්වයක්. ඒ නිසා මේ පාසල්වල කළමනාකරණ කටයුතු වෙන්නේ නැහැ. විෂය හරියට ඉගැන්වීම සිද්ධ කරන්නේ නැහැ. පාසලේ අවශ්‍ය වෙලාව දක්වා ගුරුවරු වැඩ කරන්නේ නැහැ. ගුරුවරු වැඩ කරන්නේ පැයක් දෙකක් ප්‍රමාද වෙලා. ප්‍රවාහන පහසුකම් නැති නිසා ගුරුවරු වේලාසනින් යන්න උත්සාහ කරනවා. ඒ නිසා මේ සියල්ලම අවසානයේ බලපාන්නේ දරුවන්ට. ඒ නිසා දරුවෝ තමන්ගේ අධ්‍යාපනයේ නිසි ප්‍රයෝජන නෙලා ගන්න අවශ්‍ය පහසුකම ලබා ගන්නේ නැති නිසාම විශාල හානියක් සිද්ධ වෙනවා. ඔබතුමා දන්නවා, අද වන කොට වතු ආශ්‍රිතව තිබෙන තත්ත්වය මොකක්ද කියලා. වතුවල ජීවත් වන ජනතාවගේ ආර්ථික ශක්තිය කඩා වැටිලා තිබෙන්නේ. වතුවල රබර් කැපුවාට පස්සේ ඒ කිරි ටික එදා

වික්ක මිලට, අද විකුණා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා වතු හාම්පුත්තු මේ වතුවල වැඩ කරන සේවකයන්ට සලකන්නේ ඉතාම අසාධාරණ විධියට. ඒ නිසා ඔවුන් ඉන්නේ මානසික පීඩනයකින්. ඒ මානසික පීඩනයත් එක්ක ඒ අය විශ්වාස කරනවා, තමන්ට ගැලවීමක් තිබෙන්නේ තමන්ගේ දරුවාට අධ්‍යාපනයක් දුන්නොත් විතරයි කියලා. ඒ නිසා වතුවල ජීවත් වන දරුවන්ට අධ්‍යාපනය දීම හරහා තමන්ගේ ජීවිතය සුඛිත මුදිත කර ගන්න මේ මිනිස්සු විශාල වෙහෙසක්, මහන්සියක් ගන්නවා. ඒ අයට පහසුකමක් නැහැ, ටියුෂන් පන්තියට ගිහිල්ලා දරුවන්ට උගන්වන්න. එපමණ ආදායමක් නැහැ. ළඟපාත ටියුෂන් පන්තියක් නැහැ. වතුවල ජීවත් වන මිනිසුන්ට එහෙම මානසිකත්වයක් නැහැ. එහෙම නම් ඒ අයගේ දරුවන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය සියලු පහසුකම් ගන්න තිබෙන්නේ පාසල්වල අධ්‍යාපනයෙන් විතරමයි. හැබැයි, පාසලේ අධ්‍යාපන පහසුකම් කඩා වැටිලා නම් මේ අයගේ අධ්‍යාපන පහසුකම නිවැරදිව ලබා ගන්න පුළුවන්කමක් නැහැ. අපි විශ්වාස කරනවා නූතනයේ වතු කම්කරුවාගේ දරුවා වතු කම්කරුවෙකු වෙන්නම අවශ්‍ය නැහැයි කියලා. රබර් කිරි කපන්න නොවෙයි ඒ දරුවෝ ඉන්නේ. ඒ දරුවොත් මේ රටේ ආර්ථික ක්‍රියාවලියේ ශක්තිමත් මිනිස්සු බවට පත් වෙන්න අත්‍යවශ්‍යය වෙලා තිබෙනවා. එහෙම නැති වුණොත් වෙන්නේ නැවත වතු ආශ්‍රිතව කැරළි නිර්මාණය වෙන්න පුළුවන්කමක් තිබෙනවා.

අපි හැමදාම කිව්වා, ලංකාවේ තරුණ කැරළි දෙකම සිද්ධ වුණේ අධ්‍යාපනයට අදාළව. අධ්‍යාපන ක්ෂේත්‍රයේ මතු වුණු අපහසුකම් නිසා තමයි තරුණ කැරළි දෙකම සිද්ධ වුණේ. අධ්‍යාපනය ලබා ගත් අයගේ තිබුණු ඉච්ඡාභංගත්වය තමයි තරුණ කැරළි දෙකටම බලපෑවේ. ඒ නිසා නැවත වතාවක් වතු ආශ්‍රිත දරුවෝ, වතු ආශ්‍රිත මිනිස්සු මේ රටේ අධ්‍යාපනය ලබා ගැනීම සඳහා කැරැල්ලක් ගහන්න කලින් ඒ අයගේ අධ්‍යාපන පහසුකම සාර්ථක කරලා, ඒ අයටත් සාමාන්‍ය දරුවෙකු ගන්න අධ්‍යාපනයේ පහසුකම් සියල්ල භුක්ති විඳීමේ අයිතිවාසිකම සපුරාලන්න වගකීමක් අධ්‍යාපන බලධාරීන්ට තිබෙනවා. ඒ වගකීමේ එක කාරණයක් තමයි ප්‍රවාහන පහසුකම දෙන්නය කියන කාරණය. මේක ඉතා පහසුවෙන් කරන්න පුළුවන්. පසුගිය ආණ්ඩුව තිබුණු කාලයේ මේ රටේ විවිධ වෘත්තිකයන්ට ප්‍රවාහන පහසුකම දෙන්න, මෝටර් සයිකලය දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඇයි බැරි? අවිස්සාවේල්ල ආසනයේ විතරක් ඉන්නේ ගුරුවරු 78 යි. මම හිතන්නේ, බස්නාහිර පළාත සැලකුවාම ගුරුවරු 500 කටත් අඩු සංඛ්‍යාවක් තමයි මෙවැනි පාසල්වල සේවය කරන්නේ. ඒ ගුරුවරුන්ට අධ්‍යාපන අමාත්‍යාංශයට පුළුවන් නම් ප්‍රවාහන පහසුකම ලබා දෙන්න. මෝටර් සයිකලයක් ගෙවීමේ පහසුකමට ලබා දෙන්න. මේක ආණ්ඩුවෙන් දෙන්න කියලා අපි කියන්නේ නැහැ. ඒ මුදල ගුරුවරුන්ගෙන් අය කර ගන්න පුළුවන්. ඒ අය කැමැති වෙයි ඒ මුදල ලබා දෙන්න. එහෙම ගෙවීමේ ක්‍රමයට මෝටර් සයිකලයක් දුන්නොත් ගුරුවරු වෙලාවට පාසලට යයි. ප්‍රබෝධමත් ගුරුවරයෙක් පාසලට යයි. ප්‍රබෝධමත්ව පන්ති කාමරයට යයි. අවසානයේ ඒකේ ප්‍රතිඵලය මේ පාසල්වල අධ්‍යාපනය හදාරන දරුවන්ට ළඟා වෙයි. ඒ දරුවෝ මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන පිරිපුන් දරුවෝ, එහෙම නැත්නම් අධ්‍යාපනයේ දැනුම, ආකල්ප තිබෙන දරුවෝ පුරවැසියෝ බවට පත් වේවි. ඒ නිසා මේ පහසුකම ඉෂ්ට කරන්න - අපි විශ්වාස කරනවා, මේ යෝජනාව හමස් පෙට්ටියට යවන්නේ නැතිව, මේ යෝජනාව අද දවසේ සම්මත වුණාට පස්සේ අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළේ යම් කමිටුවක් නිර්මාණය කරයි කියලා. මේ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් කරන්න. අධ්‍යාපන අමාත්‍යාංශයට මුදල් වෙන් කරන්න පුළුවන්ද? රේඛීය අමාත්‍යාංශයෙන් මුදල් ඉල්ලා ගන්න බැරිද? රටේ භාණ්ඩාගාරයට යෝජනාවක් කරලා ඒ වෙනුවෙන් අමතර මුදලක් ඉල්ලා ගන්න බැරිද? ඒ වෙනුවෙන් මොනවාද අපි කරන්න තිබෙන පහසුකම් සලස්වන්න ඕනෑ තත්ත්වයන් සාකච්ඡා කරන්න කමිටුවක් නිර්මාණය කරලා, ඒ කමිටුව හරහා මේ යෝජනාව යථාර්ථයක් කරන්න කටයුතු කරන්නය කියන ඉල්ලීම තමයි අපි ඔබතුමාට කරන්නේ.

ඒ වාගේම අපි ස්තුතිවන්ත වෙනවා. පසුගිය මාස අටේම ජාතික කාරණා, ජාත්‍යන්තර කාරණා කවදාවත් මේ සභාවට කරන්න බැරි යෝජනා ගණනාවක් සාකච්ඡා කරලා තිබෙනවා. මාස අටකට විතර පස්සේ තමයි සභාවට ක්‍රියාත්මක කරලා, මේ පළාතේ ජීවත් වන මිනිස්සුන්ට සහනයක් ඉෂ්ට කරන්න පුළුවන් යෝජනාවක් ඇවිල්ලා තිබෙන්නේ. මේ යෝජනාව යථාර්ථයක් කරන්න අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කරාවි කියන විශ්වාසය ඇතුව මේ යෝජනාව හරහා පළාතේ ජීවත් වන දරුවන්ට අධ්‍යාපනයේ පහසුකම් කරදරයකින්, හිරිහැරයකින් තොරව ලබා ගන්න පහසුකම් සලස්වන්න මේ යෝජනාව ක්‍රියාත්මක කරවන්න දායකත්වය දෙන්න කියන ඉල්ලීමත් කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ පූ.භා. 10.35 ]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනැල්ලා තිබෙන යෝජනාව වතු පාසල්වලට පමණක් නොවෙයි. බස්නාහිර පළාතේ සියලුම පාසල්වලට මේ වාගේ අවශ්‍යතාවයන් තිබෙනවා කියන එක මුලින්ම ඔබතුමාගේ මාර්ගයෙන් මම මේ සභාවට දැනුම් දෙන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, අධ්‍යාපනය පිළිබඳව නව රජයේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ, ජාතික ආදායමෙන් 6% ක් අධ්‍යාපනයට වෙන් කරලා අධ්‍යාපනයේ තිබෙන ජාතික පාසල් සහ පළාත් පාසල් අතර දැවැන්ත සංවර්ධනයක් ඇති කිරීම තුළින් රටට වැඩදායී පුද්ගලයින් බිහි කිරීම, රටේ සංවර්ධනයට ග්‍රාමීය මට්ටමේ ජනතාවගේ බුද්ධිය වැඩි දියුණු කරවාගෙන ඒ බුද්ධිය උපයෝගී කරගෙන රට සංවර්ධනය කිරීම සඳහා මධ්‍යම ආණ්ඩුව ආර්ථිකය උපයා ගැනීමේ මූලික අරමුණ ඇති කරගෙන දැවැන්ත වැඩ පිළිවෙළක් මේ රටේ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. මහේෂ් අල්මේදා අපේ හිටපු අමාත්‍යතුමා ගෙනාපු යෝජනාව ඉතාමත් වටිනා යෝජනාවක් හැටියට මධ්‍යම රජය තේරුම් අරගෙන පළාත් සභාවලට මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමේදී එක පියවරක් අරගෙන තිබෙනවා. මේ වාගේ දුෂ්කර පාසල්වලට විදුහල්පතිවරුන් සඳහා නිවාස 1000 ක් ඉදි කරලා, විදුහල්පතිවරයා ඒ නිවාසවල නතර කරලා එම විද්‍යාලයේ තිබෙන අවශ්‍යතාවයන් ක්‍රියාත්මක කරන්න.

අනෙක් පැත්තෙන් හොඳම පාසල ළඟම පාසල බවට පත් කිරීම තුළ දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කරලා, පළාත් සභාවල්වලට මේ බලතල ලබා දීලා, පළාත් සභා හරහා මෙය ක්‍රියාත්මක කරවීමේදී මෙම දුෂ්කරතාවයන් මඟ හරින්න වැඩ කටයුතු ක්‍රියාත්මක කරලා තිබෙනවා. අද අපේ පළාත දිහා අරගෙන බැලුවාම වැඩියෙන්ම දුවිඩ ජනතාවගේ වතු පාසල් තිබෙන්නේ කළුතර දිස්ත්‍රික්කයේ. මම හිතන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ මහේෂ් අල්මේදා හිටපු අමාත්‍යතුමාගේ ප්‍රදේශයේ මෙවැනිම දුෂ්කර වතු පාසල් තිබෙනවා කියන එක එතුමාත් සඳහන් කළා. අපි කළුතර දිස්ත්‍රික්කය අරගෙන බැලුවාම අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ ඉතාමත් දුෂ්කර වතු පාසල් රාශියක් පිහිටුවලා තිබෙනවා. ඩෙල්කිත් වතු යාය, ඒ වාගේම ඩාඩ්න් ෆීල්ඩ් වතු යාය, මොහොමදී වතු යාය ඒ වාගේ නොයෙකුත් වතුවල වතු පාසල් පිහිටුවලා තිබෙනවා. එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබියදී පොත් ටික නොමිලේ ලබා දීලා, නිල ඇඳුම් ටික නොමිලේ ලබා දීම දුවිඩ වතු කම්කරුවන්ගේ පාසල්වල ඉගෙන ගන්න දරුවන්ට විශාල ශක්තියක් වෙලා තිබෙනවා. ඔවුන්ට ධනවතුන්ගේ දරුවන් හා එක හා සමානව අධ්‍යයනය කරන්න. වතු කම්කරුවන්ගේ දරුවන් එදා අධ්‍යාපන අමාත්‍යාංශය ගත්තු තීරණය අනුව අද ඒ වතු කම්කරුවන්ගේ දරුවන් හැලෙන්නේ නැතුව එක හා සමානවම එක තැනකට යොමු කරවීමේ ව්‍යාපෘතියක් හැටියට, ඒ දැවැන්ත ව්‍යාපෘතියක් ලෙස අදත් ක්‍රියාත්මක කරනවා.

අනෙක් පැත්තෙන් අපි අරගෙන බැලුවාම අපි දැක්කා මධ්‍යම රජයේ පාසල්වලට, ජාතික පාසල්වලට. ඒ සෑම පාසලකටම ලක්ෂ 20 ගණනේ ගිය ජනවාරි මාසේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දීලා තිබෙනවා. අලුත්වැඩියාවන් සහ ඩෙස් පුටු, වැසිකිළි, කැසිකිළි, ජල නල ඒ සියල්ලක් අලුත්වැඩියා කරගෙන වැඩ කටයුතු කරන්න. මේකට මූලික හේතුව පිළිබඳව අපි ජාතික පාසල් අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් මැතිතුමාත් සමග සාකච්ඡා කළා. එතුමා වැඩියෙන්ම පැවසුවේ මේ අධ්‍යාපනයට ළමුන් පාසලට ඇතුළත් කර ගැනීම සඳහා විශාල වශයෙන් දෙමව්පියන්ගෙන් මුදල් ගන්න ජාවාරමක් අද අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තිබෙනවා කියලා. ඒක මඟ හරවා ගන්න නම් විදුහල්පතිවරුන් කරන්නේ අහවල් පුටුව කැඩිලා, අහවල් වහලය හදන්න ඕනෑ, අහවල් ගොඩනැගිල්ල හදන්න ඕනෑ, මේ තාප්පය හදන්න ඕනෑ, මේවාට මූල්‍ය පහසුකම් දෙමව්පියන්ගෙන් ලක්ෂ 02 ක, 03 ලබා ගන්න දරුවාව පාසලට දාන්න නම් මේ දෙය කරලා දෙන්න, අරක කරලා දෙන්න කියන වැඩ පිළිවෙළ තේරුම් අරගෙන අධ්‍යාපන අමාත්‍යතුමා එතුමාට බලය තිබෙන පාසල්වලට ලක්ෂ 20 ගණනේ මුල්ම අවුරුද්දේ බෙදා දුන්නේ. ජාතික පාසල්වලට. ඊට පස්සේ මමත් එතුමා සමග සාකච්ඡා කරන කොට අපි ඉල්ලීමක් කළා, පළාත් සභාවලටත් අඩුම ගාණේ ලක්ෂ 15 ක්වත් දෙන්න. මට තේරෙන්නේ නැහැ මධ්‍යම ආණ්ඩුව මේ පළාත් සභාවල් කොයි ආකාරයට ගණන් ගන්නවාද කියලා. මේ පළාත් සභාවලට ඒක තවම ක්‍රියාත්මක කරන්න මධ්‍යම ආණ්ඩුවේ කැමැත්තක් නැහැ. ඒක නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු අධ්‍යාපන ඇමැතිතුමාට යොමු කරන්න කැමැතියි. නිලධාරීන් හැටියට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාට යොමු කරන්න කැමැතියි. ජාතික ආණ්ඩුවේ නිලධාරීන් සමග නිලධාරීන්ට

සාකච්ඡා කරන්න කියන්න. දේශපාලන වශයෙන් පළාතේ අධ්‍යාපන අමාත්‍යවරුන් හැමෝම එකතු වෙලා ගිහිල්ලා ජාතික ආණ්ඩුවේ අධ්‍යාපන ඇමැතිතුමාත් සමග වහාම සාකච්ඡා ආරම්භ කරන්න අවශ්‍යයි. මොකද, මේ විධියට පහසුකම් ජාතික පාසල්වලට යනකොට පළාත් සභාවලට අර කියපු දෙමව්පියන්ගෙන් සල්ලි ඉල්ලා ගෙන තමයි ව්‍යාපෘති කරන්න වෙන්නේ. එතකොට තමයි හොරකම, වංචාව වැඩි වෙන්නේ. ඒ වුණාම තමයි අධ්‍යාපනයට නිසි ප්‍රතිඵල ලබා ගන්න බැරුව දරුවන් බිහි වෙන්නේ. ඒ නිසා මේ වතු පාසල් විතරක් නොවෙයි. ඊළඟට තිබෙනවා මුස්ලිම් දරුවන් ඉගෙන ගන්න පාසල්. අපේ චන්ද්‍රරත්න මන්ත්‍රීතුමා දන්නවා. අටළුගම, අල් ගත් සාලි කියන පාසල තිබෙනවා. එදා අපි හොරණ කලාප කාර්යාලයේ පැවැති රැස්වීමේදී අපේ ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා මගෙන් ඉල්ලීමක් කළා, පාසල් තුනක් මහ ඇරිලා තිබෙනවා, හොඳම පාසල ළඟම පාසල කිරීමේ වැඩ පිළිවෙළ තුළ. වරකාගොඩ, ගෝවින්න, බුලත්සිංහල ප්‍රාථමිකය. එතුමා කිව්වාම මම ලිපියක් ලියලා අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් මැතිතුමාට යොමු කළාම, එතුමා ඒකට මිනිට් එකක් දාලා අවශ්‍ය තැනට යොමු කරලා අපට ඒ පාසල් තුනම ඇතුළත් කර ගැනීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණා. හොඳම පාසල ව්‍යාපෘතියට ඇතුළත් කරන්න පුළුවන්කම තිබුණා. අන්න ඒ වාගේ අපි සුහද සාකච්ඡා මාර්ගයෙන් වැඩ කරන්න ඕනෑ. යහපාලන ආණ්ඩුවේ ප්‍රතිලාභය ජනතාවට ලබා දෙන්න ඕනෑ. යහපාලන ආණ්ඩුවේ වාසිය බෙදුණු, වෙන් වුණු, තරහින් ක්‍රියාත්මක වුණු දේශපාලඥයෝත් මේක තේරුම් අරගෙන වැඩ කරන්න පුරුදු වෙන්න ඕනෑ.

අන්න ඒ වැඩ පිළිවෙළ තුළ තමයි අපට මේ පළාත සංවර්ධනය කරලා, පළාතේ අධ්‍යාපනයේ ප්‍රතිඵලය ඉහළට ගෙනියන්න පුළුවන් ක්‍රමවේදයක් ඇති කර ගන්න පුළුවන් වෙන්නේ. අපි පළාත් සභාව දිහා ආපස්සට හැරිලා බැලුවොත් අපි කථා කරලා තිබෙනවා. වාද කරලා තිබෙනවා. විවාද කරලා තිබෙනවා. හැබැයි වචනවලට පමණයි ගරු සභාපතිතුමනි. මේවායෙන් ඇති වුණු ප්‍රතිලාභ, ප්‍රයෝජන පිළිබඳව අපි අධීක්ෂණයක් කළොත් ඒවා වෙලා තිබෙන්නේ දශම ගණන්වලින් ගරු සභාපතිතුමනි. මම කනගාටු වෙනවා. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා නැහැ. ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා නැහැ. රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා අසනීප වෙලා. ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමා නැහැ. අපේ සෞඛ්‍ය ඇමැතිතුමා ඉන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තේ බොන්න ගිහිල්ලා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

තේ බොන්න ගිහිල්ලා හරි, මේ විවාදය හරියට පාළු ගෙදර වළං බිඳිනවා වාගේ. සද්දේ නැතුව ඔහේ කියවනවා. අරගෙන යනවා. කාගේවත් ඇහුම්කන් දීමකට ලක් වෙන්නේ නැහැ. එහෙම නම් මේ පළාත් සභාව පිළිබඳව සංවර්ධනය ඇති කරන්න පුළුවන්කමක් ඇති වෙන්න මූලිකවම කටයුතු කරන්න ඕනෑ අධ්‍යාපනය. මේ පළාතේ අධ්‍යාපනයෙන් උපරිම ප්‍රයෝජනය ලබා ගන්නේ පාසල් යන දරු දැරියන්ගෙන් 10% යි. අනෙක් අනුවක්ම ව්‍යාපාරවලට යොමු වෙනවා. ඒ වාගේම කම්කරු වෘත්තියට යොමු වෙනවා. නොයෙකුත් දේවල් ආශ්‍රිතව ඇබ්බැහි වෙනවා. කුඩුවලට, මත්ද්‍රව්‍යවලට, ස්ත්‍රී දූෂණවලට නොයෙකුත් දේවල්වලට ඇබ්බැහි වෙනවා. මේකට අපි කරුණු හොයලා බැලුවොත් මොකක්ද හේතුව? මූලික අධ්‍යාපනය සහ අධ්‍යාපනයෙන් බුද්ධිය දියුණු කර ගැනීමේ නොහැකියාව තිබෙන දරුවෝ තමයි විශාල ප්‍රමාණයක් මේකට ඇතුල් වෙලා තිබෙන්නේ. එහෙම නම් බස්නාහිර පළාත හැටියට අපට ලැජ්ජයි. බස්නාහිර පළාතේ පහසුකම් තිබෙනවා. ආදායම් තිබෙනවා. ඒ වාගේම දක්ෂ දෙමව්පියන්ගේ දරුවෝ ඉන්නවා. ඒවාට පහසුකම් ලබන විශ්ව විද්‍යාල තිබෙනවා. ඒ වාගේම උසස් පෙළ හදාරන්න පහසුකම් තිබෙන විද්‍යාල තිබෙනවා. ඒවාගේම රැකියාවල් කරන්න රාජ්‍ය ආයතන තිබෙනවා. නමුත් මේවා ඔක්කෝම තිබියදී මේ වාගේ පල්ලෙහාට දරුවන් කඩා වැටීමේ මූලික ප්‍රශ්නය ගැන පළාත් සභාවේ - මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා උදේ හොඳ ප්‍රකාශයක් කරනවා. එතුමා කිව්වා, මේ පළාතේ තිබෙන පාසල් ප්‍රමාණය කොපමණද කියලා. එතුමා කිව්වා 1270 ක් අපේ පළාත් සභාවේ පාසල් තිබෙනවා කියලා. ඊට පස්සේ ගුරුවරු 36,000 ක් ඉන්නවා කිව්වා. ඊළඟට සිසුන් ලක්ෂ 07 ක් අවුරුද්දකට ඇතුල් වෙනවා කියලා. අනෙක් පැත්තෙන් ගුරු උපදේශකයෝ 722 යි. විදුහල්පති ඔක්කෝම එකතු කළාම 1165 ක් ඉන්නවා කියලා එතුමා ඉතාමත් වටිනා කරුණු කාරණා එකතු කරලා මේ සභාවේ ප්‍රශ්නයක් ඇහුවා. අන්න හොඳ

[ ගරු කිත්සිරි කහටපිටිය ]

ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් කරුණු කාරණා එක්ක එතුමා ප්‍රශ්නය අහනවා. ඒ වාගේම අපි කියන්න කැමැතියි මෙවැනි දේවල් අධ්‍යයනය කිරීම තුළ මේ පළාතේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය මොකක්ද? මම දැක්කා, පසුගිය දවස්වල මේ විද්‍යාලවල ගුරුවරු, විදුහල්පතිවරු සියල්ලම දේශපාලනයට යට වුණා. සියල්ලක්ම. අපේ රජය තිබියදී අපිත් එක්ක එකතු වුණා. අනෙක් පැත්තේ රජයවල් තිබියදී ඒ අයත් එක්ක එකතු වුණා. මෙන්න මේ ක්‍රමවේදය තුළ දේශපාලඥයින්ට කරන්න තිබෙන වැඩේ ගුරුවරු කරන්න ගිහිල්ලා ගුරුවරු අද දේශපාලඥයෝ වෙලා, දේශපාලඥයෝ ගුරුවරු වෙලා. මෙන්න මේ අර්බුදය තමයි බස්නාහිර පළාතට ඇති වෙලා තිබෙන්නේ කියන එක මම මතක් කරන්න ඕනෑ.

ඔබතුමාගේ මාර්ගයෙන් අද උදේ මම විශේෂ ප්‍රකාශයක් කළා. අපේ හොරණ තක්ෂිලා ප්‍රාථමික විදුහල සම්බන්ධව. විදුහල්පතිතුමා අපේ හිතවතා. ඒ පාසලේ එතුමාට කරන්න දෙයක් නැහැ. කුළුපනින් හයේ පන්තියේ ළමයි ටික එනවා. පොකුණුවිට ඉස්කෝලයෙන් හයේ පන්තියේ ළමයි ටික එනවා. බැල්ලපිටියෙන් හයේ පන්තියේ ළමයි ටික එනවා. ළමයි ආවාට ඉස්කෝලේ කණු බැඳලා, තට්ටු ගහලා විතරක් තිබෙනවා. වටේ ආවරණය කරලා බැඳලා දීලා නැහැ. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ මාර්ගයෙන් මතක් කරන්න කැමැතියි අධ්‍යාපන ක්ෂේත්‍රයේ කවුරු හරි ඉන්නවා නම්, අපි අධ්‍යයනය කරලා බැලුවා බස්නාහිර පළාතේ අයවැය 2016 ට හදන්නේ කොහොමද කියලා. පැහැදිලිවම ඒකේ වැඩියෙන්ම මූලා ප්‍රතිපාදන යොදවලා තිබෙන්නේ අධ්‍යාපනයට. එහෙමත් යොදවපු අධ්‍යාපනයට මුදල් තිබෙන තැන අපේ අධ්‍යාපන ඇමැතිතුමා උත්සවලට ගිහිල්ලා කථා පවත්වනවා විතරයි. එතුමා කථා පවත්වාගෙන ඇවිල්ලා ඒ ඉස්කෝලයටත් ගියා. අර විද්‍යාලයේ ළමයි ටික ආවාම,මාස 03 ක් යනකල් දෙපැත්තේ බැම් දෙක බැඳලා, තට්ටු තුනක ගොඩනැගිල්ල දැල් ආවරණය කරලා, පුටු ටික තියලා ළමයින්ට උගන්වන්න සැලසුමක් හදලා නැහැ. දොස් කියනවා නොවෙයි. මේ පිළිබඳ අවබෝධය අරගෙන පළාතේ දරුවන්ගේ අධ්‍යාපනය දියුණු කරන මහජන නියෝජිතයින් හැටියට අපටත් ගෞරවයක් එන විධියට, මේ සභාවේ මූලා ප්‍රතිපාදන යොදවලා එම අධ්‍යාපන ක්ෂේත්‍රය දියුණු කරන්න වැඩ කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව වතු පාසල්වල දරුවන් වෙනුවෙන් අධ්‍යාපනය ලබන අයට - මේ මහ ආණ්ඩුවෙන් මාධ්‍යවේදීන්ට යතුරු පැදි ගන්න 2.5% ක ණයක් දීලා තිබෙනවා. එහෙම නම් ඇයි පළාත් සභාවට බැරි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද කවුරුවත් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අද මාධ්‍යවේදීන් නැහැ. පළාත් සභාවටත් අපි කියනවා. මේක සභාවෙන් යම් යම් විධියට කපා ගන්න හැකි වන විධියට ඒ වැඩ කටයුතු කරලා දෙන්න. ගරු ඇමැතිතුමා ඔබතුමාත් ඉල්ලීමක් කරලා. එහෙම නම් මේ පළාත් සභාවේ දුෂ්කර වතු පාසල්වල එම ගුරුවරුන්ට අනිවාර්යයෙන්ම මෙම ප්‍රවාහන පහසුකම ලබා දීමට අත්‍යවශ්‍යයි කියන එක ප්‍රකාශ කරමින් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාමත් විශිෂ්ට යෝජනාවක් හැටියට අගය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු, ප්‍රකාශය බැලුවාම මෙතැන අධ්‍යාපන ඇමැතිතුමා හිටියා නම් මම හිතන්නේ ඉතාමත් වැදගත්. මොකද, මේ සිද්ධිය ඔබතුමා ගිහිල්ලා ආවට පස්සේ මමත් ඒ ස්ථානයට ගියා ගරු මන්ත්‍රීතුමා. විදුහල්පතිවරුන්ට කරන්න දෙයක් නැහැ. ඒ නිසා අපි හැකි ඉක්මණින් ගත යුතු ක්‍රියා මාර්ගයක් තමයි කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා පෙන්නුවේ. ඒ නිසා

මේක පෞද්ගලිකව හරි අධ්‍යාපන ඇමැතිතුමාගේ අවධානයට යොමු වෙන්න ඕනෑ කියන විශ්වාසයක් මා තුළ තිබෙනවා. මීළඟට ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[ පූ.භා. 10.52 ]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉතාම වැදගත්, ඒ වාගේම බොහෝ වෙලාවට කථා කරන්නේ නැති පාර්ශවයක් පිළිබඳව යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. මේ යෝජනාව තුළ විශේෂයෙන් එතුමාගේ ප්‍රදේශවල වතු පාසල්, වතු නිවාස විශාල ප්‍රමාණයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවායේ වැඩියෙන්ම ඉන්නේ අඩු ආදායම් තිබෙන දරුවෝ. ඒ වාගේම පාසල්වල විදුහල්පතිවරු, ගුරුවරු මහ විශාල ඉහළ ආදායම් තිබෙන අය වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ හා සමානවම ආදායම අතිනුත් දරුවෝ සහ ගුරුවරු වගේම දෙමව්පියොත් අඩු මට්ටමක ඉඳිද්දි, ප්‍රදේශයේ තිබෙන දුෂ්කර භාවය, ප්‍රදේශයේ තිබෙන අපහසුතාවයන්ද ඒ හා සමානවම වැඩි මට්ටමක තිබෙනවා. ඒ නිසා තමයි ගරු මන්ත්‍රීතුමා මෙවැනි යෝජනාවක් ගෙන එන්නේ. අපි හිතන්නේ සාමාන්‍යයෙන් අධ්‍යාපනය, සෞඛ්‍ය මේ සියල්ලම හැමෝටම සමාන වෙන්න ඕනෑ. නමුත් සමහර පාසල්වල දෙමව්පියන්, ඒ වාගේම සුභ පතන්නන් සහ රජයේ පාර්ශවයෙන් ගත්තත් වැඩි අවධානයක්, වැඩි සැලකිල්ලක් ලක් වෙලා තිබෙන කාල පරිච්ඡේදයක්. එවැනි තත්ත්වයක අඩු පහසුකම් මධ්‍යයේ, අඩු ආදායම් මධ්‍යයේ කටයුතු කරන අය සම්බන්ධව වැඩි අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. මේ පාසල්ට ඉතාම දුෂ්කර ප්‍රදේශයක, සමහර විට පයින් ඒ වාගේම සමහර විට ත්‍රීවිල්වල එන්න වෙන්නේ. පයින් යන්න ගියොත් විශාල කාලයක් යනවා. විශාල අපහසුතා මැද්දේ යන්න වෙන්නේ. කිලෝ මීටර් ගණනාවක්. ඒ වාගේම මේ පාසල්වල තිබෙන ඊළඟ ප්‍රශ්නය තමයි වියදම් කරගෙන යන්න වුණත් මහ විශාල අතමිට තිබෙන පරිසරයක් නැහැ. ඉතින් එවැනි තත්ත්වයක් තුළ පළාත් සභාවේ පාසලුත් නිසා අපට වගකීමක් තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ඇමැතිතුමාට සහ අධ්‍යාපන ඇමැතිතුමාට අපේ අවධානය යොමු කරලා මේ පාසල්වල විදුහල්පතිවරුන්ට ගමනාගමන පහසුකම් සලසන්න. බස් රථ ලබා දීමෙන් පහසුකම් සැලසෙනවා වාගේම පොදුවේ ගත්තාම පසුගිය කාල පරිච්ඡේදයේ - අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කියපු කාරණාත් එක්ක ගත්තාම මධ්‍යම රජයේ පාසල්වලට උදව් කරන්න ලොකු බලාපොරොත්තුවක් තිබෙනවා. හැබැයි මධ්‍යම රජයේ පාසල් තුන්සිය ගණනක් තිබෙන කොට පළාත් සභාවලට තමයි ඒකෙන් වැඩි ප්‍රමාණය, නවදහස් ගණනක් පාසල් තිබෙන්නේ. ඒ පාසල්වල තමයි වැඩියෙන්ම දරුවෝ ඉන්නේ සහ දුෂ්කරතා ප්‍රශ්න තිබෙන්නේ. ඒ නිසා වැඩි ප්‍රතිපාදන ලබා දිය යුත්තේ ඒ පාසල්වලට වුණත් මධ්‍යම රජයේ අවධානය යොමු කරන්න විධියක් නැහැ. මධ්‍යම රජයේ අවධානය යොමු කරන්නේ නැහැ කියන කාරණාව කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙනුත් පැහැදිලි වුණා.

නමුත් අපි දන්නවා අපේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ 2014 වර්ෂයේ මුළු රටේම මධ්‍යම රජයේ පාසල්වලට පහසුකම් දෙනකොට, පළාත් පාසල්වලටත් විශාල ප්‍රතිපාදන දුන්නා. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විතරක් නොවෙයි. ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙනුත් කෝටි ගණනක මුදලක් පළාත් පාසල්වල දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වෙන් කළා. මේ රජය එනකොට අධ්‍යාපනයට 6% ක් ලබා දෙනවා කියලා කිව්වා. ඒ ආණ්ඩුව පිහිටුවන්න කටයුතු කරපු විශ්ව විද්‍යාල ගුරුවරුන්ගේ සංගමයේ හිටපු සභාපතිතුමාම කිව්වා පසුගිය අයවැයෙන් ඉදිරිපත් කළේ බොරු ඉලක්කම්. මේවා සූත්තර. එහෙම නැත්නම් මාධ්‍ය සංදර්ශන. මේ කියලා තිබෙන්නේ බොරුවක් කියලා. ඒ ගැන එතුමන්ලාම කියන එක පිළිබඳව අපි පුදුම වෙන්නේ නැහැ. මොකද, මේ ආණ්ඩුව බලයට පත් කරන්න කියන කොට එක කාරණාවක් නොවෙයි. බොහෝ කාරණා සම්බන්ධව රටට අතිශෝක්තියෙන් කිව්වා. පට්ටපල් බොරු කිව්වා. කියපු සමහර ඒවා වැරදි විධියට ප්‍රචාරය කළා. ඒ නිසා අද මේ ආණ්ඩුව බලයට පත් කළාට පස්සේ වෙලා තිබෙන දේ ගැන ඒ අයටම තේරෙනවා. අපි කොහේටද ගියේ? මොකද වුණේ? දැන් මේ මන්ත්‍රීතුමන්ලාගෙන් ඇහුවොත් ආණ්ඩුව එතුමන්ලාගෙද කියලා. සමහර වෙලාට අපටම කියනවා, මේ ආණ්ඩුව අපේද කියලා ඒ අයට හිතෙන්නේ නැහැ කියලා. ආණ්ඩුව ඒගොල්ලන්ගෙත් නොවෙයි. අපෙත් නොවෙයි. කාගේද කියලා. ඇමැතිකම් ගත්තු කිහිප දෙනාගේ ආණ්ඩුවක් බවට පත් වෙලා තිබෙනවා. ජනතාවගේ ආණ්ඩුවක් බවට පත් වෙලාත් නැහැ. එවැනි තත්ත්වයක් තුළ ජනතාවට වෙන්න ඕනෑ සේවාව හරියට වෙන්නේ නැහැ කියන කාරණාව පිළිබඳව අප කාගේත්

[ ගරු ජගත් කුමාර ]

විවේචනයක් තිබෙනවා. ඒ විවේචනයම අපේ හිටපු විපක්ෂ නායක කිත්සිරි කහටපිටිය මැතිතුමාගේ කථාවෙනුත් පැහැදිලි වුණා. නමුත් අපට මේ විවේචනය විතරක් කරගෙන මේ රටේ ජනතාවට සහන සලසන්න හෝ ජනතා සේවාව ඉෂ්ට කරන්න බැහැ. විවේචනයෙන් ඔබ්බට ගිහිල්ලා ජනතාව වෙනුවෙන් වැඩ පිළිවෙළක්, කැපවීමක් විය යුතුයි.

ඒ නිසා අපි පළාත් සභාවේ ආණ්ඩු පක්ෂය වුණාට, මධ්‍යම රජය ගත්තාම අපි වාගේ පාර්ශව විපක්ෂයේ. හැබැයි අපේ කණ්ඩායමක් ආණ්ඩු පක්ෂයේත් ඉන්නවා. මධ්‍යම රජයේ ආණ්ඩු පක්ෂයේත් ඉන්නවා. ඉතින් මොන සහයෝගයෙන් හරි - මේක නිකම් අමුතු තාලයේ ආණ්ඩුවක්. අමුතු තාලේ පළාත් සභාවක්. මේ අමුතු තාලේ එකෙන් ජනතාවට මොනවා හරි කරන්න පුළුවන් නම් අපි ඒකේදී ජනතාවගේ පැත්තෙන්, අපි ආණ්ඩුවේද විපක්ෂයේද කියලා හිතන්නේ නැතුව ජනතාව පැත්තෙන් අපේ සහයෝගය දෙනවා. ඒ සහයෝගය ලබා දීම සඳහා අපි අපේ පැත්තෙන් ඕනෑම වෙලාවක ජනතාව වෙනුවෙන් තීන්දු ගත්තොත්, අත් දෙකම උස්සලා සහයෝගය දෙනවා. ඉතින් ඒ නිසා මේ යෝජනාවත් එවැනි යෝජනාවක්. ඒ යෝජනාව අපේ පූර්ණ සහයෝගය තිබෙනවා. ඒ වාගේම මධ්‍යම රජයෙන් පළාත් සභා පාසල්වලට මුදල් දෙන්න බැහැයි කියලා කියනවා නම් ඒක පට්ටපල් බොරුවක්. බැරිකමකුත් නැහැ. ඒ වාගේම වගකීමක් නැත්තෙත් නැහැ. වැඩිම වගකීමක් තිබෙන්නේ මධ්‍යම රජයට. හැබැයි නොසලකා හරින්න, අවජාතක පාසල් වාගේ අනෙක් පාසල් ගැන හිතන්නේ. එහෙම පාසල් පද්ධතියක් නැහැ. ජාතික පාසල් හා සමානවම මේ පළාත්වල වගකීම තිබුණා වුණාට, මධ්‍යම රජයේ මේකේ ප්‍රතිපත්ති සම්පාදන කටයුතුවලදී - දැන් අපට ළමුන් දාන එකත් කියලා දෙන්නේ, රෙගුලාසි ඉදිරිපත් කරන්නේ මධ්‍යම රජයෙන්. එහෙම පුළුවන් නම් පාසල් හදන්න, පාසල් සංවර්ධනයටත් දෙන්න එපැයි. මෙතෙක් කල් 2014 න් පස්සේ අපේ පළාත් සභාවල පාසල්වල එක වැසිකිළියක් හැදුණේ නැහැ. එක පන්ති කාමරයක් හැදුණේ නැහැ. මේ සියල්ල කඩා වැටිලා තිබෙන්නේ.

ඒ නිසා මේ රටේ ජනතාව ඒකයි කියන්නේ මහින්ද රාජපක්ෂ කියන්නේ මේ රටට මහ විශාල සංවර්ධනයක් කරපු නායකයෙක් කියලා. අර ගොවියෝ උද්ඝෝෂණය කරන ගමන් කිව්වා, අපි මහා අපරාධයක් කර ගත්තේ. ආයිත් නම් අපි ඒක කරන්නේ නැහැයි කියලා. පොහොර සහනාධාරය වැඩි කරලා දෙනවා. සහතික මිල රුපියල් 50 ට දෙනවා කියලා අද රුපියල් 20 වත් ගොවීන්ට වී ටික විකුණා ගන්න බැහැ. සහනාධාරය ගන්න බැංකු ගිණුම් කිහිපයක් අරින්න ඕනෑ. රස්තියාදු වෙන්න ඕනෑ. පත්‍රිකා පුරවන්න ඕනෑ. මම දැක්කා කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන්ට එවලා තිබෙනවා පත්‍රිකා වගයක් පුරවන්න. ඒක පුරවන්න වෙනම ඉගෙන ගන්න ඕනෑ. වෙනම තාලයකට කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඉතින් නිලධාරීන්ට එහෙම නම් දුප්පත් මිනිස්සුන් කොහොමද මේවා පුරවන්නේ කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා බරපතළ විධියට අපි ආණ්ඩුවෙන් ඉල්ලනවා. එක පැත්තකින් මේ වෙලාවේ කර අරින්න එපා. අධ්‍යාපනය තමයි රටක අනාගතය. දරුවෝ තමයි ජාතියේ ඉදිරි ගැම්ම, පිම්ම, ඉදිරි දැක්ම. ඒ නිසා ඔවුන් වෙනුවෙන් ගත හැකි සියලු දේ කරන්න ඕනෑ. ඒ වාගේම අවාසනාවකට මේ සභාවේ කථා කරන කොට අපේ එකම ඇමැති කෙනෙක්වත් නැහැ. විශේෂයෙන්ම අධ්‍යාපනය ගැන කථා කරන කොට. ඉතින් මෙහෙම පළාත් සභාවකට අපට වගකීමක් තිබෙනවාද? අපි පළාත් -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හිටපු ඇමැතිතුමා ඉන්නවා. වගකීමක් දරන්න පුළුවන් කෙනෙක් ඉන්නවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

හිටපු ඇමැතිතුමා ඉන්නවා. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා. එතුමාත් ඇමැතිකම නැති වුණාට පස්සේ වැඩියෙන් ඉන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මොකක්ද, මොකක්ද? ආයිත් කියන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පළාත් සභාවේ ඇමැතිකම් ගත්තාට පස්සේ මේ සභාවේ ඉන්න ඕනෑ කියලා හිතෙන්නේ නැහැ. පුදුම වැඩක්. මේ සභාවේ කථා කරන දේවල් අමතක කරලා, සභාවේ

කියන කරන දේවල් ගැන අවධානය යොමු කරන්නේ නැහැ. හැබැයි මේ පළාත් සභාව තමයි, මධ්‍යම රජයේ පාර්ලිමේන්තුව මෙන් අපට ජනතාව ඡන්දය දුන්නේ පළාත් සභාවේ ඔවුන්ව නියෝජනය කරන්න, අදහස් කියන්න කියලා. හැබැයි අපි කියන දේ වැඩක් නැහැ. නිකම් හිස් අවකාශයට යනවා. මැති ඇමැතිවරු සියලු දෙනාම අතහැරලා දාලා ගිහිල්ලා තිබෙනවා. ඉතින් ඒක නිසා මේ අවාසනාවන්ත තත්ත්වයෙන් මුදවා ගන්න සියලු දෙනාටම ඒ සඳහාත් මැදිහත් වෙන්න කියන කාරණාව කියමින් විශේෂයෙන් අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගොනාපු යෝජනාවේ බයිසිකලයක් ලබා දීම පිළිබඳවත් අදහසක් තිබුණා. පළාත් සභාවට පුළුවන් නම් යතුරු පැදියක් ලබා දෙන්න. ඒක හොඳයි. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ රාජ්‍ය සේවකයන්ට යතුරු පැදි ලබා දුන්නා. ඒ යතුරු පැදි විශාල පිරිසකට දුන්නා. ඒ යතුරු පැදි රුපියල් 45,000/- ට, 50,000/- ට දෙන එක නොමිලේම දෙනවා කියලා තමයි මේ යහපාලන ආණ්ඩුව, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළට ඇතුල් වුණේ. රාජ්‍ය සේවකයන්ට නොමිලේ දෙනවා කියලා. එදා ගුරුවරුන්ටත් සංකේතාත්මකව දුන්නා. මට මතකයි මාතරදී. පොලීසියටත් දුන්නා. දැන් ඒ කාටවත් දෙන්නේ නැහැ. සල්ලි දුන්නු සමෘද්ධි නිලධාරීන් ඉන්නවා තවම යතුරු පැදිය ගන්න බැරුව. දැන් කිව්වේ නොමිලේ දෙනවා කියලා. සල්ලි ගෙවලාවත් ගන්න බැහැ. ඉතින් මේක මහ අවාසනාවන්ත තත්ත්වයක්.

ඉතින් ඒ නිසා අපි කියනවා ආණ්ඩුවට, නැවත තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය, තමන් ඡන්දවලදී ඉදිරිපත් කරපු එවා නැවත නැවත කියවලා බලන්න. මේ ජනතාව වෙනුවෙන් තමුන් කරන්න ආවයි කියපු දේවල් වෙන්නේ නැහැ. එහෙම කරන්නේ නැතුව මහ පාරේ ලිප්ටන් වටරවුමට ගිහිල්ලා ජනතාවට පීඩා වන පිකටිං කරලා වැඩක් නැහැ. ඒවායේ ඉඳගෙන වැඩක් නැහැ. දැන් පිකටිං එකක් කරන කොට අපට තිබෙන නීතිය, එක් පැත්තකින් මහජන පීඩාවක් ඇති වෙනවා කියලා අපට අධිකරණ තීන්දුවක් අරගෙන එනවා. එහෙම නම් අගමැතිතුමාට තමයි පළමුවැනි අධිකරණ තීන්දුව දෙන්න ඕනෑ. එතුමා මහ පාර මැද්දේ හිටගෙන ඉන්නවා. (බාධා කිරීමක්) සෙනග නැති නිසා කල්පනා කරනවා මොකක්ද මේ වුණේ කියලා. සෙනග නැති නිසා අගමැතිතුමා කල්පනා කරනවා මොකක්ද මේ වුණේ? අපි කරගත්තේ මොකක්ද කියලා. ඉතින් ඒ නිසා මම බොහොම වගකීමෙන් කියනවා. අධ්‍යාපනය වෙනුවෙන්, සෞඛ්‍ය වෙනුවෙන් ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් කියන මේ කාරණාවලදී රජය විධියට අපි පක්ෂ පාට බෙදා ගන්න ඕනෑ නැහැ. එකේදී සභාය දෙනවා. කරුණාකරලා මේ ගැටළුවලට මැදිහත් වෙන්නේ, විශේෂයෙන් පළාත් සභාවෙන් කෙරෙන්න තිබෙන දේවල්වලදී අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු අමාත්‍යවරු මීට වඩා වගකීමෙන් කටයුතු කරන්න. අපට උත්තර දෙනවා - දැන් මට දීලා තිබෙන උත්තරේ - ගිය සභාවේ මම හිටියේ නැහැ. මේ උත්තරේ පට්ටපල් බොරු තියෙන්නේ. මහ ඇමැතිතුමා දීලා තිබෙන්නේ. මහ ඇමැතිතුමා නැති නිසා මම කථා කරන්නේ නැහැ. ඊළඟ සභාවේදී ඒ ගැන කථා කරන්නත් මම ලැහැස්ති වෙනවා කියන එක මතක් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි මන්ත්‍රීතුමා. මූලාසනයට බලාගෙන ඉන්න පුළුවන්කමක් නැහැ ගරු මන්ත්‍රීතුමන්ලා මේ සභාව තුළ දිගින් දිගටම ඇමැතිවරුන්ගේ කැපවීම, ඇමැතිවරුන්ගේ සහභාගීත්වය පිළිබඳව කථා කිරීම සම්බන්ධව. ඒ නිසා මම විශ්වාස කරනවා ගරු ඇමැතිතුමන්ලා සභාව කෙරෙහි දක්වන අවධානය සහ සහභාගීත්වය පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමාටත්, ඉහළටත් දැඩි ලෙස දැනුවත් කළ යුතුයි කියලා. ඒක සභාගත කරනවා. මම හිතන්නේ සියලුම මන්ත්‍රීතුමන්ලා ඒ සම්බන්ධව එකඟ වෙයි. මේක දිගටම බලාගෙන ඉන්න පුළුවන්කමක් නැහැ. සභාවේ වගකීම ඇමැතිතුමන්ලා දරන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පුළුවන් නම් අමාත්‍ය ධූර වෙනස් කරන්න කියලා අපි යෝජනා කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමියගේ අදහස බොහොම හොඳයි. මීළඟට සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ පූ.භා. 11.04 ]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, එතුමාගේ කථාව කරගෙන යනකොට කිව්වා, මාස 08 ක් විතර මේ යෝජනාව න්‍යාය පුස්තකයේ තිබිලා, පළාත් සභාවට කරන්න පුළුවන්, පළාත් සභාවට බලපාන යෝජනාවක් අද දවසේ අපි සාකච්ඡා කරනවා කියලා. ඒ වාගේම තමයි එතුමාගේ කථාව අවසන් කරන කොට එතුමා බොහොම බැගෑපත් ඉල්ලීමක් කෙරුවා. මේ යෝජනාව ක්‍රියාත්මක කරන තත්ත්වයට ගෙන එන්න. හමස් පෙට්ටියට අරින්නේ නැතුව කියලා. මට මතක් වෙන්නේ පසුගිය පළාත් සභාවේදී මා විසින්ම විවිධ අවස්ථාවලදී යෝජනා දෙකක් ඉදිරිපත් කළා. එකක්, මේ බස්නාහිර පළාතේ ඉන්න ධීවර ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කරන්න පුළුවන් ආකාරයට කටයුතු කරන්න කියලා යෝජනාවක් ඉදිරිපත් කළා. එදා නිමල් ලාන්සා මැතිතුමා තමයි ධීවර ඇමැතිතුමා හැටියට හිටියේ. බොහොම ඉහළින් පිළිගත්තා. මේ සභාවට කරන්න පුළුවන් යෝජනාවක් තමයි තමුන්නාන්සේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ පිළිබඳව ක්‍රියාත්මක වෙනවා කියලා ප්‍රකාශ කළා. හැබැයි ඒකත් හමස් පෙට්ටියට ගියා. ධීවරයා තවම එතැනමයි. ඊට පස්සේ යෝජනාවක් ගෙන ආවා මේ පළාත් රාජ්‍ය සේවයේ ඉන්න සේවකයින්ට සහන මිලට නිවාස පහසුකම් ටිකක් ඇති කරලා දෙන්න කියලා. ව්‍යාපෘතියක් විදියට දිස්ත්‍රික්ක තුනේ නියාමන ව්‍යාපෘතියක් ඉදි කරලා මහල් නිවාස හෝ මේ පළාත් රාජ්‍ය සේවයේ ඉන්න අයට දෙන්න කියලා. මේ පළාත් සභාවෙන් කරන්න පුළුවන් දේවල්. එතකොට ඒකේ වගකීම තිබුණෙත් ඒ ඇමැතිවරයාටමයි. බොහොම ඉහළින් පිළිගත්තා. හැබැයි ඇමැතිවරයා පාර්ලිමේන්තු ගියා. යහපාලන ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමැතිවරයෙක් වුණා. ප්‍රශ්න ටික තවම හමස් පෙට්ටියේ.

ඒක නිසා මම ඉතාමත් ගෞරවයෙන් - ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා ඉන්නවා. සන්තෝෂයි. අඩු ගාණේ එතුමා හරි මේ හිස් පුටුවල තිබෙන පාඩුව මකන්න, පාළුව මකන්න අද මෙතැන සිටීම පිළිබඳව. මේ යෝජනාව ඇත්ත වශයෙන්ම ක්‍රියාත්මක කරන්න. මේ පිළිබඳව මම හිතන්නේ බොහොම හොඳ අදහස් ඉදිරිපත් වුණා. මම ගුරුවරියෙක්ගේ දරුවෙක්. අපේ අම්මා අපිව අරගෙන කිලෝ මීටරයකට ආසන්න ප්‍රමාණයක් පමණ අතර අපේ ගමේ ඉස්කෝලයට පයින් තමයි ආවේ. මගේ පවුලේ ගුරුවරු හතර දෙනෙක් ඉන්නවා. අක්කා, නංගි, මල්ලි මේ විදියට. ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමාගේ අම්මයි, අපේ අම්මයි එකට බෝලවලාන ගුරු අභ්‍යාස විද්‍යාලයේ සමකාලීනයෝ. මම මේ කියාගෙන ආවේ ඒ කාලේ ගම මැද්දෙන් යනකොට අපේ අම්මා සිංදුවක් කිය කියා තමයි අපව එක්කරගෙන යන්නේ. සුනිල් ශාන්ත මහත්තයාගේ සිංදුව.

*මීහිකත නලවාලා - මග මල් ගන්වාලා*
*පාසල වෙත යන මේ - පිටිසර හෙළ ගුරු ලිය සැරදේ*

කියලා. එහෙම පරිසරයක් තිබුණා. එහෙම බොහොම සතුටින් පාසලට වෙත යන්න, ඒ තිබෙන දුෂ්කරකම, තමන්ට තෘප්තිමත් විදියට හැහෙන ආකාරයට කටයුතු කරගෙන ගිහිල්ලා යහපත් මානසික තත්ත්වයකින් පාසලේ උගන්වන්න පුළුවන් ගුරු පරම්පරාවක් එදා හිටියා. හැබැයි මම කියන්නේ නැහැ අද එහෙම තත්ත්වයක් තිබෙනවා කියලා. අද විශාල ප්‍රශ්න සංඛ්‍යාවක් එක්ක, පීඩනයක් ඇතුව තමයි ගුරුවරු මේ රාජ්‍ය සේවයේ ඉන්නේ. ඒ පිළිබඳව මීට කලින් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විශේෂ ප්‍රකාශයක් කළා. අද එතුමා කරපු ප්‍රකාශයම තමයි මමත් විශේෂ ප්‍රකාශයක් විදියට කරන්න බලාපොරොත්තුවෙන් ආවේ. නමුත් ඒක අවශ්‍ය නැහැ කියලා අපේ කණ්ඩායමෙන් කියපු නිසා මම ඒ ප්‍රකාශය ඉල්ලා අස්කර ගත්තා. නමුත් මම සන්තෝෂ වෙනවා මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා බොහොම සාර්ථක සංඛ්‍යා බන ඉදිරිපත් කරලා මේ පළාත් සභාව තුළ තිබෙන ගුරු පුරප්පාඩු, ගුරුවරුන්ගේ ප්‍රශ්න පිළිබඳව යහපත් කථාවක් කෙරුවා. දැන් ඒ කථාව කෙරුවේ කාටද? ඒක අහන්න අධ්‍යාපන ඇමැතිවරයා නැහැ. 1988 ස්ථාපිත කරපු පළමුවැනි පළාත් සභාවට පස්සේ අධ්‍යාපන විෂයය ප්‍රධාන ඇමැතිවරයාගෙන් ගැලවුණු පළමුවැනි අවස්ථාව මේක. පළමුවැනි පළාත් සභාවේ සුසිල් මුණසිංහ මැතිතුමා මහ ඇමැති විදියට ඉන්නකොට, ඊයේ පෙරේයිදා කළුරිය කරපු සුරනිමල රාජපක්ෂ මැතිතුමා තමයි අධ්‍යාපන ඇමැතිවරයා හැටියට කටයුතු කළේ. ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාට මතක ඇති. හැබැයි ඊට පස්සේ හැම අවස්ථාවකදීම මේ පළාත් සභාවේ ප්‍රධාන ඇමැතිවරයා තමයි අධ්‍යාපන විෂයය භාරව හිටියේ. දැන් අද ඒක වෙනස් වෙලා. අධ්‍යාපන විෂයය තියෙන්නේ වෙනත් ඇමැතිවරයෙකුට. ප්‍රධාන ඇමැතිවරයාට නැහැ. අපට පේනවා මෙතැන පොඩි

ගැටීමක් තිබෙනවා. ඉතින් ඒක නිසා ඒ ගැටීම මේ පළාත් සභාවේ ඉන්න ගුරුවරුන්ට, මේ පළාත් සභාවේ පාසල්වල ඉන්න දරුවන්ට, එතැනට යන්න අපි ඉඩ තියන්න හොඳ නැහැ. ඒක නිසා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා - මෙතැන මගේ පිටිපස්සේ හිටපු මන්ත්‍රීතුමා මගෙන් ඇහුවා දැන් සභාවේ කථා කරන්නේ නැත්තේ ඇයි කියලා. ඇත්තටම බොහොම කලකිරීමෙන් තමයි ඉන්නේ. මට මතක හැටියට මම මේ අවුරුද්දේ යෝජනාවකට කථා කරන පළමුවැනි අවස්ථාව වෙන්න ඕනෑ. එහෙම කථා කරන්නේ නැත්තේ - කාටද කථා කරන්නේ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාම කියන්න අපි කාටද කථා කරන්නේ? අදත් ප්‍රධාන ඇමැතිතුමා නැහැ. අඩුම ගාණේ ඇහුම්කන් නොදුන්නත් කමක් නැහැ මේ අපි කථා කරන එවා නැවත වතාවක් එතුමන්ලා ශ්‍රවණය කරලා ඒ පිළිබඳව ක්‍රියාත්මක වෙනවා නම්. ඉතින් එහෙම නැහැ. ඒක නිසා අපට තේරෙනවා මේ පළාත් සභාව - මගේ අල්ලපු ආසනයේ හිටපු මන්ත්‍රීතුමා එක්ක කිව්වේ,පළාත් සභාවේ ගේන්න ඕනෑ මූලික යෝජනා ටික හයවැනි පළාත් සභාව වනකොට ගෙනැල්ලා ඉවරයි. මේකේ සංයුතිය හදන්න, නීති රීති සකස් කරන්න, රීති හදන්න ඒවා පළමුවැනි එකේදී, දෙවැනි එකේදී, තුන්වැනි එකේදී ගෙනාවා. දැන් ඇත්තටම මේ පළාත් සභාවේ ජාත්‍යන්තර ප්‍රශ්න තමයි කථා කරන්නේ. එහෙම පළාත් සභාවක් තමයි දැන් මේ තියෙන්නේ. ඒක නිසා එවැනි අවස්ථාවකවත් මේ පළාත් සභාවට කරන්න පුළුවන් යමක් කරනවා නම් ඒක තමයි වටිනාකම. මම හිතන්නේ ඒක තමයි මේ ඇමැතිවරුන්ගේ වගකීම වෙන්න ඕනෑ. ඒක නිසා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා, මේ යෝජනාව සක්‍රීය තත්ත්වයට ගෙන එන්න. ඒකට ඕනෑ කරන මුදල් වෙන් කර ගන්න. සමහර වෙලාවට කියයි ඇයි ගුරුවරුන්ට විතරද? දැන් මෙතුමා සඳහන් කළා වතු පාසල් ගැන. මම නියෝජනය කරන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල මැතිවරණ කොට්ඨාශයේ ධීවර ප්‍රජාව ඉන්නේ. ගිහිල්ලා බලන්න, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා සාක්ෂි දරයි. බස්නාහිර පළාතේ මීගමුව කොට්ඨාශයේ ජා-ඇළ, වත්තල මුහුදු බඩ තීරයේ පාසල්වල තිබෙන තත්ත්වය. අලුත් පත්වීමක් දීලා හරි ගුරුවරයෙක් දැම්මාම ඒ ගුරුවරයා යන්නේ නැහැ. ඒවා නිකම් දුෂ්කර පාසල්ව වාගේ. හරියට දුෂ්කර පත්වීම් කියලා ඉස්සර දුන්නේ. අන්න ඒ වාගේ. උස්වැටකෙයියාවට, බෝපිටියට, පමුණුගමට, දූන්ගාල්පිටියට, කැපුම්ගොඩට, තලාහේනට, පිටිපනට, දික්ඕවිටට මේ මුහුදු බඩ තීරයේ තිබෙන විද්‍යාලවලට ගුරුවරයෙක් දැම්මාම යන්නේ නැහැ. හොඳම උදාහරණය ඊයේ පෙරේදා දැන් මාස ගණනකට කලින් උපාධිධාරී ගුරු පත්වීමක් කළා. දැලතුරේ ඉස්කෝලයට ඇරියා. අම්මයි, දුවයි ගිහිල්ලා තිබුණා. දුව විදුහලේ දොර ගාව ඉඳිද්දී අම්මා ගිහිල්ලා විදුහල්පතිතුමාට පත්වීම් ලිපිය භාර දෙනකොට දුව කියනවා,අම්මේ එන්න. එන්න. යන් යන් කියලා. එහෙම්ම හැරිලා ගියා. මේක ඇත්ත කථාවක්. ඇයි මේ? මේ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. ගුරුවරු බඳවා ගැනීමේදී, උපාධිධාරී වේවා. වෙනත් පුහුණු ගුරුවරු වේවා අඩුම තරමින් මේ පළාත්වලට යන්න පුළුවන් ගුරුවරු ඒ ප්‍රදේශවල ඉන්නවා. ඒක නිසා මේ ක්‍රමවේදය පිළිබඳව යම්කිසි වෙනසක් කරන්න අපට කල්පනා කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒක නිසා ඔබතුමාගේ මාර්ගයෙන් මම විශේෂයෙන්ම ඉල්ලීමක් කරන්න කැමැතියි. මේක ඒකමතිකව ස්ථිවරම සම්මත වෙනවා. ඊළඟට එන ප්‍රශ්නය තමයි කෝ සල්ලි? ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කිව්වා පසුගිය කාලයේ රාජ්‍ය සේවයේ විවිධ අයට මෝටර් සයිකල් එක ගන්න උවමනා කරන මුදල් දුන්නා. ගෙනැල්ලා දුන්නා කියලා. දැන් ඒක තාවකාලිකව නතර වෙලා තිබෙනවා කියලා. මේ පළාත් සභාවේ දැන් ඕනෑතරම් සල්ලි තිබෙනවා නේ? පසුගිය කාලයේ ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉන්න කාලේ විදේශීය පුහුණු සංචාර යන්න මන්ත්‍රීවරුන්ට කොපමණ සල්ලි වෙන් කෙරුවාද? දැන් අවුරුදු දෙකක වෙලේ ඉඳලා ඒවාත් නැහැ නේ? එහෙම නේද ගුණසිරි ජයනාත් සංවිධායකතුමා? මේ සභාවේ ඒ සල්ලි පවා ඉතුරු වෙන්න ඕනෑ. ඉතින් ඒක නිසා ඒවා හරි මූලික සංචිතයක් විධියට දාලා ආරම්භයක් හැටියට මේක ක්‍රියාත්මක කරන්න. විශාල පීඩනයක ඉන්න පිරිසක් ඉන්නවා. විශේෂයෙන්ම ගුරුවරුන්ගේ තත්ත්වය එදාට වඩා අද හොඳයි. ඒක මම කියන්න ඕනෑ. මොකද, මට මතක හැටියට අපේ අම්මා ඒ කාලේ පඩි අරගන්නේ රුපියල් 180 යි. ඒ කාලේ හොඳයි. ඊට පස්සේ මම 1981 මහජන බැංකුවේ සේවයට යනකොට මට පළමුවැනි පඩිය විධියට රුපියල් එක්දහස් නවසිය ගණනක් හම්බ වුණා. අපේ අම්මාට ඒ කාලේ එක්දහස් හාරසිය ගණනයි. නමුත් අද තත්ත්වය ඊට වැඩිය හුඟක් වෙනස්. අද ගුරුවරයෙක් ආරම්භයේ ඉඳලා රුපියල් 30,000 කට එහා වැටුපක් ගන්නවා. ඒක තමයි අපි දන්න තත්ත්වය. මම කියන්නේ නැහැ සෑහීමකට පත් වෙන්න ඒක හරියි කියලා. නමුත් ඔවුන්ට මේ දරුවන්ගේ

[ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ]

අධ්‍යාපනය කරන්න යහපත් මානසික තත්ත්වයක් තිබෙන්න ඕනෑ. බස්වල යන්න ගියාම, දුර යන්න ගියාම ඊළඟට හිතන්නේ, කොහොමද මේ පාසලෙන් ගැලවිලා යන්නේ කියලා. ඉස්සර කථා කෙරුවේ ගුරු දෙවිවරු කියලා. දැන් කොහොමද මේ තත්ත්වයට මුහුණ දීලා මේ දරුවන්ට යහපත් අධ්‍යාපනයක් ලබා දෙන්නේ? අද උදේ මම ප්‍රවෘත්ති පත්‍ර බලන කොට දැක්කා ඊයේ පෙරෙයිදා සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් වෙලා කියලා. ඉහළම ප්‍රතිඵල අරගෙන තිබෙන්නේ ප්‍රධාන නගරවල විද්‍යාලවල ඉගෙන ගන්න දරුවෝ. ගමේ ඉස්කෝල එකක්වත් නැහැ. මීගමුව මාරිස්ටෙලා එක. කොළඹ විශාකා එක. රාජකීය විද්‍යාලය. මේ වාගේ ප්‍රධාන පෙළේ විද්‍යාලවල දරුවෝ ටික තමයි ප්‍රතිඵල අරගෙන තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රාජකීය විද්‍යාලය නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

රාජකීය විද්‍යාලය නැහැ. සමාවෙන්න. ආනන්ද විද්‍යාලය. එතකොට මේ ප්‍රධාන විද්‍යාලවල තමයි මේක ගිහිල්ලා තිබෙන්නේ. ගම්වලත් සමත් වෙලා ඇති. නමුත් පසුගිය කාලයේ ගම්බද පාසල් ටික සීඝ්‍රයෙන් වැහිලා ගියා. මොකද, පළමුවැනි කාරණාව උගන්වන්න ගුරුවරු නැති නිසා. පහසුකම් නැති නිසා. එහෙම නිසා ළමුන් පාසලට ඇතුල් කළේ නැහැ. අනිවාර්යෙන්ම ළමුන් නැතිව ගියාම පාසල වහන්න සිද්ධ වුණා. ඒක තමයි පසුගිය පළාත් සභා කාලයේ අපි දැකපු සත්‍යය. ඒක නිසා මේ මූලික පහසුකම් ටික ලබා දෙනවා නම් මම හිතන්නේ, මේ තත්ත්වය උදා වෙන්නේ නැහැ. විශාල චෝදනාවක් ආවා. මධ්‍යම රජය ගැනත්. මම එකක් කියන්න ඕනෑ. මම දන්නේ නැහැ අනෙක් කොට්ඨාශවලට කොහොම වුණාද කියලා. වත්තල කොට්ඨාශයේ තිබෙන පාසල් 23 න් වැසිකිළි, කැසිකිළි නැති එහෙම නැත්නම් එවා වැඩි දියුණු කරන්න මධ්‍යම රජයේ අධ්‍යාපන ඇමැතිවරයාගෙන් අපි ඉල්ලීමක් කළා. ගරු ජෝන් අමරතුංග ඇමැතිතුමා. පාසල් 23 ටම ලක්ෂ 08 ගාණේ වෙන් කරලා දුන්නා. මේ පළාත් සභාව හරහා. ඒක නිසා එහෙම චෝදනා කිරීමක් මම හිතන්නේ සත්‍ය නැහැ. මේක තියෙන්නේ සංහිඳියාවක් ඇතුව ඔක්කෝම එකට එකතු වෙලා කථා කරන්න ඕනෑ. කථා කරලා ගරු ප්‍රධාන ඇමැතිවරු ටික, අධ්‍යාපන ඇමැතිවරු ටික, රේඛීය අමාත්‍යාංශයට - මොකද, ඉස්සර තිබුණේ එහෙම නේ? දැන් මීට අවුරුදු ගණනකට කලින් තිබුණේ පළාත් සභාව එක පැත්තක. මධ්‍යම රජයත් ඒ පැත්තේමයි. ජනාධිපතිතුමාත් ඒ පැත්තේමයි. පළාත් පාලන ආයතන එහෙමයි. ඒක නිසා මේක එක විධියකට ඔහේ ගියා. දැන් එහෙම නැහැ. තත්ත්වය තේරෙනවා නේ? පළාත් සභා ටික එක පැත්තක. මධ්‍යම රජය එක පැත්තක. ජනාධිපතිතුමාත් ඉන්නවා. ඒක නිසා මේක සාකච්ඡාවෙන් විසඳන්න පුළුවන් දෙයක්. හැබැයි මේ ප්‍රශ්න ගමට, ගමේ ඉන්න පාක්ෂිකයින්ට, සාමාන්‍ය ජනතාවට, ගුරුවරුන්ට, සිසු දරුවන්ට ඒ අය තුළට ගලාගෙන යන්න ඉඩ තියන්න එපා. ඒක නිසා මේ ඉල්ලීම කරනවා. කරුණාකරලා මේ සභාවේ සල්ලි අනවර්ථයෙන් වියදම් කරන්නේ නැතුව යම්කිසි ඵලදායී දෙයකට යොදවන්න.

මේ පළාත් සභා ක්‍රමය ඇති කළේ ඇයි? පළාත් සභා ක්‍රමය ඇති කරලා, පළාත් පාලන ආයතන ටික දුන්නේ, පළාත් පාසල් කියලා වෙන් කරලා දුන්නේ, පළාත් රෝහල් කියලා වෙන් කරලා දුන්නේ පළාත් සභාව විසින් ඒවා පෝෂණය කරන්නයි. ඒවා නඟා සිටුවන්නයි. ඉතින් ඒක නිසා මම හිතන්නේ හොඳම අවස්ථාව තමයි මේ අවස්ථාව. ආරම්භයක් විධියට පසුගිය දේවල් අමතක කරලා - ඒවා නොකෙරුණත් කමක් නැහැ. ගුරුවරුන්ගේ මානසික තත්ත්වය, ආර්ථික තත්ත්වය නඟා සිටුවන්න, ඔවුන්ට පහසුවෙන් පාසලට යන්න, මේක වතු පාසල්වලට විතරක් සීමා කරන්නේ නැතුව මම කිව්වා වාගේ මුහුදුබඩ ප්‍රදේශයේ ඉන්න දුප්පත් දරුවෝ, ධීවර දරුවන්ගේ අධ්‍යාපනය උසස් කරන්න, ඒ පාසල්වලට ගුරුවරු දෙන්න - අද මේ බස්නාහිර පළාත් සභාව ඇතුළේ ගම්පහ දිස්ත්‍රික්කයේ ගුරුවරුන්ගේ ඌණතාවය තිබෙන ප්‍රධානම කලාපය බවට මීගමුව අධ්‍යාපන කලාපය පත් වෙලා තිබෙනවා. ඇයි එහෙම වෙන්නේ? එහෙම වෙන්නේ දාන ගුරුවරු යන්නේ නැති නිසා. ඒක නිසා මේ නීතිරීති සකස් කරන කොට ඔබතුමාගේ මාර්ගයෙන් මම ඉල්ලනවා, අමාත්‍ය මණ්ඩලය සාකච්ඡා කරලා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් වුණාම ඒකට ප්‍රමුඛතාවය දෙන්න. එතකොට අපට පොඩි තෘප්තියක් හරි ඇති වෙනවා. මේ පළාත් සභාව පෝෂණය කරලා, මේ පළාත් සභාව විසින් ඇති කරපු අධ්‍යාපන

ක්‍රමයක්. ගුරුවරුන්ගේ ආර්ථික තත්ත්වය යම්කිසි මට්ටමකට අපි ගෙන ආවා කියලා.

එහෙම නම් මම මීට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. විශේෂයෙන්ම ඔබතුමාගේ මාර්ගයෙන් මම ඉල්ලන්නේ අර පරණ කරපු යෝජනා හමස් පෙට්ටියට ගියා වාගේ නැවත වතාවක් මේ යෝජනා හමස් පෙට්ටියට යන්න දෙන්නේ නැතුව පළාත් සභාව මාර්ගයෙන් මේ යෝජනා ක්‍රියාත්මක කරන්න. විශේෂයෙන්ම අපි දන්නේ නැහැ,පළාත් සභාවේ අධ්‍යාපන ඇමැතිතුමා අසනීප තත්ත්වයේ ඉන්නවාද කියලා. හැබැයි මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. දැන් බලන්න 2016 දෙවැනි වාරයත් පටන් ගන්න යනවා. හෙට අනිද්දාට පළමුවැනි වාරය අවසන්. තවම දරුවෝ ටික පාසල්වලට දාගන්න බැරුව ඉන්නවා. අපට ලැයිස්තුව හදා ගන්න බැරුව. මේක මහ ඛේදවාචකයක්. මේක කියන්න ඕනෑ. මේ පළාත් සභාවේ ප්‍රධාන ඇමැතිතුමා හැටියට ඉසුර දේවප්‍රිය මැතිතුමා පත් වනකොට කියලා තිබුණා, ජනවාරි මාසේ දිනයක් දීලා - මට දිනය මතක නැහැ. එදාට කලින් මේ පාසල්වලට දරුවන් ඇතුළත් කිරීමේ ප්‍රශ්නය අවසන් කරනවා කියලා. කොහොම වුණත් එතුමාට අධ්‍යාපන ඇමැතිකම හම්බ වුණේ නැති නිසා එතුමා දැන් එක පැත්තක. මේක මේ ඇමැතිවරු අතර ගස්ඨනයක් නොවෙයි. හොඳට මතක තියාගන්න මෙහෙම කථා කරන කොට - අපි නොවෙයි මේ පළාත් සභාවේ ආණ්ඩු පක්ෂය. ඔය පැත්තේ වාඩි වෙලා ඉන්න ඔක්කෝම. ඒක මහින්ද මහත්තයාගේ වෙච්චා. ඒක මෛත්‍රීපාල මහත්තයාගේ වෙච්චා. වෙන කාගේ හරි වෙච්චා. එක්සත් ජාතික පක්ෂයේ පළාත් සභාව නොවෙයි. ඒක හොඳට මතක තියා ගන්න. ඒක නිසා මම ඉල්ලනවා, මේ ප්‍රශ්නය විසඳන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමන්ලා Budget එක -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ පළාත් සභාවේ අපි කථා කරන්නේ නැත්තේ ඔය ප්‍රශ්නය නිසා තමයි. අද මේ කථා කරන්නේ මෙතුමාට ගෞරවය කිරීමක් විධියටත්, අනෙක් එක මේ පළාත් සභාවට උචිත යෝජනාවක් ඉදිරිපත් කරපු නිසාත්. ඒක නිසා ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලන්නේ. මේවා අමාත්‍ය මණ්ඩලය කථා කරලා විසඳන්න පුළුවන් ප්‍රශ්න. මේවා මේ සභාවේ විසඳන්න පුළුවන් ප්‍රශ්න. ඉතින් ඒක නිසා ඒ යෝජනාවට නිසි තැන දීලා, නිසි ගෞරවය දීලා ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

[ පූ.භා. 11.19 ]

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මන්ත්‍රීවරු හුඟක් දෙනෙක් කථා කළා වාගේම මටත් කියන්න තියෙන්නේ හොඳ මාතෘකාවක් නිසා කථා කරනවා මිසක් අපේ සභාවේ මේ විධියට පෞද්ගලික මන්ත්‍රීවරු ඉදිරිපත් කරන යෝජනා සාකච්ඡා කරලා ප්‍රතිඵලයකට ගිය දවසක් නම් අපි සාමාන්‍යයෙන් අහලා නැහැ. අධ්‍යාපනයට සම්බන්ධ මෙබඳු යෝජනා ගණනාවක් මීට ඉහත මන්ත්‍රීවරු ඉදිරිපත් කරලා සාකච්ඡා කරලා ඒකමතිකව සම්මතයට පත් වුණා. නමුත් ඒවා සම්මත වුණා විතරයි. කිසිම ක්‍රියා මාර්ගයක් නැහැ. ඒ නිසා කලකිරීමෙන් වුණත් මේ යෝජනාව හොඳ නිසා වචනයක් කථා කරන්න කල්පනා කෙරුවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඇයි අපේ හාමුදුරුවනේ අපි දහම් පාසල් සම්බන්ධව කථා කළේ.

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

කථා කළා. කථාව විතරයි. මුකුත් වුණේ නැහැ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාව ඉතාමත්ම කාලෝචිත හොඳ යෝජනාවක් කියන එක මතක් කරනවා. ඒත් එක්ක මම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට මතක් කරනවා මේ යෝජනාව වතු පාසල් සඳහා පමණක් සීමා කරන්නේ නැතුව අනෙකුත් පාසල් සඳහාත් අදාළ කරන විධියට මේක සංශෝධනය කරන්න පුළුවන් නම් හොඳයි කියලා. මොකද, අපි ජීවත් වෙන්නේ කළුතර දිස්ත්‍රික්කයේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා දන්නවා කළුතර දිස්ත්‍රික්කයේ දුෂ්කරම ආසන තමයි බුලත්සිංහල ආසනය, ඒ වාගේම මතුගම ආසනයේ ඇතැම් කොටස්, විශේෂයෙන්ම අගලවත්ත ආසනය, පාලින්දනුවර, වලල්ලාවිට වාගේ කොට්ඨාශවල ගත්තාම මේ වතු පාසල් නොවෙයි. සාමාන්‍ය රජයේ පාසල් විශාල ප්‍රමාණයක්

[ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා ]

තිබෙනවා. ඒ ගුරුවරුන්ට පාසල කරා යන්න අවශ්‍ය කරන පොදු ප්‍රවාහන පහසුකම් නොමැති ප්‍රදේශවල තිබෙන පාසල් රාශියක් තිබෙනවා. ඉතින් ඒ නිසා ඒ හැම පාසලකම ගුරුවරු දැඩි දුෂ්කරතා මධ්‍යයේ තමයි තමන්ගේ පාසලට යන්නේ. විශේෂයෙන් අධ්‍යාපනය දෙන්න පාසලට යන්න ගුරුවරුන්ට නිසි වෙලාවට පාසලට යා ගන්න බැරි නම්, පයින් ගිහිල්ලා වෙහෙස මහන්සි වෙලා පාසලට යන්න වෙනවා නම්, වෙනත් දුෂ්කරතා විඳගෙන, නැත්නම් ත්‍රීවීල් එකක් අරගෙන, එහෙම නැත්නම් පාරේ යන වාහනයකට අත දාලා නවත්වාගෙන ඒ විධියට පාසලට යන්න වෙනවා නම්, ඒ ගුරුවරයා කායික වශයෙන් වාගේම මානසික වශයෙනුත් විශාල අසහනයකට පත් වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එබඳු තත්ත්වයක් තුළ ගිහිල්ලා දරුවන්ට අවශ්‍ය කරන නිසි අධ්‍යාපනය ලබා දෙන්න ඒ ගුරුවරයාට පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. ඒ නිසා වතු පාසල් සැහෙන ප්‍රමාණයකට මේ දුෂ්කරතාවය තිබෙනවා කියන එක මම දන්නවා. නමුත් ඊට අමතරව අපේ සාමාන්‍ය සිංහල ජනතාව ජීවත් වන රජයේ පාසල් තිබෙන ප්‍රදේශ තිබෙනවා. පොදු ප්‍රවාහන පහසුකම් නැති, දුෂ්කර ප්‍රදේශ. කළුතර දිස්ත්‍රික්කයේ මම ඔය කියපු ප්‍රදේශවල ඒක ඉතාමත්ම තදින් තිබෙනවා. ඒ නිසා ඔබතුමා හරහා අපි මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට යෝජනා කරනවා,පුළුවන් නම් මේ යෝජනාව සංශෝධනය කරන්න. වතු පාසල් සඳහා පමණක් නොවෙයි. අනෙකුත් දුෂ්කර පාසල්වල ජීවත් වන ගුරුවරුන්ට යතුරු පැදි ලබා දීම සඳහා අවශ්‍ය කරන පහසුකම් සැලසීම කියන විධියට සංශෝධනය කර ගන්නවා නම් හොඳයි කියන යෝජනාව මම මේ වෙලාවේ ඉදිරිපත් කරනවා.

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වතු පාසල් දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව අපි දන්නවා මීට අවුරුදු 15 කට 20 කට එහා පැත්තේ කාලේ ගත්තාම - දැන් මම ජීවත් වෙන්නේ සම්පූර්ණයෙන්ම මුළු වටේම වතු ගම්මාන සහිත ප්‍රදේශයක. එතකොට අපට හැමදාම ඇහැට පේනවා වතු පාසල්වලට ඒ කාලේ දරුවන්ගේ භිහයක් තිබුණා. මොකද, වත්තේ වැඩ කරන විශේෂයෙන් ද්‍රවිඩ ජනතාව, ඒ අම්මලා තාත්තලා වත්තේ වැඩට යනකොට තමන්ගේ දරුවෝ පොඩි වුන් එකා දෙන්නා පිටිපස්සෙන් එක්කරගෙන යනවා. තේ වතුර බෝතලය අරගෙන එක්කෙනෙක් යනවා. ඔට්ටුපාළු බාල්දිය අරගෙන එක්කෙනෙක් යනවා. එහෙම ගලෙන් ගලට පැන පැන අම්මලා තාත්තලා පස්සෙන් තමයි ඇවිද්දේ. අද මේ තත්ත්වය, බොහෝ දුරට ඒ පරිසරය තුළ වෙනස් වෙලා තිබෙනවා. මොකද, ඒ දෙමව්පියෝ අද තේරුම් අරගෙන තිබෙනවා ලැයිම් කාමරයට වෙලා, වත්තේ රස්සාව කරගෙන ජීවත් වුණු ඒ අයට, ඊළඟ පරම්පරාවටත් ඒ තත්ත්වයම උරුම කරලා දීම සුදුසු නැහැයි කියන එක. පහසුකම් යම් ප්‍රමාණයකට සැලසිලා තිබෙන තත්ත්වය තුළ, අද වතු පාසල්වල සැහෙන ශිෂ්‍ය සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබනවා. එතකොට එදා වාගේ දෙමව්පියෝ පස්සේ වත්තේ ඇවිදගෙන ගිය දරුවෝ අද දකින්න නැහැ. අධ්‍යාපනයේ තිබෙන වටිනාකම දැනගෙන අද හුඟක් දෙනෙක් අධ්‍යාපනයට නැඹුරු වෙලා තිබෙනවා. වතුකරයේ ජීවත් වන ජනතාවගේ දරුවෝ. ඇත්තටම ඒක සන්තෝෂයට කාරණයක්. හුඟක් වෙලාවට ඒ කාලේ අහලා තිබුණේ, ගම්මානවල නොයෙක් විධියේ අයගේ කුලී වැඩ කරමින් ජීවත්වීම තමයි සාමාන්‍යයෙන් වතු ජනතාවට උරුම වෙලා තිබුණු ජීවිතය. අද ඒ තත්ත්වය වෙනස් වෙලා. අද හොඳට පාසල් නිල ඇඳුම ඇඳලා හොඳට පාසල් යන දරුවෝ අපට වතු පාසල් හරහා දකින්න පුළුවන්. ඒ වාගේම තමයි ඒ අධ්‍යාපනය ලබලා, උසස් විභාගවලින් සමත් වෙලා අද සමාජයේ වගකිව යුතු තැන්වලට එන්න ඔවුන්ට අවස්ථාව ලැබිලා තිබෙනවා.

ඒ නිසා වතු පාසල් අධ්‍යාපනය පිළිබඳව විශේෂ අවධානයක් යොමු විය යුතුව තිබෙනවා. ඒ යොමු වීම අපේ රටේ ඉදිරි අනාගතයේ පැවැත්මට ඉතාමත්ම හොඳ කාරණයක් හැටියට අපි දකිනවා. විශේෂයෙන් මම ජීවත් වන කොට්ඨාශයේ දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය, දොඩංගොඩ කොට්ඨාශ අධ්‍යාපන බල ප්‍රදේශයේ වතු පාසල් 06 ක් තිබෙනවා. මගේ කොට්ඨාශයේ. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන එකම නවෝදයා දෙමළ විද්‍යාලය තිබෙන්නේ, මගේ කොට්ඨාශයේ. දොඩංගොඩ. කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන එකම දෙමළ නවෝදයා විද්‍යාලය. මේ පාසලට ලැබෙන පහසුකම් ප්‍රමාණය හොඳටම මදි. මේ අවුරුද්දේ මුල් කාලයේ දීපවාලි උත්සවය මුල් කරගෙන රජයෙන් යම් වැඩ පිළිවෙළක් කෙරුවා. ඒකේදී ජනාධිපතිතුමා ගිහිල්ලා වතු පාසලක උත්සවයක් පැවැත් වූවා. ඒ පාසලට ඒ හරහා හුඟක් පහසුකම් ලැබුණා. ඇත්ත වශයෙන්ම ඒ පහසුකම් ලැබිය යුතු පාසලට නොවෙයි, ඒවා ලැබුණේ. ඒක දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු හරි, දිස්ත්‍රික්කයේ අධ්‍යාපන බලධාරීන් හරි කිසි කෙනෙක් දන්නේ නැහැ. ඒ පාසල ඇයි තේරුවේ කියන

එක. ඒක ඉහළින් තෝරලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම ඒ අවස්ථාව ලැබිය යුතුව තිබුණේ - මම කලින් කියපු ක්ලෝඩන් දෙමළ විද්‍යාලය තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන එකම නවෝද්‍යා දෙමළ විද්‍යාලය. ඒකට අවශ්‍ය පහසුකම් නැහැ. විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉන්නවා. ඒ අවස්ථාව ලැබිය යුතුව තිබුණේ ඒ පාසලට. නමුත් ඒක ලැබුණේ නැහැ. ඒ වාගේ ලැබෙන්න තිබෙන පහසුකම් පිළිබඳව විවිධ අසාධාරණකම් මේ පාසල්වලට වන අවස්ථා අපට හුඟක් වෙලාවට දකින්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා විශේෂයෙන් වතු පාසල් පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම වැදගත්. ඒ පාසල්වල අධ්‍යාපනය දියුණු කිරීම සඳහා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාව ඉතාමත්ම වැදගත්. මොකද, ගුරුවරුට අවශ්‍ය වෙලාවට ඒ පාසලට යන්න ඔවුන්ට ඒ පහසුකම තිබෙන්න ඕනෑ. මම මේ කථා කරපු ක්ලෝඩන් දෙමළ විද්‍යාලයට යන්න තිබෙන එකම මාර්ගයේ පාලමත් කඩලා. ගත වුණු මාස තුනේ වාහනවලටවත් යන්න බැහැ. ගුරුවරු ගියේ, පෞද්ගලික වියදමින් ත්‍රිවිලර් අරගෙන. එහෙම නැත්නම් කාගේ හරි යතුරු පැදියක නැඟලා, අත දාලා වාහනයක නැඟලා. ඒ විධියට ගියේ. ඒ කාල සීමාව තුළදී ඒ පාසලේ අධ්‍යාපනය සෑහෙන දුරට අඩාල වුණා කියන එක විදුහල්පතිතුමා අපිත් එක්ක මතක් කළා.

අන්න ඒ වාගේ දුෂ්කරතා මතු වන අවස්ථා තිබෙනවා. ඒ නිසා යතුරු පැදියක් ගුරුවරුන්ට ලැබෙනවා නම්, ඒක ඉතාමත්ම වැදගත් කියන කාරණය විශේෂයෙන්ම අපි මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ. මොකද, වතු පාසල් තිබෙන්නේ හැම තිස්සේම දුෂ්කර ප්‍රදේශවල. සමහර විට වත්තක මැද ප්‍රදේශයේ. ඒ අහලකින්වත් පොදු ප්‍රවාහන පහසුකමක් සැලසෙන්නේ නැහැ. අන්න ඒ නිසා මෙතුමා ඉදිරිපත් කරපු යෝජනාව කාලෝචිතයි. මම මුලින් මතක් කළ පරිදි වතු පාසල් වාගේම කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත, බුලත්සිංහල වාගේ ප්‍රදේශවල සිංහල පාසල් තිබෙනවා. රජයේ සාමාන්‍ය පාසල් තිබෙනවා. වතු පාසල් වාගේම අතිශයින්ම දුෂ්කර පාසල්. ගමනාගමන පහසුකම්, පොදු ප්‍රවාහන පහසුකම් නොමැති. ඒ නිසා ඒ යෝජනාව සංශෝධනය කර ගන්න පුළුවන් නම් හොඳයි. එහෙම කරගෙන මේ දුෂ්කර ප්‍රදේශවල පොදු ප්‍රවාහන පහසුකම් නොමැති පාසල්වලට යන ගුරුවරුන්ට යතුරු පැදි ලබා දීමේ යෝජනාව ඉතාමත් කාලෝචිත, හොඳ යෝජනාවක් බව මතක් කරමින්, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව අපේ ප්‍රශංසාව හිමි කරමින් මේ යොජනාව හැම කෙනෙකුගේම කැමැත්තෙන් සම්මත වෙයි කියන බලාපොරොත්තුවත් ඇති කරගෙන මගේ වචන ස්වල්පය අවසන් කරනවා. හැම දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේ සභාවේ ගණපූරණය නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා සීනුව නාද කරන්න.

සභාවේ ගණපූර්ණය සම්පූර්ණ නොවූ බැවින් මම දැන් මෙම සභාව විනාඩි 10 කට තාවකාලිකව අත්හිටුවනවා.

***ඊට අනුකූලව පූ.භා. 11.28 ට සභාවේ ගණපූරණය නොවූ බැවින් ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.51 ට යළිත් රැස් විය.***

*The Provincial Council sitting was suspended at 11.28 a.m. by the Hon. Deputy Chairman as there was no quorum in the Council, and resumed at 11.51 a.m.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයත් තිබෙනවා.

[ පූ.භා. 11.51 ]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම කාලෙකට පස්සේ හොඳ යෝජනාවක් සාකච්ඡා කරන්න අවස්ථාව ලැබුණා. ඒකත් කිසියම් බාධා කිරීම් මැද්දේ යන බවක් තමයි පේන්නේ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

හෙළ උරුමයෙන් කඩාකප්පල්කාරී ක්‍රියාවක්. පත්තරේට වාර්තා කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

එහෙම්ම කියන එක හරි නැහැ. රීතිවල අයිතියක් තිබෙනවා. නමුත් කොහොම වුණත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සාකච්ඡාවට සම්බන්ධ වීමේදී -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා බාධා කරන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මන්ත්‍රීතුමා අර සංදීප්ට වුණු දේ වෙයි. වැඩිය කථා කරන්න එපා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉතාමත් වැදගත් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. එතකොට ඒකේදී මමත් සංශෝධනයක් කරන්න තමයි බලාපොරොත්තුවෙන් හිටියේ. ඒක එතුමාම සංශෝධනය කළා. වතු පාසල් කියන වචනය වෙනුවට දුෂ්කර පාසල් කියන අදහසින් මම මේ සංවාදයට එකතු වෙන්නේ. දැන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභාවේ මේ ප්‍රශ්නය අළුත් ආණ්ඩුව තුළ නොවෙයි. පසුගිය අවුරුදු විසි ගණනක ඉතිහාසය ඇතුළේ පළාත් සභාවේ මේ ප්‍රශ්නය මෙහෙම්ම උඩු දුවමින් පැවතුණු කාරණයක්. මේ කාරණයට වරින් වර, වරින් වර මහ ඇමැතිවරු විවිධ පන්නයේ උත්තර ගෙන ආවා. මොකක්ද තිබෙන ප්‍රශ්නය? වතුවල විතරක් නොවෙයි. මම දන්නවා කඩුවෙල නගර මධ්‍යයේ, සමහර ගම් ඇතුළේ තිබෙන පාසල්. මෙතුමාත් ඡන්ද කාලයට කඩුවෙල ආසනයට ඇවිල්ලා මනාප සෙවීමේ කටයුතු කරනවා. ඒ නිසා එතුමා දන්නවා කඩුවෙල සම්බන්ධව. කඩුවෙල නගරයට කිලෝ මීටර් දෙකක් මෙහායින් තිබෙන්නේ හේවාගම. හේමාගම ඉස්කෝලේ තිබෙන්නේ Highway එකට පොඩ්ඩක් ඇතුල් වෙලා යන්න තිබෙන පාරේ. ඒ පාරේ බස් එකක් යන්නේ නැහැ. එතකොට හේවාගම ඉස්කෝලයට දරුවෝ ඇතුළත් කරන්නෙත් නැහැ. ළමයින් ඉතාමත් අඩු මට්ටමින් ඉන්න පාසලක්. ඒක වහන්නෙත් නැහැ. වැහෙන්නෙත් නැහැ. ඔහේ පවත්වාගෙන යනවා. ඒක ඇතුළට සමහර වෙලාවට ගුරුවරු යන්නේ 07.30 ට නොවෙයි. 08.30, 09.30 වෙනවා. මොකද, පයින් යන්න තිබෙන්නේ. ඉතින් දුෂ්කර පාසල් හැටියට මෙවැනි පාසල් තෝරාගෙන - අපේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාත් කිව්වා එතුමාගේ ප්‍රදේශයේ තිබෙන එවැනිම පාසල් පිළිබඳව. ඉතින් මෙවැනි පාසල් ගණනාවක් මේ රටේ තිබෙනවා. මේ පළාතේ තිබෙනවා. ඒකෙන් විශේෂ කාරණයක් තමයි මෙතුමා ඉදිරිපත් කරපු වතුවල ඉන්න පුරවැසියන්ගේ දරුවන්ට යන්න තිබෙන පාසල්වලට දරුවා වෙලාවට පාසලට ගියත්, ගුරුවරයාට වෙලාවට යන්න බැහැ. දැන් මේ විධියට අමාරුවෙන් අධ්‍යාපනය හදාරපු දරුවෝ රටේ වැදගත් තැන්වලට ගිහිල්ලා ඉන්නවා.

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා දන්නවා කුගන් එක්ක අතුරුදහන් වුණු ලලිත්. එතකොට මේ ලලිත් වතු පාසලක ඉගෙන ගත්තු දරුවෙක්. ඔහු අපේ දේශපාලනයට එකතු වුණා. පසුව ඔහු උතුරු පළාතේ දේශපාලන කටයුතුවල නියැලුනා. ඔහුට දෙමළ භාෂාව හොඳින් හසුරුවන්න පුළුවන් නිසා. ඔහු අතුරුදහන් වුණා. තවමත් ඒ අතුරුදහන් වුණු ආකාරය, ඔහු ජීවතුන් අතර ඉන්නවාද නැද්ද කියන ඒ අයිතිය ලබා දෙන්න, දෙමව්පියන් හැඩූ කඳුලෙන් ජීවත් වෙනවා. එවැනි තත්ත්වයට පත් වුණු දරුවෝ ඒ. අමාරුවෙන් ඉගෙන ගත්තු දරුවෝ. තවත් දරුවෝ මේ වතුවල දහස් ගණනක් ඉන්නවා. තවමත් ඔවුන්ට අවම පහසුකම් යටතේ ඉගෙන ගන්න උවමනාව තිබෙනවා. අද අපි දන්නවා, බොහෝ දෙමව්පියන්ට ඇති වෙලා තිබෙනවා, දරුවන්ට හොඳට උගන්වන්න. මේක තමයි එකම දේ. දරුවන්ට දෙන්න පුළුවන් උතුම්ම දේ. උපරිම දේ. අධ්‍යාපනය කියන දේ අද බොහෝ දෙමව්පියෝ වටහාගෙන ඉන්නවා. වතුකරයේ දරුවන්ටත් ඒ අයිතිය තිබෙනවා. ඒ දෙමව්පියන්ට ඒ උවමනාව තිබෙනවා. ඒ නිසාම ඔවුන් දරුවන්ව කෙසේ හෝ අමාරුවෙන් පාසලට යවනවා. ඒ පාසලට යවද්දී පසුගිය කාලයේ දරුවන්ට අවශ්‍ය පහසුකම් ටික කිසියම් මට්ටමකින් - විශේෂයෙන් පාසල් නිල ඇඳුම. ඒ දරුවාට එදා පන්ති කාමරය ඇතුළේදී ඒ නිල ඇඳුම ලබා ගන්න පුළුවන්කම තිබුණා. හැබැයි අද පාසල් නිල ඇඳුම ලබා ගන්න වවුචරයක් අරගෙන වතුකරයේ දරුවන්ගේ දෙමව්පියෝ යන්න ඕනෑ කිලෝ මීටර් 10, 15 එහාට. ඒ වවුචරය ගන්න. ඉතින් මෙවැනි දුෂ්කරතා මධ්‍යයේ වතුකරයේ ලැබෙන අවම වැටුප කප්පාදු කරගෙන ඒ දවසේ වවුචරය ගන්න ගියාට පස්සේ එයින්

ලැබෙන ලාභයක් නැහැ. ඒක සහනාධාරයක් හැටියට සලකන්න බැහැ. මොකද, දවසේ වැටුප කපාගෙන, ඒ වැටුප අත්හැරලා තමයි චවුචරය ගන්න යන්න වෙන්නේ. ඒ නිසා මේ අය චවුචරය ගන්න යන්නේ නැහැ. මොකද, අදාළ දින ගණන සඳහන් නොවුණොත් ඔවුන්ට වතුකරයේ ඒ දිරි දීමනා ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඔවුන්ට දවසේ කැප කිරීම කරන්න බැහැ. ඒ නිසා චවුචරය ලබා දීම හරහා අතිශයින්ම දුෂ්කර තත්ත්වයට පත් වෙලා තිබෙන්නේත් මෙවැනි පාසල්. අර ගුරුවරුන් පාසලට ඒම ප්‍රමාද වීම වාගේම මේ දරුවන්ගේ අනෙකුත් පහසුකම් ටිකත් කප්පාදු වෙමින් යනවා. ඒක සමස්ත පාසල් ප්‍රජාවටම බලපාන ප්‍රශ්නයක්. මම දන්නවා, සහනාධාර ක්‍රමය යටතේ පසුගිය කාලයේ ගුරුවරුන්ට යතුරු පැදි ලබා දීමේ ක්‍රමවේදයක් තිබුණා. ඒ යටතේ පොලිස් නිලධාරී මහත්වරුන්ට, තවත් රජයේ නිලධාරීන්ට - මම දන්නවා, තවමත් ඔය ප්‍රාදේශීය සභා, නගර සභා මන්ත්‍රීවරුන්ට යතුරු පැදියක් ලබා දීමට මුදල් බැඳපු මන්ත්‍රීවරු ඉන්නවා. ඒ මුදල් බැඳපු මන්ත්‍රීවරුන්ට ඒ මුදලත් නැහැ. යතුරු පැදිය තවමත් නැහැ. අද මේ ගෙනෙන යෝජනාව - මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගෙන් මම ඉල්ලනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වගකීමක් තිබෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අපි කිව්වා, අපි වග කියන්නේ නැහැ කියලා. එයා යවන්නත් ඕනැ. මෙයා එන එක ගැන අපි වග කියන්නෙත් නැහැයි කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා දන්නවා පසුගිය කාලයේ අධ්‍යාපනයේ මොන තරම් කප්පාදු වීම් සිදු වුණාද කියලා. ඒ කප්පාදුවීම් මැද්දේ දරුවෝ අමාරුවෙන් ඉගෙන ගත්තා. ඒ වාගේම අමාරුකම් මැද්දේ ඉගෙන ගත්තු දරුවන්ට අදාළ පහසුකම් ටික ලබා දීමට පළාත් සභාව හැටියට ගත්තු ක්‍රියා මාර්ගය මොකක්ද? ඔය කියන පාසල්වල ගොඩනැගිලි අලුතෙන් හැදුණාද? අලුතෙන් දියුණු වුණාද? පාරවල් ටික හැදුණාද? වෙනත් වෙනත් මන්ත්‍රීවරුන්ට කොන්ත්‍රාත් ලැබෙන, ලාභ ලැබෙන තැන්වල පාරවල් ටික තමයි සංවර්ධනය වුණේ. රොයිස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අහලා තිබුණා. මීගමුවේ පාරක් දාලා තිබුණා මිලියන 13 ක්. ලක්ෂ 130 ක්. අඩුම තරමින් එහෙම පාරක් ඒ පළාතේ නැහැ. එහෙම, හෝටලය ළඟින් යන පාරක් කියලා දාලා තිබුණේ. පසුගිය අයවැය විවාදයේදී ඉදිරිපත් කළේ. ලක්ෂ 130 ක් වතුරේ ගිහිල්ලා තිබෙනවා. වතුකරයේ දරුවන්ට මේ පහසුකම් දෙන්න පුළුවන් නේ?

එතකොට මහේෂ් අල්මේදා හිටපු ගරු ඇමැතිතුමා, දැන් මන්ත්‍රීතුමා එතුමන්ලා නිහඬව හිටියා,ඒ විෂයය භාර ඇමැතිවරුමීගමුවේ මිලියන ගණන් නාස්ති කරද්දී. ඒ විෂයය භාර ඇමැතිවරුන්ට විරුද්ධව අපි මේ පැත්තේ ඉඳගෙන විවේචනය කළා. අපට කැන්ටීන් එකට ගියාම පහර දෙන්න එනවා. මම මේක කලිනුත් කිව්වා. තේ එකක් බොන්න ගියාම අඩුම තරමින් තේ එකක් බොන්න ඉඩ දුන්නේ නැහැ. හැබැයි අද මිලියන 13 ක වංචාවක්. අඩුම තරමින් තේ එකක් බොන්න ඉඩ දුන්නේ නැහැ. හැබැයි අද මිලියන 130 ක වංචාවක් පිළිබඳ රොයිස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. එතකොට පළාත් සභාවේ මේ නාස්ති කරපු මුදල් ටික. අඩුම තරමින් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට බලයක් තිබුණු කාලයේ ලබා ගන්න උත්සාහ කළාද? නැහැ. ඒවාට නිහඬව සම්පූර්ණ සහයෝගය දුන්නා. නිහඬව බලාගෙන සිටියා. අපේ ආණ්ඩුවක්ද? ජේ.වී.පී. ආණ්ඩුවක් නොවෙයි තිබෙන්නේ. ජේ.වී.පී. ආණ්ඩුවක් අපි හදනවා. 2020 අපි ආණ්ඩුවක් හදනවා. එතකොට බලාගන්න මොකක්ද වෙන්නේ කියලා. (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ දැන් දෙක එකතු වෙලා ඉන්නේ. ඉතිහාසයේ පළමුවැනි වතාවට දැන් -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මේ සැරේ පස් දෙනයි. ඊළඟ සැරේ දෙන්නයි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

පක්ෂ දෙක එකතු වෙලා යන්නේ. ඒ එකතුව කියලා කියන්නේ ඊළඟට එන පුරප්පාඩුව - දැන් අලුත් විකල්පයක් අවශ්‍යයි. ඒ අලුත් විකල්පය තමයි ජනතා විමුක්ති පෙරමුණේ අපි. ඊළඟ ආණ්ඩුව හදන්නේ අපි. ඒ අවශ්‍ය සියලු වැඩ කටයුතු අපි දැන් සම්පූර්ණ කරගෙන යනවා. ඔබ දැක්කා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉස්සෙල්ලා ප්‍රාදේශීය සභාව හදාගන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ලංකාවේ පවත්වපු -

[සභාවේ ඝෝෂා]

පසුගිය දවස්වල පැවැත් වූවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ප්‍රාදේශීය සභාවක්, නගර සභාවක් හදාගන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

දහස් ගණනින් ජනතා විමුක්ති පෙරමුණට එකතු වුණා. ඒ එකතු වීම නවත්වන්න කාටවත් බැහැ. අන්න එදාට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉස්සෙල්ලා ප්‍රාදේශීය සභාවක්, නගර සභාවක් හදාගන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ප්‍රජාතන්ත්‍රවාදය පිළිගත්ත මන්ත්‍රීවරයෙක්. සමාජවාදය ගැන විශ්වාස කරන මන්ත්‍රීවරයෙක්. මම විශ්වාස කරනවා, සමාජවාදය තුළ තමයි උත්තර තිබෙන්නේ. අන්න ඒ උත්තර -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඩීල් කුමාර දිසානායක සනීපෙන්ද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාටත් අපත් සමඟ එකතු වෙලා මේ ප්‍රශ්නයට උත්තර සොයන්න පුළුවන්. මේ පක්ෂ දෙකටම උත්තර නැහැ. මේ වතු පාසල් දරුවන්ට විතරක් නොවෙයි. මේ පාසල් දරුවන්ට විතරක් නොවෙයි. (බාධා කිරීම්) මුළු සමාජ පරිහාණියටම උත්තර නැහැ. දෙක එකතු වෙලා -

[සභාවේ ඝෝෂා]

බැරි නම් මට දෙන්න කියලා හයිඩ් පාර්ක් එකේ කියලා තිබෙනවා මම දැක්කා. (බාධා කිරීම්) පුළුවන්කම තිබ්බා. අපි කිව්වා, ඉන්න කියලා. මැතිවරණ ගෙනෙන්න එපා කියලා.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ජාතික විධායක සභාවේ කිව්වේ නැද්ද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

දැන් මොනවද ගෑ වුණා වාගේ දඟලනවා. 2016 වනතුරු මේ රට හදන්න එතුමාට බලය දීලා තිබුණා,රටේ ජනතාව. දැන් මේ කම්මුලේ අත තියාගෙන මොකක්ද මේ වුණේ කියලා බලාගෙන ඉන්නවා. වෙන දේ අපි කලින් කිව්වා. ඡන්දය තියන්න එපා. මේ ටික ඉන්න. (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

දැන් ඉල්ලනවා මට දෙන්නය කියලා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු මන්ත්‍රීතුමා අමුඩේ කඩාගෙන කථා කරන්න එපා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

රටේ ජනතාවට පිස්සු නැහැ. මේ දෙකම එකට පරද්දන්න කාලය ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු මන්ත්‍රීතුමා අමුඬේ හදාගන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අපි මේ ජනතාව පෙළ ගස්සනවා. ඒ පෙළ ගැස්වීමේදී මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් අපත් එක්ක එකට එනවා. මේ වතු පාසල් දරුවන්ට - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි.

[ අ.භා. 12.02 ]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි. මම හිතන්නේ දීර්ඝ කාලයකට පස්සේ මේ යෝජනාවට අද සභාවේ අපට අදහස් ප්‍රකාශ කරන්න ලැබුණා. ඇත්තටම කාලෝචිත යෝජනාවක්. අපේ සියලුම දෙනාටම සම අයිතිවාසිකම්, හිමිකම් හිමියි කියන වැඩ පිළිවෙළ තුළ අපි දන්නවා, මේ දමිළ භාෂාව කථා කරන දමිළ ජනතාවත්, ඒ වාගේම මුස්ලිම් ජනතාවත් විශාල අඩුපාඩු ගොඩක් මධ්‍යයේ තමයි, විශේෂයෙන් බස්නාහිර පළාත් සභාව තුළ ඔවුන්ගේ පාසල් ක්‍රියාත්මක වෙන්නේ. බුලත්සිංහල ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයා හැටියට මම ඒ ගැන විශේෂයෙන්ම දන්නවා. බුලත්සිංහල ආසනයේ දමිළ පාසල් 09 ක් තිබෙනවා. ඒ වාගේම මුස්ලිම් පාසලක් තිබෙනවා. ඒ දමිළ පාසල් බහුතරයක්, දෙකක් හැර සියලු පාසල් පිහිටලා තිබෙන්නේ ඉතාමත් දුෂ්කර ප්‍රදේශවල. වතු ආශ්‍රිතව වතු මැද්දේ. යන්න ගමන් පහසුකම් නැහැ. බස් නැහැ. වෙනත් ක්‍රමවේද නැහැ. ඒ නිසා අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව ඉතාමත්ම ප්‍රායෝගිකයි. හැබැයි, මේක දෙමළ පාසල් විතරක් කියනවාට වඩා දුෂ්කර පාසල් කියලා සංශෝධනය වෙනවා නම් වඩාත් වැදගත් කියලා අපි දකිනවා. සමහර ප්‍රදේශවල භූමිය පිහිටලා තිබෙන ආකාරයත් එක්ක අතිදුෂ්කර පාසල් තිබෙනවා. අතිදුෂ්කර පාසල්වල සියලුම දෙනාට මෙවැනි පහසුකමක් දෙන්න පුළුවන් නම් ලොකු දෙයක්. මම හිතන්නේ එයට මොන විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙයිද දන්නේ නැහැ.

විශේෂයෙන්ම අපට මතකයි, 2015 ජනවාරි 08 වැනිදා ජනාධිපතිවරණයේදී, අපේ තිබුණු ආණ්ඩුව පරදින්න මෙන්න මේ යෝජනාව හා සමාන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා. සමහර නිලධාරීන්ට රජය මගින් රුපියල් 50,000 ට බයිසිකල් දෙන කොට, ඒ බයිසිකල් තව කොටසකට ලැබෙන්නේ නැති වෙන කොට, විශේෂයෙන්ම අපේ ගුරු වෘත්තියේ ඉන්න ගුරු මෑණිවරුන්ට, පියවරුන්ට ඒ සම්පත නොලැබුණු නිසා සමහර වේලාවට අලුත් ආණ්ඩුව ලබා දෙයි කියන පදනම මත වෙනස් ආකාරයට ඡන්දය පාවිච්චි කරපු අයත් ඉන්නවා. ගිය ආණ්ඩුව වෙනස් කරන්න. නමුත් මම හිතන්නේ අද ඒ 50,000 දීලා ගත්තු අයට 50,000 ත් ලැබුණේ නැහැ. මේ නොලැබුණු අයට ලැබුණෙත් නැහැ. නමුත් ඇත්තටම මේක විය යුතු කාරණාවක්. ගමේ සේවාවක් වෙනවා නම් කොටසක් හරි බලලා, අපි ඒ අයට බයිසිකලයක් දෙනවාට වඩා සමහර වේලාවට ඒ අයට යම්කිසි වෙනත් ක්‍රමවේදයකින් සමාන්‍යයෙන් රටේ ගන්න බදු අයින් කරලාවත් අඩුම ගණනේ එය දෙන්න පුළුවන් නම්, ඒ අය තමන්ගේ පඩියෙන් කැපෙන්න හරි මේ අවශ්‍යතාවය වෙනුවෙන් කටයුතු කරයි කියලයි මම විශ්වාස කරන්නේ. මේ වැඩ පිළිවෙළ අපි බස්නාහිර පළාත තුළ කථා කළාට මුළු ලංකාවටම මෙය සමස්ත වැඩ පිළිවෙළක් විය යුතුයි. බස්නාහිර පළාතට විතරක් සීමා විය යුතු නැහැ.

අද අපි විශේෂයෙන්ම දන්නවා. දමිළ කථා කරන අපේ දරුවන්ට මීටත් වඩා - ගුරුවරුන්ට දුෂ්කරතා තිබෙනවා වාගේම ගුරුවරුන් නොමැති කමින් ඒ දරුවන්ට අසාධාරණයක් වෙලා තිබෙනවා. අද උපාධිධාරීන් වතුවලින් බිහි වෙනවා අඩුයි. බිහි වෙනවා නම් බිහි වෙන්නේ නගරාසන්නයේ. කොළඹ වැනි ප්‍රදේශවල. කොළඹ වාගේ ප්‍රදේශවලින් බිහි වෙන උපාධිධාරීන් ගුරු වෘත්තියට ඇවිල්ලා මෙවැනි දුෂ්කර පළාත්වලට යන්න කටයුතු කරන්නේ නැහැ. ඒ අයත් මේ අවටම තමයි රාජකාරි කරන්නේ. එහෙමනම් මේ අයට අපි සේවා ශක්තියක් දෙනවා වාගේම මේ ගුරු වෘත්තියට දමිළ ජනතාවගේ දරුවන් වෙනුවෙන්, දමිළ කථා කරන දරුවන් වෙනුවෙන් ගුරු වෘත්තියට වෙනත් වැඩ පිළිවෙළක් බඳවා ගැනීම ක්‍රියාත්මක කළ යුතුයි. අඩුම ගණනේ

[ගරු ලලිත් වර්ණකුමාර ]

උසස් පෙළටවත් පෙනී හිටපු අයට මාස කිහිපයක හරි යම්කිසි පුහුණුවක් දීලා මේ කාර්යය කළේ නැත්නම් ගුරුවරුන්ට සලකනවා වෙනුවට ගුරුවරුන් නැතිකම ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙනවා. මොකද, ගුරුවරුන් නැතිව ගමේ දරුවාට උගන්වන්න බැහැ. ඒ නිසා ගමේ දරුවාට විභාග පාස් වෙලා කැම්පස් යන්න බැහැ. ආයේ ගුරුවරයෙක් නැති වෙනවා. මේක චක්‍රයක් වාගේ ගිහිල්ලා පස්සට එනවා. ඒ නිසා මේක ඉස්සරහාට යන්න නම් කොතැනින් හරි මේ ක්‍රමවේදය වෙනස් කරලා ඒකට ගැලපෙන යෝජනාවක් ගෙනැල්ලා ඒ තුළින් අපේ අරමුණට යන්න වෙනවා. නැත්නම් හැමදාමත් අපි ගුරුවරුන් බඳවා ගන්නේ උපාධිධාරීන්ගෙන් නම්, ඒ ප්‍රදේශවලින් උපාධිධාරීන් බිහි වෙන්නේ නැත්නම් කවදාවත් මේකට විසඳුමක් වෙන්නේ නැහැ. එහෙමනම් කොහෙන් හරි මේකට පොඩි වෙනසක් කරලා, මේ උසස් පෙළ සමත් දමිළ දුවා දරුවන්ට දීර්ඝකාලීන පුහුණුවකින් වුණත් කමක් නැහැ මේ කාර්යය කළ යුතුයි. ඒ කරන කොට මේ තිබෙන දුෂ්කරතාවලටත් කිසියම් සහයෝගයක් වෙනවා. මේ ඈත ඉඳලා එන අයට තමයි යන්න එන්න බැරි. එහෙම නැත්නම් ඒ ගමේම, ඒ වත්තේම, ඒ ප්‍රදේශයේම කෙනෙක් උපාධිධාරියෙක් හරි, උසස් පෙළ සමත් කෙනෙක් හරි ගුරුවරයෙක් බවට පත් කළොත් මම හිතන්නේ, මේ වැඩ පිළිවෙළට විසඳුමක් හැටියට අපි දකිනවා. ළඟ කෙනෙක්, පයින් යන්න පුළුවන් කෙනෙක්, ඒ අවට කෙනෙක් - ගුරුවරයෙක් නැතිකම නිසා තමයි දුරින් එන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ කාරණාවට ඇත්තටම අපි මීටත් එහා ගිහිල්ලා මේ බඳවා ගැනීම් පටිපාටිය වෙනස් කරලා කළ යුතු කාරණාවක්.

ඒ වාගේම මම විශේෂයෙන් මතක් කරනවා. අධ්‍යාපනය ගැන කියනවා වාගේම ගුරු ක්ෂේත්‍රයේ මේ බඳවා ගැනීම් පටිපාටිය තුළත් අර රෝහල්වල නර්ස්ලා බඳවා ගන්නා පටිපාටියක් තිබෙනවා. කාන්තා පාර්ශවය මෙච්චරයි. පිරිමි පාර්ශවය මෙච්චරයි කියලා. අන්න ඒ වාගේම වෙනත් වැඩ පිළිවෙළක්, සමාන ලකුණක් නැතිව මේ ගුරු ක්ෂේත්‍රයට පිරිමි අයව බඳවා ගන්නත් මොකක් හරි වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. මේ දුෂ්කර දමිළ පාසල් විතරක් නොවෙයි, දුෂ්කර සිංහල පාසල්වලටත් යන්න සමහර වේලාවට බයිසිකලයක්වත් නැතිව ගුරුවරයෙකුට යන්න පුළුවන්කමක් නැහැ. පිරිමි ගුරුවරයෙක් ඉන්නවා නම්, ඒ සේවය වැඩියෙන් වෙනවා. සමහර තැන්වල කාන්තා ගුරුවරයෙකුට යන්න පුළුවන් තැනක නොවෙයි සමහර පාසල් පිහිටලා තිබෙන්නේ. දුෂ්කරතාවයත් එක්ක. ඒ ප්‍රදේශත් එක්ක. ඒ නිසා එහෙම වැඩ පිළිවෙළකුත් මෙයට සමාන්තරව ක්‍රියාත්මක විය යුතුයි. එතකොට ගොඩක් බාධක අඩු වෙනවා කියන එක ඇත්තටම මම මතක් කරන්න ඕනෑ.

මොකද, විශේෂයෙන්ම බුලත්සිංහල කියලා ගත්තොත් අපට මතකයි, දැන් මීට අවුරුදු 02 කට ඉස්සෙල්ලා දමිළ මාධ්‍යයට කියලා වෙනම මුදල් ප්‍රතිපාදනයක් පළාත් සභාවට ආවා. ගිය අවුරුද්දේ සිට ඒ මුදල් ප්‍රතිපාදන නැහැ. ඒවායින් දමිළ පාසල්වලට විතරයි වියදම් කරන්න පුළුවන්. ඒ තුළින් අපි දමිළ පාසල්වල භෞතික දියුණුව වෙනුවෙන් විශාල වැඩ කොටසක් දිගින් දිගට කළා. මොකද, හොරණ කලාපයේ තිබෙන සියලුම දමිළ පාසල්වලට සමානව බෙදලා, එහෙම නැත්නම් ලබන අවුරුද්දට මේකට දෙන්නම්. මේ අවුරුද්දේ ගොඩනැගිල්ල නම් අවශ්‍ය, අපි ඒ ගැන සාකච්ඡා කරලා ලොකු වැඩ පිළිවෙළවල් ටිකක් කළා. අද පළාත් සභාව තුළින් හෝ මධ්‍යම රජය තුළින් ඒක නොලැබෙන එකත් ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මම දන්නේ නැහැ, ඇයි එහෙම වෙලා තිබෙන්නේ කියලා.

අද විශේෂයෙන්ම නිල ඇඳුම් දෙන කොට එකම පන්තියේ ඉන්න ජාතීන් අතර ගණන වෙනස් කරලා දෙනවා නම්, මේක නොවෙන හේතුවක් මම දන්නේ නැහැ. එකම ඇඳුමට, එක ජාතියකට එක මුදලක්. තව ජාතියේ කෙනෙකුට තව මුදලක්. මුදල එකම පන්තියේ ඉන්න ළමයින්ට වෙනස් වෙනවා නම් දමිළ මාධ්‍ය පාසල්වලට විතරක් වෙන් වුණු මුදලට මොකද වුණේ කියන එක ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මේ තරම් සාධාරණීකරණය වෙනවා නම් මේ ගැනත් මීට එහා බැලිය යුතුයි. අවුරුදු කීපයක් තිස්සේ, මම පළාත් සභාවට පත් වෙලා අවුරුදු හයේම මේ මුදල ආවා. අපි හරි ලස්සනට දුෂ්කර පාසල් ටික ගොඩනගාගෙන ආවා. ඒ වැඩ පිළිවෙළ තුළ නොවෙන වැඩ පිළිවෙළ මොකක්ද කියන එකත් අපි පළාත් සභාව හැටියට සොයා බැලිය යුතුමයි. ඒක අපේ වගකීමක්. ඒ කාරණාව වාගේම විශේෂයෙන්ම අපේ අද බුලත්සිංහල ආසනය තුළ ගත්තොත්, සමහර වේලාවට ඒ පාසල් පිහිටලා තිබෙන්නේ - ඒ පාසලට ගොඩනැගිල්ල නැත්නම්, ළමයා භාර ගන්න ඉඩ නැත්නම් අද ළමයා පාසල් නොඑන තත්ත්වයට වැටිලා තිබෙනවා. මගේ

කොට්ඨාශයේත් පාසල් කිහිපයක් තිබෙනවා. ගොඩනැගිලි මදී. පන්ති වැඩි කරන්න පුළුවන්කමක් නැහැ. පන්ති වැඩි නොකළොත් එහෙම ඒ ළමයා වෙනත් පාසලකට යන්නේ නැහැ. යනවා නම් කිලෝ මීටර්, හත අටක්, දහයක් එහා තිබෙන්නේ. ඒ දහය තුළවත් බස් එකක් යන්නේ නැති ප්‍රදේශ තිබෙන්නේ. ඒ ළමයාට අධ්‍යාපනයක් නැතිව නිකන් ඉන්නවා. හය වන තෙක් පමණක් තිබෙන සමහර දමිළ පාසල්වල හයෙන් එහාට ඒ ළමයින් ඉගෙන ගන්නේ නැති, වෙනත් පාසලකට නොයන වැඩ පිළිවෙළවල් තිබෙන්නේ. ඉතින් මේ සියල්ලටම අපි එකට එකතු වෙලා යම්කිසි වැඩ පිළිවෙළක්, දීර්ඝකාලීන වැඩ පිළිවෙළක් - විශේෂයෙන්ම මම හැමදාමත් කියනවා වාගේ මේ අධ්‍යාපනයට ජාතික ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. ජාතික වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. මොන ආණ්ඩු පත් වුණත්, මොන රජයන් ආවත්, මොන පක්ෂයෙන් මේ ආණ්ඩු කෙරුවත් ජාතික ප්‍රතිපත්තියක් එක්ක ඉස්සරහාට යන වැඩ පිළිවෙළක් නොතිබුණොත් අධ්‍යාපන ක්ෂේත්‍රයට තව අවුරුදු 10 කින්, 15 කින්, 20 කින් අපටම තමයි මේකේ පළ විපාක විඳින්න වෙන්නේ. මේ ආකාරයට ගියොත් මේ රට වැටෙන තැන, මේ රට කොහේටද යන්නේ කියන එක අපට හිතා ගන්නවත් බැරි වෙනවා. අධ්‍යාපනය හරියට මෙහෙයවූවේ නැත්නම්, අර ගෙදරක දාන Fundation එක වාගේ ශක්තිමත්ව දීර්ඝ කාලීනව පවතින ආකාරයට මෙහෙයවූයේ නැත්නම් ඒකේ ප්‍රතිඵල වැඩිකල් නොගිහින් අපටම තමයි ලැබෙන්නේ. ඒ නිසා මේ අධ්‍යාපන ක්ෂේත්‍රයත් එක්ක මුස්ලිම් වේවා. දමිළ වේවා. සිංහල වේවා. කවුරු වුණත් හොඳ ජාතික ප්‍රතිපත්තියක් ඉස්සරහාට ගෙනි යන වැඩ පිළිවෙළක් වෙන්න ඕනෑ. මධ්‍යම රජයෙන් මේ වැඩ පිළිවෙළ නොවෙනවා නම්, පළාත් සභාව හැටියට අපේ අනන්‍යතාවය උඩ - මම හිතන්නේ පාසල් 1270 ක් වාගේ ප්‍රමාණයක් අපිට තිබෙනවා. පළාත් සභාව හැටියට පළාත් වැඩ පිළිවෙළක් හරි, දීර්ඝ කාලීනව යන වැඩ පිළිවෙළක් හරි මේ පාසල් පද්ධිතිය සියල්ල වෙනුවෙන් අපි ක්‍රියාත්මක කළ යුතුයි. ඒක අපි සියලුදෙනාගේම වගකීමයි. මෙතැනට අපි ඇවිල්ලා ඉන්නේ, මේ රටේ ජනතාවගේ මුදල්වලින්. මේ රටේ ජනතාව තමයි මේ හැම දෙයකටම මුදල් ප්‍රතිපාදන ලබා දෙන්නේ. ඒ අයගේ මුදල් ප්‍රතිපාදන තමයි අපි මේ විධියට මේ පළාත් සභාව තුළ මෙහෙය වන්නේ කියන එක මතක් කරනවා.

ඒ වාගේම දැන් මීට පෙර, විනාඩි කිහිපයකට හරි සභාව කල් තිබ්බ එකත් මේ රටට වුණු හානියක් කියන එකයි අපි දකින්නේ. මාස අටකට පස්සේ ආපු යෝජනාවත් ඇත්තටම මෙහෙම වුණු එක ගැන අපි කනගාටු වෙනවා, මේ අධ්‍යාපනය ගැන එහෙම වීම ගැන. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මීට එහා අපි අධ්‍යාපනයට තැන දිය යුතුයි. මීට එහා අධ්‍යාපනය වෙනුවෙන් පෙනී සිටිය යුතුයි. ඒක තමයි අපේ රටේ එකම ආයෝජනය. එකම Business එක. අපි මොනවා හරි දෙයක් ලබලා එකේ ප්‍රතිඵල ලබන්න තිබෙනවා නම් මේ අධ්‍යාපනයට කරන වියදම තමයි අපි මේ ලංකාවට ලාභයක් හැටියට උපයන්න පුළුවන් වෙලා තිබෙන්නේ. මේ ලංකාවේ එකම ව්‍යාපාරය මේ අධ්‍යාපනය කියන එකයි මම දකින්නේ. ඒ නිසා ඒ කාරණාව තුළ අපි මීට වඩා ලොකු කැපවීමකින්, මීට වඩා උනන්දුවකින් කටයුතු කළ යුතුයි.

විශේෂයෙන්ම දමිළ ජනතාව වෙනුවෙන්, දමිළ කථා කරන ජනතාව වෙනුවෙන් - ඉස්සර දමිළ ජාතික වෛද්‍යවරු කීදෙනෙක් මේ රටේ සිටියාද? අසූ ගණන් වලට ඉස්සෙල්ලා. දමිළ ජාතික ඉංජිනේරුවන් කී දෙනෙක් සිටියාද? විශේෂයෙන්ම අපට මතකයි හොරණ ප්‍රදේශයේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමාටත් මතකයි. කණකපිල්ලේ කිව්වාම මොනතරම් ශ්‍රේෂ්ඨ දොස්තර මහත්වරුද? බෙහෙත් නොදුන්නත් කථා කළාම ලෙඩ හොඳ වෙනවා. බෙහෙත් ගන්නේ 50% ක් විතර. ඒ තරම් කරුණාවන්තයි. ඒ තරම් හැඟීම්බරයි. ඒ තරම් ලෙඩාට සමීපයි. එහෙම හිටපු කාලයක් තිබුණා. නමුත් අද එහෙම අය ගොඩක් අඩුයි. අද එහෙම බුද්ධිමතුන් බිහි වුණේ නැහැ. අසූ ගණන්වලින් පස්සේ, උතුරු - නැගෙනහිර තිබුණු ප්‍රශ්නයත් එක්ක මම හිතන්නේ ඒ උගතුන් බිහි වෙන එක ටිකක් අඩු වෙන්න ඇති. බිහි වුණත් අද ලංකාවට ඒ අය සේවාව දුන්නේ නැහැ. රටේ තිබුණු තත්ත්වයත් එක්ක ඒ අයගේ සේවාවත් පිටරටවලට ගිහිල්ලා, ප්‍රසිද්ධ රටවලට, දියුණු රටවලට තමයි ඒ සේවාවත් දුන්නේ. එහෙමනම් ඒවා නැවතත් අපේ රටවලට ගෙනැල්ලා ඒ අයගෙන් ඒ සේවාව ලබාගෙන මේ අධ්‍යාපන ක්ෂේත්‍රය ඉස්සරහාට ගෙනි යන්න කටයුතු කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ඒකට අපට පුළුවන් උපරිම ශක්තිය, අපට ලැබෙන විමධ්‍යගත මුදල් ප්‍රතිපාදන දෙන්න අපි ලැහැස්තියි කියමින් ඔබ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙම යෝජනාවට අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානයට යොමු වෙන්න ඕනෑ. අවුරුදු ගණනාවක් තිස්සේ වතු පාසල්වලට තිබුණු අරමුදල නැති වුණු එක තමයි බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා. මීළඟට උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් ලැබෙනවා.

[ අ.භා. 12.14 ]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු -

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැය එකහාමාර, එකහාමාර අරගෙන තමයි යෝජනා දෙකක් සම්මත කරගන්න කථා කර ගත්තේ. ඒ නිසා කාලය පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න සිද්ධ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

අනික් යෝජනාවත් අරගෙන අවසන් කරන්න තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්න වෙනවා. අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, අපේ රටේ පළාත් සභා පිහිටුවලා 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනැල්ලා දෙමළ මිනිස්සුන්ගේ ප්‍රශ්නය විසඳන්න ගෙනාපු පළාත් සභා ක්‍රමයට අවුරුදු 26 කට පස්සේ වතුකරයේ ජනතාවගේ දරුවන්ට උගන්වන්න යන ගුරුවරුන්ට බයිසිකලයක් දෙන්න, යතුරු පැදියක් දෙන්න කියලා යෝජනාවක් ගෙනැල්ලා තවත් හමස් පෙට්ටියට යන යෝජනාවක් හැටියට මේ කටයුත්ත කිරීම සම්බන්ධව. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේ වෙනම යටිතල පහසුකම් වතු කියලා අමාත්‍යාංශයක් පිහිටුවලා ඒ අමාත්‍යාංශය යටතේ ඒ ප්‍රදේශවල තිබුණු පාරවල් සංවර්ධනය කරන්න, ඉස්කෝල සංවර්ධනය කරන්න, ජල විදුලිය නැති තැන්වලට ජල විදුලිය දෙන්න, ගුරුවරුන්ට අවශ්‍ය ඒ නේවාසිකාගාර හදන්න වෙනම අමාත්‍යාංශයක් පිහිටුවලා පාර්ලිමේන්තුවේ ඒ අමාත්‍යාංශයට අවශ්‍ය අයවැය වෙන් කරලා විශාල සේවාවක් කරන්න පුළුවන්කමක් ලැබුණා. මම මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හැටියට මට ලැබිලා තිබුණු යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ශත පහක් මේ අවුරුදු විසි ගණනට වෙන් කරලා නැති අමාත්‍යාංශයක් හැටියට, මම මුදල් අමාත්‍යාංශයත් එක්ක කථා කරලා, අපේ ප්‍රධාන ලේකම්තුමිය එක්ක කථා කරලා, අපේ කැබිනට් එකට පත්‍රිකාවක් දාලා, හිටපු ගරු මහ ඇමතිතුමාගෙන් සල්ලි ටිකක් ඉල්ලගෙන අපි ඒ ප්‍රදේශ සංවර්ධනය කරන්න කටයුතු කළා. ඒ නිසයි අද ඒ ඉස්කෝලයට යන දරුවාට පාරේ යන්න පුළුවන්කමක් තිබෙනවා. ඒ දරුවාට විදුලි ආලෝකයෙන් තමන්ගේ පොත පත, කම්පියුටරය කියවා ගන්න පුළුවන්කමක් තිබෙනවා. ජලය නැතිව තිබුණු දරුවාට ජල පහසුකම් ලබා දෙන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඉතින් ඒ නිසා ඒ යටිතල පහසුකම් අමාත්‍යාංශය මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පිහිටවපු නිසා තමයි ඒක ආවේ.

දැන් අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා වතුකරයේ ඉන්නවා වාගේම මමත් කොළඹ දිස්ත්‍රික්කයේ අවිස්සාවේල්ල ආසනයේ විශාල ජනතාවක් අපත් එක්ක ජීවත් වෙනවා. අපට ආදරෙයි. අපේ යූනියන් එකක් තිබෙනවා. එතකොට මේ දෙමළ ජනතාවගේ දරුවන්ගේ අනාගතය ගැන කථා කරනවා. ඒ අයට බයිසිකලයක් දෙන්න පුළුවන්. අපේ සිරිකමල් ගරු මන්ත්‍රීතුමා, සරත් පතිරණ අපේ ජේ.වී.පී. ගරු මන්ත්‍රීතුමා මේවාට වග කියන්න ඕනෑ. වතුකරයේ පාසල් ගිනි තිබ්බේ කවුද? වතුකරයේ ලයිට් කණු කැඩුවේ කවුද? ට්‍රාන්ස්ෆෝමර් කැඩුවේ කවුද? වතුකරයට ගිය සී.ටී.බී. බස් එක ගිනි තිබ්බේ කවුද? ජනතා විමුක්ති පෙරමුණ. එතකොට මම ප්‍රවාහන ඇමතිවරයා හැටියට පාර හැදුවා විතරක් නොවෙයි. මම ග්‍රාමීය පාරවල් කියලා තෝරගෙන වෙනම බස් පර්මිට් දීලා ඒ දරුවන්ට යන්න එන්න පුළුවන් විධියට, ගුරුවරයාට යන්න එන්න පුළුවන් විධියට මම පාර හදන ගමන්ම බස් පර්මිට් එකක් දෙන්නත් අපට කටයුතු කරන්න පුළුවන්කමක් ලැබුණා. එතකොට දැන් මුදල් ප්‍රශ්නය තමයි කථා කරන්නේ. මම

කනගාටු වෙනවා, මේ සංහිදියාව ගැන කථා කරන ආණ්ඩුවක් තිබෙන වෙලාවක, මේ රටේ සංහිදියාව ගැන කථා කරන චන්ද්‍රිකා කුමාරතුංග බණ්ඩාරනායක හිටපු ජනාධිපතිතුමියගේ ප්‍රධානත්වයෙන් තිබෙන වෙලාවක අද බලන්න සංහිදියාව කථා කරන ඒ වතුකරයේ ජනතාවගෙන් ඡන්ද ගත්ත එක මන්ත්‍රීවරයෙක් මේ සභාවේ ඉන්නවාද? මේ න්‍යාය පත්‍රය ඒ මන්ත්‍රීවරුන්ටත් ගිහිල්ලා තිබෙනවා. එතකොට මේ න්‍යාය පත්‍රයේ මේ යෝජනාව ගෙනැල්ලා තිබෙනවා.

එතකොට මේ යෝජනාව ගැන කථා කරන්න අර වතුකරයේ ඡන්දය ගන්න යන සුළු ජාතීන් වෙනුවෙන් කථා කරන්න යන මේ අපේ රටේ ඉන්න සුළු ජාතික පක්ෂ එක මන්ත්‍රීවරයෙක් මේ සභාව නියෝජනය කරන්නේ නැහැ. එතකොට ඒ එක්කෙනෙක් මේකේ නැහැ. මම කනගාටු වෙනවා. වතුකරයේ ජීවත්වන, වතුකරයේ දිස්ත්‍රික්කයක අධ්‍යාපන ඇමතිවරයෙක් ඉන්න මේ අධ්‍යාපන විෂයයත් එක්ක කථා කරන කොට අධ්‍යාපන ඇමතිත් නැහැ. අධ්‍යාපන ඇමතිගේ secretary ත් නැහැ. ඒ සම්බන්ධව කටයුතු කරන විෂයය සම්බන්ධ නිලධාරී එක්කෙනෙක්වත් මේ අපේ කාමරය ඇතුළේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මම හිතන්නේ ලේකම්තුමා ඉන්නවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට මේ කාලය. අපි දැන් මේ වැය කරන්නේ, වියදම් කරන්නේ අපට ඡන්දය දුන්න මිනිස්සුන්ගේ සල්ලි. මේවාට කන්න දෙන්නේ, ලයිට් පුච්චන්නේ මහජනයාගේ බදු. ඒක දෙමළද, මුස්ලිම්ද, බර්ගද කියලා නැහැ. මේ සභාව නියෝජනය කරන සියලු දෙනාම ජාති වාදයෙන් තොරව, විවිධ ජාතීන් ජීවත්වන රටක් හැටියට සියලුම ජාතීන්ගේ අයිතිවාසිකම් කථා කරන ආයතනයක් හැටියට, පළාත් සභාවේ බලය විමධ්‍යගත කරපු ආයතනයක් හැටියට - එතකොට දැන් ඒ නිලධාරීන් එක්කෙනෙක්වත් නැහැ. මේ දෙන මුදල් අපි කථා කරලා, නාස්ති කරලා මේ වැඩේ කරන්න බැරුව අපේ සිරිකමල් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේකත් 26 වැනි අවුරුද්දේ වන යෝජනාවක් හැටියට අර හමස් පෙට්ටියට යනවා. මේ යෝජනාවත් හමස් පෙට්ටියට යනවා. අර අරක ලියන අපේ නිලධාරී මහත්මියනුත් හිනා වෙනවා. මේගොල්ලොනේ ලියන්නේ මේක. හැන්සාඩ් එකට. මේ හැන්සාඩ් එක බලලා, බලලා, කියවලා කරපු වැඩ ගත්තා නම් මේ ඇමතිවරු මේ අවුරුද්දට මොනවද කරලා තිබෙන්නේ. මම මහ ඇමතිතුමාට කිව්වා, මම මේකේ පළමුවැනි අයවැයේදීම කිව්වා. පොඩි සෙල්ලම් බෝනික්කෙක් හිටියා. වයින් කළාම දුවනවා. බැටරිය බැස්සාම දුවන්නේ නැහැ. මහ ආණ්ඩුවෙන් සල්ලි දෙන්නේ නැහැ. යහපාලනයෙන් කපලා තිබෙන්නේ. කිව්වාම, අපේ අය මේ පැත්තේ විපක්ෂය කිව්වා නැහැ. නැහැ. මේක යහපාලනය. මෛත්‍රීපාල සිරිසේනගේ පැරදිච්ච පාර්ලිමේන්තු මන්ත්‍රිවරු කැබිනට් එකේ ඉන්න ආණ්ඩුව. මෛත්‍රීපාල සිරිසේනගේ ආණ්ඩුවේ ඇවිල්ලා රනිල් වික්‍රමසිංහ මහත්මයා කිව්වා එක්සත් ජාතික පක්ෂයෙන් පැරදුණු එකෙකුට දෙන්නේ නැහැයි කිව්වාම සරත් ෆොන්සේකාව පක්ෂයට අරගෙන පැරදුණු එක්කෙනාට දුන්නා. එතකොට ප්‍රජාතන්ත්‍රවාදය මේකද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ ආණ්ඩුව, මේ රට කන්න ආපු සරත් ෆොන්සේකා, ජනතා විමුක්ති පෙරමුණ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යෝජනාවට අදාළව කථා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

යෝජනාව නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා,

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

යෝජනාව ඊළඟ එක්කෙනාට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෛත්‍රීපාල සිරිසේන නොවෙයි, ජනාධිපතිතුමා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි එතකොට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපේ මන්ත්‍රීතුමා සැම දාම ඡන්ද ගත්තේ - (බාධා කිරීම්)

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

රීති ප්‍රශ්නයක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හරියට මීටරය අහු වෙන්නේ නැති රේඩියෝ එකක් වාගේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභා රීති 67(9) ට අනුව, කථා කරමින් සිටින මන්ත්‍රීවරයෙකු අදාළ විෂයෙන් පිටස්තරව කථා නොකරන්නේ නම් ඔහුට බාධා නොකරන්න පුළුවන් කියලා කියනවා. දැන් මේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ වැදගත් යෝජනාව මොළේ තිබෙන වැදගත් මන්ත්‍රීවරු ගණනාවක් කථා කරලා වැදගත් කථා ටිකක් මොළේට වැටිලා තිබෙන වෙලාවේ දැන් මේ කථාව ඇතුළේ මේ යෝජනාවේ අන්තර්ගතයට බලපාන එකම කාරණයක්වත් මේ දීපු විනාඩි 10 න් කථා කළේ නැහැ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට අදාළව එකම කාරණයක් හරි හැන්සාඩ්ගත වෙලා තිබෙනවා නම් අඩුම තරමේ මේ යෝජනාවට මායිම් වෙලා යන කාරණයක් හරි මේ කථාව ඇතුළේ තිබෙනවා නම් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේ කාලයේ මායිම් වෙන්නේ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ කථාව ඇතුළේ තිබුණේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක රීති ප්‍රශ්නයක්ද? රීති ප්‍රශ්නයේ තිබෙන්නේ මන්ත්‍රීවයෙකුට කරදයක් වුණා නම්, අසාධාරණයක් වුණා නම් -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ කථාව ඇතුළේ තිබෙන්නේ මම කළා. මම කළා, මම කළා, විතරයි. මේ පළාත් සභාවේ අම්මාගේ අප්පාගේ බුදලයෙන් ගෙනාපුවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මම කළා. මම කළා. මම කළා කියනවා. මම කරපුවා නොවෙයි. දැන් තිබෙන්නෙ මෙන්න මේ අය කරන ඒවා. මේ තිබෙන්නේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ පිස්සු කථා -

[සභාවේ ඝෝෂා]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

පක්ෂයේ මේ විෂයය ගැන දන්න කෙනෙක් නැද්ද ඔය කථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මිනිහා - මේ මනුෂ්‍යා මන්ත්‍රීතුමා උසාවියේ කෝට් එක දාලා, උසාවියේ Thank you sir කියලා කල් දාන කොට මේ පළාත් සභාවත් නඩුවක් කියලා හිතලා. අර මිනිස්සුන්ගෙන් ගාණ අරන් සාක්කුවේ දාගෙන ටැක්ස් එකටවත් පෙන්වන්නේ නැතිව කථා කරන නීතිඥ මහත්මයෙක් තමයි මෙතුමා. මෙතුමාගේ සරත් ෆොන්සේකා ගැන කථා කරන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

යටිතල පහසුකම් මේකේ තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දීපාල් ගරු මන්ත්‍රීතුමා සල්ලි ටික කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ සාක්කුවට දාන්න. එතකොට ඒක හරි යනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ යෝජනාවට මේ සියල්ලක්ම ඇතුළත් වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට විනාඩියක් දෙන්න. මගේ විනාඩියක් ගත්තා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විනාඩියෙන් අවසන් කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ සල්ලි ටික ඔබතුමාට එවන්න කියන්න. එතකොට හරි යනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මුදල් නැත්නම් මුදල් සොයන හැටිත් මම කියලා දෙන්නම්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

රීති ප්‍රශ්නයක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විනාඩියෙන් අවසන් කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මිනිහා කිව්වා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මිනිහා කියලා මනුෂ්‍යා කිව්වේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මිනිහා කියලා මනුස්සයා කිව්වා.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ මනුස්සයා සල්ලි අරගෙන සාක්කුවට දා ගන්නවා කිව්වා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බස්නාහිර පළාත ගත්තොත් තුන් සියයක් ඇති. මේ තුන්සියයට මේ බයිසිකලයක් දෙන්න මොකක්ද කරන්න ඕනෑ. අපේ පළාත් සභාවේ චක්‍ර ලේඛනයක් තිබෙනවා,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ මාතෘකාවට අනුව කථා කරලා අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මුදල් කොමිෂන් එකෙන් එවපු චක්‍ර ලේඛනයක් තිබෙනවා. අපේ පළාත් සභාවේ වාහන ලීසිං කරලා ගන්න පුළුවන් නීතියක් තිබෙනවා. එතකොට මේ අයගේ වාහනය ලීසිං කරලා දුන්නාම ඒ ලීසිං එක ගෙවන්න පළාත් සභාවේ කලාප කාර්යාලය හරහා දෙන මුදලින් ඒ ලීසිං එක ගෙවන්න කැබිනට් මණ්ඩලයේ අනුමැතිය දුන්නාම මේ ප්‍රශ්නය ඉවරයි. මේ ටික කරගන්න තමයි (බාධා කිරීම්) මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව මගේ ගෞරවනීය ස්තුතිය ඔබතුමාට පුද කරන අතරම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව අවුරුදු 26 ට හමස් පෙට්ටියට දමන යෝජනාවක් හැටියට ගෙනැල්ලා තියෙනවා. මම කිව්ව ලීසිං ක්‍රමයට වාහන ටික අරන් දෙන්න කියලා යෝජනා කරමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 12.25 ]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්න හැදුවේ අපි පළාත් සභාවට ආපු දවසේ ඉඳලා වැඩියෙන්ම නිදාගෙන සිටියා දැක්කේ උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා. ගිය ජනවාරි 08 වැනි දායින් පස්සේ නින්දෙන් ඇහැරුණා. දැන් තමයි යමක් පොඩ්ඩක් තේරිලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාට යෝජනාවට කථා කරන්න ඕනෑ නැද්ද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. මගේ නම කිව්ව නිසා. මෙතුමා හිටියද කියලා අහන්න මම ඇමතිකම් කරන කාලයේ. මේගොල්ලෝ දන්නේ නැහැ, කරපුවා. ඒ කරපුවා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සමාවෙන්න. ඔබතුමා කරපුවා ගැන වෙනම විවාදයක් කරමුද අපි.

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සිරසේ සටනට එන්න කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙනදාට ෆයිල් ටික ගේනවා. අද ගේන්න බැරි වුණා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සිරසේ සටනට ගෙන්න ගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව අතිශය වැදගත්. හැබැයි මේ යෝජනාවේ මීට වඩා පුළුල් මාන ගණනාවක් සලකා බැලිය යුතුව තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒකට හේතුව විශේෂයෙන්ම අපි දන්නවා, මේ පළාතේ වතු පාසල් 06 ක් තිබෙනවා. මේ වතු පාසල් ගණනාවකට මා ගිහින් තිබෙනවා. පසුගිය සතියේත් මම මේ වතු පාසල් දෙකකට ගියා. ඇත්ත වශයෙන්ම මේ යෝජනාව ගැන මතකයක් තිබුණේ නැහැ. මම දුරකථනයෙන් කථා කරපු වෙලාවක මම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගෙන් ඇහුවා, ගරු මන්ත්‍රීතුමා අහවල් පාසලට ගියා. වතු පාසලක්. මේ පාසලේ තත්ත්වය මම දැක්කා. එතුමා එක්ක මම සාකච්ඡා කළා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සිරසේ පෙන්නුවේ නැහැ නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සිරසේ පෙන්නුවා. ගම් මැද්ද වැඩ සටහන කියන එකක්. ඔබතුමා දැක්කාද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා ගියා කියලා සිරසේ පෙන්නුවේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මා ජීවත් වෙන්නේ කොළොන්නාවේ. කොළොන්නාව කිව්වාම හැමෝම හිතනවා නාගරික පරිසරයක්. ප්‍රවාහන පහසුකම් ඕනෑතරම් තිබෙනවා. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සේදවත්ත සිද්ධාර්ථ මහ විද්‍යාලය, කොටුවිල ගාමිණී විද්‍යාලය, වෙන්නවත්ත ටිබෙට් එස්. මහින්ද විද්‍යාලය, ඒ වාගේම වේරගොඩ විද්‍යාලය. මේ පාසල් හතරටම යන්න ප්‍රවාහන පහසුකම් නැත. මෙම ගුරුවරුන්ගෙන් 90% ක් එන්නේ කිලෝ මීටර් තුන හතරක් පයින්. හරිම කනගාටුදායක තත්ත්වයක්. මේක තමයි ඇත්ත තත්ත්වය.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කිව්වේ පාරවල් හැදුවා කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පාරවල් හැදුවාට වාහන දැම්මේ නැහැ නේ. ඒ වාහන ගෙදරට හරවා ගත්තා. ප්‍රවාහන ඇමති කාලයේ. හරිද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පාසල්වල ගුරුවරුන්ට -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

සමහර දෙමළ පාසල්වලට පයින් යන්නවත් පාරවල් නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක තමයි මම කියන්නේ. වතු පාසල්වල විතරක් නොවෙයි. මෙම පහසුකම අවශ්‍ය නගරයේ පාසලුත් තිබෙනවා. ඒ අයටත් අඩුම වශයෙන් යතුරු පැදියක් දිය යුතුයි. සමහර ගුරුවරුන්ට ඒක දරාගන්න පුළුවන්. සමහර ගුරුවරුන්ට ඒක දරාගන්න බැහැ. සමහර ගුරුවරු පයින් එන්නේ. මම දන්නවා, සේදවත්ත මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති හාමුදුරුවෝ, අපේ හාමුදුරුවන් සමහර දවස්වලට බස් එකේ ඇවිල්ලා කිලෝ මීටර් තුනක් විතර පයින් එනවා. ආදි ශිෂ්‍ය සංගමය එකතු වෙලා ගෙවීමට පහසු ක්‍රමයට - දුප්පත් ආදි ශිෂ්‍යයන් ඉන්නේ. ගෙවීමේ පහසු ක්‍රමයට ත්‍රීවීල් එකක් අරන් දුන්නා. ත්‍රීවීල් එක කැඩුණු දවසට හාමුදුරුවන් එන්නේ පයින්. බස් එකේ මහක් දුර ඇවිල්ලා පයින් එනවා. මේ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. ඉතින් ඒ නිසා මේ පිළිබඳව සැලකිල්ල යොමු කිරීම ඉතාම වැදගත්. මම කියන්නේ වතු පාසල්, විතරක් නොවෙයි.

[ගරු සුසිල් කිඳෙල්පිටිය ]

ඒ වාගේම මෙතුමා බොහොම ළඟින් සම්බන්ධ පඤ්ඤාගුල විද්‍යාලය. අවිස්සාවෙල්ලේ. මේ පඤ්ඤාගුල විද්‍යාලයට මම ගියා. මේ පාසලේ උපාධිධාරීන් හත් දෙනෙක් ඉන්නවා. මේ පාසල වැසී යාමට තිබුණු පාසලක්. අද ළමයින් 100 කට ආසන්න ප්‍රමාණයක් මේ ගුරුවරුන් ටික එකතු වෙලා, තරුණ උපාධිධාරී ගුරුවරුන් එකතු වෙලා මේ පාසල හදන්න ඇත්ත වශයෙන්ම විශාල සටනක් ගෙනියනවා. මේ ළමයින් ගෙන්න ගන්න. සමහර ළමයින් ඉස්කෝලෙට එන්නේ නැහැයි කිව්වා. සමහර ළමයින්ට පහසුකම් නැහැ. ළමයින්ට සපත්තුවත් නැහැ. ගුරුවරුන් කිහිප දෙනෙකුට විතරයි මෝටර් සයිකල් තිබෙන්නේ. මේ මෝටර් සයිකලෙත් සමහර ගුරුවරු එකට එකතු වෙලා යන්න ඉන්නවා. ගොඩක් ගුරුවරු හවස් වනතුරු වැඩ කරනවා. හවස් වුණොත් ගෙදර යන්න විධියක් නැහැ. අපි මේ පාසලේම නිදා ගන්නවා. මේ පාසලේ සියලුම ගොඩනැගිලිවලට තීන්ත ගෑවේ අපියි කිව්වා. ගුරුවරුන් එකතු වෙලා. ඉතින් හවස් වෙනතුරු වැඩ කළාම ගෙදර යන්න විධියක් නැහැ. විශාල දුරක් පයින් යන්න තිබෙනවා. ඇත්ත වශයෙන්ම මෙය ඉතාම කාලෝචිත යෝජනාවක්. ඒ නිසා විශේෂයෙන් කියන්න ඕනෑ. ඒ පාසලට යන්න පාරක් නැහැ. පාරවල්වල සම්පූර්ණයෙන් ගඩොල් විතරයි තිබෙන්නේ. වාහනයක්වත් යන්න බැහැ. මෙතුමා පාරවල් හැදුවයි කියනවා. ඉස්කෝලේ ඉස්සරහා මීටර් 75 ක විතර පාරක් තිබෙනවා. එතකොට මම ඇහුවා, මේ පාර කොහොමද හැදුවේ කියලා. ඒ පාර කිව්වා, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මැදිහත් වෙලා මේ පාර කොටස විතරක් හදලා දුන්නයි කිව්වා. මම දන්නවා, මෙතුමා ඒ පාර හැදුවේ අපේ රෙජිනෝල්ඩ් කුරේ ඇමතිතුමාගේ කාලයේ. මම හරි නේද? එතුමාගේ කාලයේ මේ පාර කොටස විතරක් හැදුවා. හැබැයි, ඒ ඉස්කෝලේ ඉස්සරහා විතරයි. ඒ පාසලට එන සම්පූර්ණ මාර්ගය සහ එතැනින් එහා ගමට යන මාර්ගය සම්පූර්ණයෙන්ම යන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ගිය සතියේ අවිස්සාවෙල්ල මායිමේ, සබරගමු මායිමේ තිබෙන වතු පාසලකට ගියා. ඒ වතු පාසලට ගියාම තේරෙනවා, මේ පාරවල් හැදීම සහ අපේ අධ්‍යාපනය පිළිබඳව ප්‍රශ්න. අපේ හිටපු ගරු ඇමතිතුමා කිව්වා, අමාත්‍යාංශයක් හැදුවා කිව්වා. විශාල සේවයක් කළා කිව්වා. වතු පාරවල් හැදුවා කිව්වා. දැන් මේ ළමයෙක් ඇඳපු චිත්‍රයක් මම ළඟ තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ළමයෙක් මේ චිත්‍රයක් ඇඳලා. මොකක්ද තිබෙන්නේ? මේ කැඩිච්ච පාරක් ඇඳලා ඒක දිගේ ළමයින් ටිකක් ඇවිදගෙන එනවා. මේකේ උඩින්ම ගහලා තිබෙන්නේ මොකක්ද? එනදු පල්ලි වාල්ක්කෛ. මගේ පාසල් ජීවිතය කියලා ඒ ළමයා චිත්‍රයක් අඳිනවා. ඒ ළමයාට මෙහෙම ඉරක් ගහලා කියලා තිබෙනවා, මොකක්ද කියන්නේ. මේ කන්දේ ළමයින්, මේල් මලෙප් පිල්ලෛහල් කියලා කියනවා. මේ කන්දේ ළමයින් ඇවිදගෙන එනවා. ළමයින් ඇවිදගෙන එන කොට පල්ලෙහා මොකක්ද තිබෙන්නේ? කාලෙක් කුට්ටම්. උදේ රැස්වීම පටන් අරන්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඕක සභාගත කරන්න බැරිද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සභාගත කරන්න පුළුවන්. උදේ රැස්වීම පටන් අරන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ළමයා ඇඳපු චිත්‍රය. විදුහල්පතිතුමා ළමයින් අමතනවා. මේ ළමයින් පයින් එනවා. මම ඇහුවා, කොපමණ දුරක් පයින් එනවාද? කියලා. උදේට එන කොට කිලෝ මීටර් 05 යි. හවසට කිලෝ මීටර් 05 යි. කිලෝ මීටර් 10 ක් පයින් යනවා. රට පුරා වතු පාසල් හැදුවයි කියනවා. පට්ටපල් බොරු කියනවා. මේ පාසලේ විදුහල්පතිතුමා. මම ඇහුවා, ගරු විදුහල්පතිතුමා මේකේ හෝල් දෙකයි තිබෙන්නේ. ඔබතුමා කොහෙද ඉන්නේ? කියලා. මම හැමදාම නිදා ගන්නේ මේ හෝල් එකේ බංකුවක් උඩ කිව්වා. ඒ විදුහල්පතිතුමාට බයිසිකලයක් නැහැ. ඉතින් මේ වතු පාසල් දියුණු කරනවා කියන්නේ කොහොමද? මම කියන්නේ මේක තමයි සැබෑ තත්ත්වය. සමහරු ඉන්නවා රෑට දඩාවතේ ගිහිල්ලා උදේ එකොළහට නැඟිටලා ජනතාවගේ ප්‍රශ්න ගැන, අපේ දරුවන්ගේ අධ්‍යාපනය ගැන කථා කරන්නේ නැහැ. මෙතැන ඇවිල්ලා වෙන වෙන ප්‍රශ්න මතු කරනවා, ගණපූරණය නැහැයි කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දඩාවතේ යනවා කිව්වේ කවුද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ සංදීප් ගැන කිව්වේ. සංදීප් කියලා අර තරුණයෙක් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා අර දඩාවතේ යනවා කියලා කිව්වේ කවුද?

[සභාවේ ඝෝෂා]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය අවුරුද්දේ ආණ්ඩුව කිව්වා. මොකක්ද කිව්වේ? පළාත් නිශ්චිත කාර්ය සංවර්ධන ප්‍රදාන යටතේ වතු ආශ්‍රිත පාසල් වැඩි දියුණු කිරීමට රුපියල් දස ලක්ෂ හැට පහක් වැය කරනවා කියලා. හැබැයි අද වනතුරු වතු පාසල් දියුණු කරන්න අරගෙන තිබෙන පියවර අපි දැක්කේ නැහැ. හැබැයි, මේ අවුරුද්දේ නැවත ආණ්ඩුව තීරණයක් ගත්තා. එක්සත් ජාතීන්ගේ තාක්ෂණික සහාය ඇතිව වැවිලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීමේ පස් අවුරුදු වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න ආණ්ඩුව දැන් කටයුතු කරමින් යනවා. අහගන්න ඇමතිතුමා. හොඳ වැඩක් කළොත් අපි හොඳයි කියනවා. වැරැදි වැඩක් කළොත් වැරැදියි කියනවා. ඒ නිසා අධ්‍යාපනය දියුණු කිරීමට ආණ්ඩුව විශාල තැනක් දීලා තිබෙනවා. ඒ වාර්තාව මම බැලුවා. ඒක නිසා මේක මේ පළාත පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේක රටේම වතු ආශ්‍රිත ජනතාවගේ දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නයක්. කිසි කෙනෙකුට ප්‍රශ්න කරන්න බැහැ. හොරකම් කරන්න බැරි අයිතිය අධ්‍යාපනයයි. ඒ නිසා අධ්‍යාපනය දියුණු කිරීමේ කටයුත්තේදී මේ ජාතික වැඩ පිළිවෙළක් යන වේලාවේ - අවාසනාවකට අපේ ගරු ඇමතිතුමා මේ වේලාවේ නැහැ. වතු ආශ්‍රිත පාසල් දියුණු කරන්න රට පුරා ජාතික වැඩ පිළිවෙළක් යනවා. ඒ නිසා පළාත හැටියට අපි මධ්‍යම ආණ්ඩුව එක්ක සම්බන්ධ වෙලා එතැනින් ප්‍රතිපාදන ලැබෙනවා නම්, විශේෂයෙන්ම මේ කටයුත්තේදී අපට විදේශ ආධාර ලැබෙනවා. එතැනින් ප්‍රතිලාභ ලැබෙනවා නම් මේ පළාතේ වතු පාසල් දියුණු කරන්න කටයුතු කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. ගුරු හිඟයක් තිබෙනවා. වතු පාසල්වල දෙමළ කථා කරන ගුරුවරු නැහැ. දෙමළ විෂයය උගන්වන්න ගුරුවරු නැහැ. සමහර පාසල්වලට මම ගියා. සිංහල උගන්වන්න එකම ගුරුවරයෙක්වත් නැහැ. මහා ලොකුවට මේ ජාතිය ආගම ගැන කථා කරනවා. දෙමළ පාසල්වල සිංහල උගන්වන්න එක ගුරුවරයෙක් නැහැ. මම එතකොට ඇහුවා, විදුහල්පතිතුමා සිංහල උගන්වන්නේ නැද්ද? අනේ අපිට සිංහල උගන්වන්න බැහැ නේ මන්ත්‍රීතුමා. අපට කෙනෙක් නැහැ උගන්වන්න. අපට සිංහල ගුරුවරුන් එන්නේ නැහැයි කිව්වා. ඇයි මේ අමාරුව විඳගන්න සිංහල ගුරුවරුන්ට බැහැ. මේක තමයි ඇත්ත තත්ත්වය. ඒක නිසා මේකට විධිමත් වැඩ පිළිවෙළක් ඕනෑ. මේ ගුරු ප්‍රශ්නය ගැන අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා. ඒවාට තමයි අවධානය යොමු කරන්න ඕනෑ. මම කියන්නේ, අවධානය යොමු කරලා මේ වතු පාසල්වල ඉන්න ගුරුවරුන්ට යතුරු පැදියක්, ප්‍රවාහන පහසුකම විතරක් නොවෙයි. මේක දරුවන්ටත් තිබෙන ප්‍රශ්නයක්. ප්‍රවාහන පහසුකම් දරුවන්ට වාගේම, ඒ වාගේම විශේෂයෙන්ම ගුරුවරුන්ට ප්‍රවාහන පහසුකම් දෙන්න ඕනෑ. මම කියන්නේ ප්‍රවාහන පහසුකම් විතරක් නොවෙයි. මම කියන්නේ ඒ අයට දීමනාවකුත් දෙන්න ඕනෑ කියලා. මේ ගෙවන දුෂ්කර ජීවිතයට දීමනාවකුත් දිය යුතුයි කියලා මම හිතනවා. ඒ නිසා පළාත් සභාවේ මැදිහත්වීමේ කටයුත්ත විශේෂයෙන් කළ යුතුයි. මම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරනවා. වහාම මෙහෙම යෝජනාවක් ගෙනෙන්න. මම හිතන්නේ මේ පළාත් සභාවේ ඉන්න සියලුම ගරු මන්ත්‍රීවරුම කැමැති වෙයි වතු පාසල් දියුණු කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරන්න. ඒ සඳහා අපි පූර්ණ සහාය දෙනවා. පළාත් සභාව ඒක කරන්නේ නැත්නම් මම ගරු මන්ත්‍රීතුමාට යෝජනා කරනවා, අපි මන්ත්‍රීවරු හැටියට පෞද්ගලිකව මැදිහත් වෙලා මේ වැඩ ටික කරමුයි කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමන්ලා යෝජනා දෙකම කිට්ටුවෙන්, එක සමානව යන යෝජනා දෙකක්. ඒක නිසා දෙවැනි යෝජනාවට අවශ්‍ය කරන - නාම ලේඛන දෙක අරගෙන තිබෙනවා. ඒ නිසා තමන්ගේ කථාව කෙටි කරන්න. මීට පස්සේ කවුරුවක්වත් අවස්ථාවක් ඉල්ලන්න එපා. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක අවස්ථාවක් ලබා දෙනවා.

[ අ.භා. 12.35 ]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම ඉතාමත්ම කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධව මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අපි ස්තුතිය පුද කරනවා. ඒකත් එක්කම මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මොකද අපි දීර්ඝ කාලයක් තිස්සේ මෙවන් යෝජනා මෙම සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. කනගාටුවට කරුණ තමයි අද වනතුරු මම දාපු එකම යෝජනාවක්වත්, මම හිතන්නේ මම සභාවට ඇවිල්ලා මේ හත්වැනි අවුරුද්ද වාගේ යන්නේ. මේ කාලය තුළ එකම යෝජනාවක්වත් - මම යෝජනා 10 ක් විතර දාලා තිබෙනවා. එකම යෝජනාවක්වත් ක්‍රියාත්මක වෙලා නැහැ. අපි හිතමු ඒවා රේඛීය අමාත්‍යාංශයට යවනවා. රේඛීය අමාත්‍යාංශයට යැව්වාම ඒක යොමු කළා කියනවා. එතැනින් එහාට ඒවා සම්බන්ධීකරණයක් වෙනවාද? ඒ අදාළ අමාත්‍යාංශයෙන්. එහෙම වෙන එකක් මම දන්නේ නැහැ.

ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කරුණාකරලා මම ඉල්ලා සිටින්නේ අඩුම ගණනේ මෙම යෝජනාවෙන්වත් මේක පටන් ගන්න. අඩුම ගණනේ මේ සඳහා කමිටුවක් පත් කරන්න. කමිටුවක් පත් කරලා මේක ක්‍රියාත්මක කරන්න. මේක රේඛීය අමාත්‍යාංශයට යවන්න ඕනෑ යෝජනාවක් නොවෙයි. මේක බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කරන්න පුළුවන් දෙයක්. අර උපාලි කොඩිකාර හිටපු ගරු ඇමතිතුමා කියපු සමහර කරුණුවලට මම එකඟ වෙනවා. මොකද, අධ්‍යාපන ඇමතිතුමා අසනීප වෙන්න ඇති. නමුත් ඒ අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් මේ වාගේ යෝජනාවක් එන කොට මේක අහගෙන ඉන්නවත්, මන්ත්‍රීවරු කථා කරන්නේ මොකක්ද කියන එකවත් දැනගන්නවත් මෙතැන ඉන්න ඕනෑ. ඉඳලා මේක ක්‍රියාත්මක කරන්න. මේ නිසාම තමයි මේවා ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා ඉල්ලා සිටින එකම දේ තමයි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ විජේතුංග මහත්මයා මේ වේලාවේ ඉන්නවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දැන් හරි ඉන්නවා නම් හොඳයි. මම කියන්නේ, මේ ගැන ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරලා, මේකට කමිටුවක් පත් කරන්න. කමිටුවක් පත් කරලා පැහැදිලිවම මේක ක්‍රියාත්මක කරන්න. මේක ක්‍රියාත්මක නොවුණයි කියලා අපට නැවත සභාවක කියන්න තියන්න එපා. එකත් එක්කම අපි පැහැදිලිව කියන්නේ, මේ යතුරු පැදි දීම ඉතාමත්ම හොඳයි. අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ වතු පාසල් ගොඩක් වේලාවට අපට හිතෙන්නේ අත්හැරලාම දාලා වාගේ කියලා. මොකද, අපේ ආසනයේත් මෙවන් පාසල් තිබෙනවා. පාසල් තිබුණාට, අද ඒ දෙමළ මාධ්‍ය උගන්වන්න සිංහල ගුරුවරුන් නැහැ. ඒකට තවමත් වැඩ පිළිවෙළක් නැහැ. දීර්ඝ කාලයක් තිස්සේ අපි කථා කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමාත් දන්නවා. ඔබතුමාගේ ප්‍රදේශයේ, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ මේ වාගේ දේවල් තිබෙනවා. ඔබතුමා අධ්‍යාපනය වෙනුවෙන් ලොකු කැපවීමක් කරනවා. කැපවීමක් කළාට, ගොඩක් වෙලාවට අපි දෙමළ මාධ්‍ය ගුරුවරු නැති ප්‍රශ්නයට අපි එදා සිටම කටයුතු කරනවා. අපි පළාත් සභාවට එන්නටත් ඉස්සෙල්ලා සිට. මේ ගුරු පුරප්පාඩු ටික පුරවන්න මේ පළාත් සභාවෙන් අද වනතුරු වැඩ පිළිවෙළක් නැහැ. ඒකත් එක්කම ගරු මන්ත්‍රීවරුන් කිව්වා වාගේ අපේ සමහර පාසල් තිබෙනවා. මේ බස්නාහිර පළාතේ බණ්ඩාරගම ආසනය ගත්තාම යටවර, පාතකඩ පාසල් තිබෙනවා. ඒවාට හරි ප්‍රවාහන පහසුකමක් නැහැ. කිලෝ මීටර් තුන හතරක් පයින් යන්න ඕනෑ. සමහර වේලාවට ඒ ගුරුවරුන් ත්‍රීවිල් එකක් හයර් එකට අරගෙන යනවා. ත්‍රීවිල් එකක් හයර් එකට අරන් යන්න රුපියල් තුන් හාරසියයක් යනවා. ඉතින් මේ වාගේ ලොකු දුෂ්කරතා මැද්දේ යන්නේ. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ, සියලුම පාසල්වල අයට මේ යතුරු පැදියක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා. දුෂ්කර පාසල්වල ගුරුවරුන්ට. මේ ද්‍රවිඩ පාසල්වලට වාගේම අනිකුත් දුෂ්කර පාසල්වලටත් මේ කටයුත්ත කරන්නය කියලා අපි ඉල්ලා සිටිනවා.

ඒකත් එක්කම අපි ඉල්ලා සිටින්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ පැහැදිලිවම විශාල ගුරු පුරප්පාඩු ටිකක් අද හැම පාසලකම පවතිනවා. අද එන්න එන්නම ඒ ගුරු පුරප්පාඩු පවතිනවා. අද පාසල්වලින් අපෙන් ඉල්ලන දේ තමයි මේ වසරට ගුරුවරුන් නැහැ. අපේ ළමයාව වෙනත් ඉස්කෝලයකට දාලා දෙන්නය කියලා.

ඒ අය දන්නේ නැහැ, අනික් ඉස්කෝලයකට ගියත් ඒකයි තත්ත්වය කියලා. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශයයෙන් මම ඉල්ලා සිටිනවා. විභාගය කරපු අර උපාධිධාරීන් විශාල පිරිසක් ඉන්නවා. ඒ උපාධිධාරීන්ව බඳවාගෙන මේ පුරප්පාඩු තිබෙන පාසල්වලට යොමු කරන්න. පාසල්වලට යොමු කරලා මේ දරුවන්ගේ ප්‍රශ්නය විසඳන්න. අද ගොඩක් වේලාවට නගරබද පාසල්වල ඕනෑ තරම් ගුරුවරු ඉන්නවා. ගම්බද පාසලේ නැහැ. ගුරු තුලනයක් කරන්න. ගුරු තුලනයක් කරලා වැඩ පිළිවෙළක් හදන්න. සමහර තැන්වල අපි දන්නවා, ඒ පාසල්වල කාර්යාල කාර්ය සහායකයන් නැහැ. සමහර පාසල්වල දෙතුන් දෙනා ඉන්නවා. එම නිසා මේවාට ගන්නකන්වත් මේවාට වැඩ පිළිවෙළක් හදන්න. මේවාට වැඩ පිළිවෙළක් හදලා මේ අධ්‍යාපනය නියමාකාරව විදුහල්පතිවරුන්ට ක්‍රියාත්මක කරන්න පුළුවන් විධියට වැඩ පිළිවෙළක් හදලා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමා නිතර මගේ මුහුණ දිහා බලනවා. ඒක නිසා මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. මම කියන්නේ එකම දෙයයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගෙන් මම ඉල්ලන එකම දේ තමයි. මේ යෝජනාවෙන් පටන් ගන්න. මේකට කමිටුවක් පත් කරන්න. කමිටුවක් පත් කරලා කඩිනමින් මේ ද්‍රවිඩ පාසල්වල ප්‍රශ්නය විසඳන්න කටයුතු කරන්නය කියන ගෞරවණීය ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.41 ]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අපි අගය කරන්න ඕනෑ. විශේෂයෙන් ගුරුවරු සම්බන්ධයෙන් සහ ඒ සේවය සම්බන්ධයෙන්. මමත් කියන්නේ, මේ යෝජනාවේ ඇති වතු පාසල් කියනවාට වඩා තවත් ඉස්සරහාට ගිහිල්ලා දුෂ්කර පාසල් සඳහා කිව්වොත් වඩා වටිනවා. මොකද, මම ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල කොට්ඨාශය නියෝජනය කළත් අපේ ප්‍රදේශවල වතු පාසල් නොමැති වුණත් ඉතා දැඩි දුෂ්කර පාසල් තිබෙනවා. ප්‍රවාහන පහසුකම් නැති, කිලෝ මීටර් හතර පහ වාහන යන්නේ නැති ඒ වාගේ තැන් තිබෙනවා. එතකොට මේ සේවය ලබා ගැනීමේදී මේ හා සමානව දෙමළ ජනතාව ජීවත් නොවුණත් මේ හා සමානම අපහසුකම් තිබෙනවා. ඉතින් මම විටක විශ්වාස කරනවා, මේ ගුරුවරයා කියලා අර්ථකථනය කර ගන්න කොට ග්‍රාමීය මට්ටමට යන කොට ගුරුවරයාගේ සේවය වඩා ඇගයීමකට ලක් වුණා. සමහර නාගරික ප්‍රදේශවල ගුරුවරයාට තිබෙන තරමට වඩා ගෞරවණීය තත්ත්වයක් ගම තුළට යන කොට ගුරුවරයාට තිබෙනවා. මෙය තවත් දුෂ්කර තැන්වලට යන කොට ඔවුන්ට ඒ ගෞරවය මිනිස්සු තුළ තිබෙනවා. මිනිස්සු තුළ ඒ ගුණාංගවලින්, ගුරුවරයා කිව්වාම තිබෙන ඒ ගෞරවය ඒ හැම දෙයක්ම තිබෙනවා. නමුත් ඒ ගෞරවය විතරක් ගුරුවරයාට ලැබිලා මදී. ගුරුවරයාට පහසුකම් තිබෙන්නට ඕනෑ. එවැනි විවිධ ගැටලු තත්ත්වයන් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අපේ බස්නාහිර පළාතේ අපේ සමූපකාර අමාත්‍යාංශය තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශය තිබෙනවා. කථා කරලා මේවාට වැඩ පිළිවෙළක් යොදා ගන්නට ඕනෑ.

මීට වඩා මම විශ්වාස කරනවා. මේ බස්නාහිර පළාත් සභාව කියන කොට අපි කේන්ද්‍ර කරන්නේ අධ්‍යාපනයට මුල් තැනක් දෙන තැනක්. රටේ තිබෙන පාලනය විමධ්‍යගත වන කොට අධ්‍යාපනයට මූලික තැනක් මේ පළාත තුළ ලැබෙනවා. එතකොට මේ බස්නාහිර පළාත කියන්නේ කේන්ද්‍ර වුණු තැනක්. අද බස්නාහිර පළාත් සභාවේ රැස්වීම. ඊයේ රෑ අපි 10 වන කොට ගෙදරට ආවේ හෙට උදේ රැස්වීමට යන්න තිබෙනවා කියලා. අපි වෙලාවට රැස්වීමට එන්නේ මේ උත්තරීතර සභාව නියෝජනය කරන්න. අපි මේ උත්තරීතර සභාව නියෝජනය කරන්න ඇවිල්ලා, මේ කාලය හමාර කරලා අපි මෙතැනින් යන්නේ. එහෙනම් මේකට මීට වඩා හොඳ අර්ථ කථනයක් තිබෙන්නට ඕනෑ. මේ ශ්‍රී ලංකා ද්වීපය තුළ වඩා වැඩි ජනගහනයක් ඉන්න, වඩා පරිපූර්ණ වුණු පළාත් සභාව මේක නම් එය මීට වඩා අර්ථවත් වෙන්නට ඕනෑ. කරන කථාවන්වල, හැසිරීම පිළිබඳව, විනය සම්බන්ධයෙන්, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා තුළ තිබෙන යම් යම් තත්ත්වයන් තුළ වැඩි සංවේදීභාවයක් තිබෙන්නට ඕනෑ. මේකට අපි එනවා. එක එක්කෙනා එක එක වෙලාවට එනවා. එක එක යෝජනා ගේනවා. කල් තිබෙනවා. එතකොට සභාවේ අදාළ නිලධාරීන් සහ ඇමතිවරු මේවාට සහ සම්බන්ධ වෙන්නේ නැහැ. යෝජනා ගෙනාවට ඒවා පසු විපරම් වෙන්නේ නැහැ. එහෙමනම් අපි මේ දිස්ත්‍රික්කයක් පුරා දුවලා, මුදල් වියදම් කරලා ජනතාවට කියලා ආවා, අපි පළාත් සභාවට යනවා අධ්‍යාපනය ගොඩනඟන්න. පළාත් සභාවට යනවා රෝහල් පද්ධතිය

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

ගොඩනහන්න. අද වනතුරු අපට කරන්න පුළුවන් වුණු දෙයක් නැහැ. අපි කථා කරපු දේවල් සුළඟේ පාවෙලා ගියා විතරයි. නිකමට හරි සටහනක තිබෙනවා, මේවා අපි කථා කළා කියලා. මීට වඩා අර්ථවත් වෙන්න ඕනෑ. උදේට පාසල් යන ළමයාට ප්‍රාථමික පන්ති උදේ 07.30 සිට 11 වනතුරු තිබෙනවා. 5 වසර සිට 12 වසර දක්වා 01.30 වනතුරු තිබෙනවා. 01.30 ට ඇරිලා ශිෂ්‍යයා ගෙදර එනවා. අපේ බිරින්දෑවරු, අම්මා තාත්තාලා උදේ අටට, නවයට ගිහිල්ලා සවස 4.30 ට, 5.00 ට රැකියා අවසන් වෙලා එනවා. මේ මන්ත්‍රීවරුන්ටත් මොකක් හරි ක්‍රමවේදයක් තිබෙන්නට ඕනෑ. මහජන නියෝජිතයන් කියලා මේක අයාලේ යන තැනක් නොවෙයි. මෙතැනට උදේ වාර්තා කරන්න ඕනෑ. හාමාර කරන්න ඕනෑ කාලයක් තිබෙනවා. ඒ අනුව අපි කටයුතු නොකළොත් මේ බස්නාහිර පළාත් සභාව කියන එක මම හිතන්නේ නැහැ, මහජනතාවට වැදගත් වෙයි කියලා. මෙයින් අර්ථකථනය වෙන්නේ තවත් සුදු අලියෙක් කියන එක විතරයි. ඒ නිසා වඩා නිවැරදි තීන්දු ගන්න, තීරණ ගන්න තැනක් වෙන්න ඕනෑ. අපි තරුණ මන්ත්‍රීවරු වශයෙන් පළාත් පාලන ආයතන අත්හැරලා මේ තැනට ආවේ මීට වඩා වගකීමක් ඇතිව වැඩ කරන්න. ඒ නිසා ජ්‍යෙෂ්ඨ ඇමතිවරු, මන්ත්‍රීවරු මීට වඩා ආදර්ශමත් වෙන්න ඕනෑ. සභාව පාලනය කරගෙන යන්න. සභාවේ හැසිරෙන්න. ඒ වාගේම නවකයන් තේරුම් ගන්නට ඕනෑ, තමන් මේ තැන මොනතරම් අභිමතයක් අනුවද කටයුතු කරන්නේ කියලා. කොහෙන් හරි අවසානයේ කඩාගෙන එනවා. කාලය ගත වෙලා ඇවිල්ලා, ගණපූරණය නැහැයි කියනවා. කාලයක් තිස්සේ අපි ලැහැස්ති වෙලා මේ සභාව නියෝජනය කරන්න උදේ එනවා. ඒක කඩාකප්පල් වෙලා යනවා. එහෙමනම් මේ සභාව වැදගත් වෙන්නේ නැහැ. මේවා විසුරුවා හැරලා දාලා මේ රටේ පාලනය එක තැනකට ගෙනැල්ලා පැරැණි ක්‍රමයට පාලනය කරන්න ඕනෑ. අපි වගකීමෙන් කියන්නේ. මීට වඩා අපි අර්ථවත් වෙන්නට ඕනෑ. මේක අපේ වගකීම වෙන්නට ඕනෑය කියලයි මා විශ්වාස කරන්නේ.

අපි අධ්‍යාපනය ගැන කථා කරන කොට මම ඊයේ සියනෑ අධ්‍යාපන පීඨයට ගියා. ඒ පීඨයේ ශිෂ්‍යයන්ට ඉස්සර නියම වේලාවට තමන්ගේ දීමනාව ලැබෙනවා. අද සති ගණන් ප්‍රමාද වෙලා ලැබෙන්නේ. ඒ නිසා මේ අධ්‍යාපන ක්‍රමයේ යම් යම් විෂමතාවයන් ඇති වෙලා තිබෙනවා. ගුරුවරයෙක් වෙන කොට ඔහුගේ මානසිකත්වය ගොඩනැඟෙනවා වාගේම ඈත දුෂ්කර පාසලකට යන කොට ඒ ගුරුවරයාට තිබෙන පහසුකම් ටික ගොඩනැඟෙනවා නම්, ඒ දරුවන්ට සමාන අයිතිවාසිකම් ටික ගොඩනැඟෙනවා නම් මම හිතන්නේ අධ්‍යාපනය වඩා වැදගත් වෙනවා. අද අපේ අත්තනගල්ල ආසනයේ මා නියෝජනය කරන ප්‍රධාන පාසල සංඝබෝධි පාසල. අද අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා වතු පාසල් ගැන කියන කොට අර සංඝබෝධි විද්‍යාලයේ ටකරන් හෝල් තුනක් විතරක් තිබෙනවා. වහින කාලයට වතුරෙන් යට වෙලා ළමයින් ගඩොල් කැට උඩ කකුළ තියාගෙන ඉගෙන ගන්න පන්ති කාමර තවමත් අපේ සංඝබෝධි විදුහලේ තිබෙනවා. එහෙමනම් වතු පාසල්වල මොන තත්ත්වයක්ද කියලා අපි කියන්නට ඕනෑ. ඒ නිසා අපි මේ හැම කෙනාම, ටකරන් හෝල් ගහපු, ඒ වාගේම දර මඩු වාගේ ඒවායේ දරුවන් ඉගෙන ගන්න කොට දරුවන්ගේ මනස තුළ ඇති වෙන්නේ අසමතුළිත තාවයක්.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

හිටපු මහ ඇමතිතුමා මොනවද කළේ?

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

තවත් අය ගැන යම්කිසි නොයෙක් ආකාරයෙන් දරුවන් තුළ මානසික තත්ත්වයන් ඇති වෙනවා. ඒ නිසා සමාන අයිතීන් ඇති වන ආකාරයට හොඳ ගුරුවරුන් පත් කරලා, ඒ දුෂ්කරතා නිම කරලා ගුරුවරුන්ට ඒ කාර්යයන් කරලා දෙනවා වාගේම අපි දන්නවා අද ගුරුවරුන්ට මේ පළාත් සභාව මගින් ලබා දෙන්නා වූ රක්ෂණ ක්‍රමයේත් යම් යම් විෂමතාවයන් ඇති වෙලා අද අසනීපයක් වුණු වේලාවට ගුරුවරයාට ඒ රක්ෂණයවත් ගන්න පුළුවන්කමක් ඇති වෙලා නැහැ. ඒ නිසා වැරදි වුණු තැන් අනන්ත අප්‍රමාණ තිබෙනවා. මේවා නිවැරදි කරලා, අධ්‍යාපන ක්‍රමය වඩාත් ක්‍රමවත්ව, ගුරුවරයාට පහසුකම් සැලසෙන කොට, ළමයාට විනය පද්ධතිය ඇති කරන කොට, ළමයාට අසහනකාරී තත්ත්වයෙන් තොරව පන්ති කාමරය තුළ අධ්‍යාපනය ලබා ගන්න පුළුවන් ක්‍රමයක් බස්නාහිර පළාත ප්‍රමුඛ වුණු මේ ආයතනයේ හැම කෙනාටම ආදර්ශයක් වෙන්න කටයුතු කරන්නය කියලා ගෞරවයෙන් සිහිපත් කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.49 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පිළිතුරු කථාව කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම හිතනවා මේ යෝජනාව පිළිබඳව සභාවේ දැඩි අවධානය යොමු වුණාය කියලා. ගරු මන්ත්‍රීවරු විශාල සංඛ්‍යාවක් තමන්ගේ අදහස් ප්‍රකාශ කළා. ඒ අතර අපි දැක්කා, අධ්‍යාපනයේ අපි දකින සුන්දර කථාවට අමතරව ඊට එහා ගිය මහා ශෝකාන්තයක් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ තිබෙනවා කියලා. අධ්‍යාපනයේ ජාතික විභාගවල කප් ගහලා, එදා වැඩේ එදාම කරලා තමයි මේ ජයග්‍රහණයට ආවා කියලා කොළඹ නගරයේ පාසල්වල අය කියන කොට එදා වැඩේ මාසයක්වත් ගිහිල්ලා කරගන්න බැරි දරුවන් වෙනුවෙන් තමයි මේ සියලු ගරු මන්ත්‍රීවරු හඬ නැඟුවේ. ඒ හරහා තමයි මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන උවමනාව මේ ඇතුළේ මතු වුණේ. ඒ නිසා මම ස්තුතිවන්ත වෙනවා. අධ්‍යාපනයේ අගය දන්න, දරුවෝ ඉන්න, දරුවන්ට ආදරය කරන මන්ත්‍රීවරු රාශියක් මේ යෝජනාවට අද දවසේ අදහස් ප්‍රකාශ කිරීම ගැන. ඒ වාගේම මම කනගාටු වෙනවා. දරුවෝ නැති, දරුවන්ට ආදරය කරන්නේ නැති, දරුවන් අනතුරේ දාලා මහ පාරේ අතරමං කරලා දාලා යන අය මේ යෝජනාව කඩාකප්පල් කරන්න ගත්ත උත්සාහය ගැනත් මම කනගාටු වෙනවා කියන කාරණය මේ වේලාවේ මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව ගැන සාකච්ඡා කරද්දී මේ යෝජනාව පෝෂණය කිරීමේ අදහස් ගණනාවක් මතු වුණා. එහිදී කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, අලුත් ආණ්ඩුවේ යෝජනාවක් තිබෙනවා කියලා නේවාසිකාගාර පහසුකම් හදන්න. විශේෂයෙන්ම වතු පාසල්වල ඉන්න ගුරුවරුන්ට විශාල දුරක් ඇවිදගෙන ගිහිල්ලා පාසලේ උගන්වන්න වන ප්‍රශ්නයට විසඳුමක් විධියට ඒ යෝජනාව ඉතාම කාලෝචිතයි. එහෙම කරන්න පුළුවන් වෙනවා නම්, නේවාසිකාගාර හදලා දෙන්න පුළුවන් වෙනවා නම් ගුරුවරු ඒවායේ නතර වෙලා මේ පාසල්වල බොහොම සතුටින් වැඩ කරයි කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ වාගේම අපේ ස්වාමීන් වහන්සේගේ අනුශාසනාවේදී කිව්වා, මේ යෝජනාව එතැනින් එහාට ගිහිල්ලා දුෂ්කර පාසල් සියල්ලට මේ ප්‍රවාහන පහසුකම සලසන තැනට ගෙනෙන්න කියලා. මම ඒකට එකඟයි. ඒ නිසා මේ යෝජනාව අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කරද්දී ඒ තත්ත්වය ඇති කරන්න අපි යෝජනාව සංශෝධනය කරන්න බලාපොරොත්තු වෙනවා කියන කාරණයත් මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාලයේ මේ දුෂ්කර පාසල්වලට විශාල යටිතල පහසුකම් ප්‍රමාණයක් හදලා තිබෙනවා. ගොඩනැගිලි හදලා තිබෙනවා. පාරවල් හදලා තිබෙනවා. භෞතික පහසුකම් සංවර්ධනය කරලා තිබෙනවා. නමුත් ඒ සියල්ල සංවර්ධනය කරලා තිබුණත් ගුරුවරයෙක් නැත්නම්, ගුරුවරයා ඉන්නේ මානසික සතුටකින් නොවෙයි නම් ඒ පාසල්වල නිවැරදිව අධ්‍යාපනය කෙරෙන්නේ නැහැ. ඒ නිසා තමයි මේ යෝජනාව යෝජනා කෙරුවේ. ඒ නිසා දිගින් දිගටම මතක් කළා වාගේ මේ යෝජනාව නැවත වතාවක් ක්‍රියාත්මක නොවන යෝජනාවක් බවට පත් නොවෙන්න මම ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමා සභාවේ ලේකම්තුමාට නියෝගයක් කරන්නය කියලා. මේ යෝජනාවේ සියලු අදහස් ඇතුළත් හැන්සාඩ් වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශයට ලිපියකින් යොමු කරලා, අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ එක විෂයයක් විධියට මේ යෝජනාව ගන්නය කියන ඉල්ලීම අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කරන්නය කියන ඉල්ලීමත් කරමින්, මේ යෝජනාවට අදහස් දක්වලා, මේ යෝජනාව පෝෂණය කරලා, මේ යෝජනා ක්‍රියාත්මක කිරීම තුළ ලාංකීය අධ්‍යාපනය හදාරන සියලු දූ පුතුන්ට අධ්‍යාපනයේ සම අයිතිවාසිකම් දෙන්න තමන්ගේ අදහස් එකතු කරපු සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මගේ ගෞරවයත් පුද කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි. මම හිතන්නේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවත් එක්කම සභාවේ අදහස් වුණා, සමස්ත මේ සමාජය තුළ සියලු පහසුකම් ඇති දරුවන් එක පැත්තක ඉගන ගන්න කොට මහා දුෂ්කර දුක් කන්දරාවක් එක්ක දරුවන් ඉගෙන ගන්නවා. හැබැයි, මේ දරුවන් දෙගොල්ලෝම ජාතික මට්ටමේ සමාන ප්‍රශ්න පත්‍ර තුනකට උත්තර දෙනවා. ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්න පත්‍රය ඒ කථා කරපු අන්ත දුෂ්කර ඉස්කෝලේ දරුවත්, සියලු පහසුකම් තිබෙන පාසලේ දරුවත් එකම ප්‍රශ්න පත්‍රයට උත්තර ලියනවා.

[ගරු නියෝජ්‍ය සභාපතිතුමා]

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේත් අර අන්ත දුෂ්කර පාසලේ දරුවත්, සියලු පහසුකම් තිබෙන පාසලේ දරුවොත් එක ප්‍රශ්න පත්‍රයට උත්තර ලියන්නේ. මහා දුක් කන්දරාවක්. මහා බේදවාචකයක්. ඒ නිසා ඔබතුමාගේ යෝජනාව ඔබතුමා ඉදිරිපත් කරපු විධියටම අපි සභා ලේකම්තුමා සියලු කරුණුත් එක්ක අවශ්‍ය සියලු තැන්වලට දැනුම් දෙනවා කියන පණිවිඩය ලබා දෙමින්, මෙම යෝජනාවට සභාවේ එකඟතාවය මම විමසනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟ දෙවැනි යෝජනාව අර ගන්නවා. ඒ සඳහා රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව ලබා දෙනවා.

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : II
PRIVATE MEMBERS MOTION: II

## ගම්බද පාසල්වලට පහසුකම් ලබා දෙමින් ගම්බද සිසුන්ගේ අයිතිය සුරක්ෂිත කිරීම
PRESERVING THE RIGHT OF RURAL STUDENT THROUGH THE PROVISION OF FACILITIES TO RURAL SCHOOLS

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"විවිධ නම්, විවිධ වැඩ සටහන් හඳුන්වා දෙමින් ක්‍රම ක්‍රමයෙන් ගම්බද පාසල් වසා දැමීම මගින් ගම තුළ අඩු ආදායම්ලාභී පවුල්වල ජන්මලාභී දක්ෂ දරුවන්ට මනා පාසල් අධ්‍යාපනයක් ලබා ගැනීමට ඇති අයිතිය අහිමි වෙමින් පවතී. ගම්බද පාසල් වැසී යාමෙන් වාහන මගින් දුරින් පිහිටි පාසල්වලට යා නොහැකි ශිෂ්‍යයන් පාසල් අධ්‍යාපනයෙන් සමුගන්නා ප්‍රවණතාවයක්ද දක්නට ඇත. එම හේතුවෙන් දෙමව්පියන්ද දුෂ්කරතා රාශියකට මුහුණ දී ඇත. එහෙයින් ගම්බද පාසල් සඳහා යළි පහසුකම් ලබා දී ගම්බද සිසුන්ගේ අයිතිය සුරක්ෂිත කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමියට විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

[ අ.භා. 12.55 ]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ප්‍රමාණවත් මදි වුණත් අපි අධ්‍යාපනය ගැන කථා කරපු මේ අවස්ථාවේදී මම විශේෂයෙන් මේ සභාවේ අවධානය යොමු කරන්න ඕනෑ. අද මේ සභාවට සම්බන්ධ වන නිලධාරීන් ඒ වාගේම ගරු මන්ත්‍රීතුමන්ලා, ඒ වාගේම සම්බන්ධ වී සිටින සියලුම අය දිහා බැලුවොත් 99% ක් ගම්බද පාසලකින් අධ්‍යාපනය ලබලා, නිදහස් අධ්‍යාපනයෙන් ඒ පහසුකම් ලබාගෙන මේ ස්ථානවලට පැමිණි අය තමයි ඉන්නේ. අපි විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. සපත්තු දෙකක් දාන්නේ නැතිව සෙරප්පු දෙකක් දාගෙන ඉස්කෝලේ ගිහිල්ලා, එහෙම නැත්නම් අණ්ඩ දාපු කළිසම ඇඳගෙන ඉස්කෝලේ ගිහිල්ලා අද උසස් තනතුරුවල ඉන්න බොහෝ දෙනෙකුට අද ගම අමතක වෙලා තිබෙනවා. මේ අය බොහෝදුරට තමන්ගේ දරුවා International ඉස්කෝලයක, එහෙම නැත්නම් ඇමරිකාවේ, ඕස්ට්‍රේලියාවේ උගන්වන්න උත්සාහ කරනවා. ගමේ පාසලට මොකක්ද වෙන්නේ කියලා බලන්නේ නැහැ. ඒ තත්ත්වය එහෙම තිබෙන කොට ගමේ උරුමය, රටේ උරුමය ගැන කථා කරගෙන ආපු සමහරුන්ට මුලයි අගයි පැටලවිලා ජනතාවට ඒ කරුමේ ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ඉතින් මෙහෙම තිබෙන අවස්ථාවකදී මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ශිෂ්‍යයින් 50 ට අඩු පාසල් 1594 ක් බස්නාහිර පළාත් සභාව තුළ හඳුනාගෙන තිබෙනවා. ඉතින් මේකේ අදහස තව ටිකක් කල් යන කොට මේ 1594 වැහිලා යනවා. මේ 1594 ඉගෙන ගන්නේ මම හිතන්නේ, මාසික ආදායම රුපියල් 10,000/- ක්වත් ලබන්නේ නැති පවුල්වල දරුවන්. ඉතින් මෙම පවුල්වල

තමයි දක්ෂ දරුවන් ඉන්නේ. ඇළේ දොළේ ඇවිදලා, රටේ තොටේ ප්‍රශ්න දිහා බලලා, ඒ ජීවන ප්‍රශ්නවලට හැල හැප්පිලා හොඳ අත්දැකීම් තිබෙන දරුවන් තමයි මේ ගමේ ඉන්නේ. එහෙම නැත්නම් මැක්ඩොනල් එකෙන් කාලා, KFC එකෙන් කාලා කාර් එකේ යන අය නොවෙයි ගමේ ඉන්නේ. ඒ නිසා අපි විශේෂයෙන්ම අධ්‍යාපන ගරු ඇමතිතුමා මෙතැන නැති එක ගැන කනගාටු වෙනවා.

අද පාසල්වලට යන කොට සිංහල උගන්වන ගුරුවරයා නැහැ. නැත්නම් ඉංග්‍රීසි උගන්වන ගුරුවරයා නැහැ. එහෙම නැත්නම් ගණිතය උගන්වන ගුරුවරයා නැහැ. දැන් පසුගිය කාලවකවානුවේ අපි ක්‍රීඩා උත්සවවලට සහභාගි වන කොට එක්කෝ වැසිකිළි පද්ධතිය නැහැ. එහෙම නැත්නම් ගොඩනැගිල්ල කඩන් වැටෙන්න එනවා. ගිහිල්ලා බලනකොට ප්‍රශ්න රාශියක් අපට එකතු වෙනවා. මම කියන්න කැමැතියි. අපි මේක ආණ්ඩු පක්ෂයට ඇඟිල්ල දික් කරන්න යන්නෙත් නැහැ. දැන් පවතින මධ්‍යම ආණ්ඩුවට ඇඟිල්ල දික් කරන්න යන්නෙත් නැහැ. නමුත් අධ්‍යාපනය සම්බන්ධව වගකිව යුතු පිරිසක් ඉන්නවා. අපි එක එක්කෙනාට මඩ ගහනවා නොවෙයි. මේ අවස්ථාවේදී අපි දැනගන්නට ඕනෑ, මේ අධ්‍යාපනය ලබන පාසල් ටික වැහිලා ගියොත් අපි හිර ගෙවල් ටිකක් විවෘත කළා වෙනවා. එහෙම නැත්නම් අර මම කිව්වා වාගේ කරුම ගෙවනවා කිව්ව වාගේ පිරිසක් බිහි කරලා ඒ කරුමේ ජනතාවට ගෙවන්න සිදු කරනවාද? යම්කිසි බුද්ධි මට්ටමක් තිබෙන, ප්‍රඥාවක් තිබෙන, බුද්ධිමත්ව වැඩ කරන්න පුළුවන් පිරිසක් බිහි කරන්න අපි දායක වෙනවාද කියන එක කල්පනා කරන්න ඕනෑ.

විශේෂ කොටම අපි බැලුවාම අද හැම තැනම ඉන්නේ වැඩ බලන විදුහල්පතිවරු. පාසල්වල ක්‍රමවේදයක් නැහැ. අධ්‍යාපන අධ්‍යක්ෂවරු වැඩ බලනවා. ඒ කියන්නේ ක්‍රමවේදයක් නැහැ. සුදුස්සෝ වෙනම පැත්තකට වෙලා ඉන්නවා. උපාධිධාරී අය ඉන්නවා. අඩු ගණනේ ඔවුන් අරගෙන මේ පාසල්වල උගන්වන්න දාන්න ඕනෑ. සමහර තැන්වල ස්වේච්ඡා ගුරුවරු අරගෙන උගන්වනවා. ඒ අයට රුපියල් 5000 ක් වත් ගෙවා ගන්න පාසලට වත්කමක් නැහැ. මේ රුපියල් 50/- ගණනේ ළමයෙක්ගෙන් එකතු කළොත් සල්ලි එකතු කළා කියලා ගුරුවරයාව විසික්කරලා දානවා. ඉතින් මෙවැනි අවාසනාවන්ත ඉරණමකට අද පාසල් පද්ධතිය ගොදුරු වෙලා තිබෙනවා. ඉතින් මම විශේෂයෙන්ම මේ සභාවේ අවධානය යොමු කරන්නේ - කාලවේලාව මදී. අපේ කලාප අධ්‍යාපන කොට්ඨාශවල සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබපු පාසල් රාශියක් හය වසර පන්තියට සීමා කරලා ඒවත් කප්පාදු කෙරුවා. දැන් අද වන කොට හයෙන් එහාට මේ ළමයා කොහේද දාන්නේ කියන ප්‍රශ්නයෙන් දෙමව්පියන් අතරමං වෙලා ඉන්නවා. සභාවට එන කොට කථා කරන්න කවුරුත් නැහැයි කියලා මෙතැන ගණපූරණ ප්‍රශ්න එනවා. එතකොට මේ අම්මලාගේ හිතේ, තාත්තලාගේ හිතේ තිබෙන ප්‍රශ්නය පොලීසියට ගිහින් කියන්නද? එහෙම නැත්නම් කාටද ගිහින් කියන්නේ? මෙතැන තමයි කථා කරන්න තිබෙන තැන. පළාත් සභාව තමයි පරිපාලනයට වග කියන්න ඕනෑ තැන. එහෙමනම් මේ ප්‍රශ්නය අපි කථා කරන කොට, නිලධාරීන් අහන් ඉන්න කොට, ඇමතිතුමා අහන් ඉන්න කොට ප්‍රශ්නය විසඳන්න උත්සාහ කරනවා. ඒකයි අපි මේ ප්‍රශ්න අරගෙන මෙතැනට එන්නේ. ඒ නිසා මේ සෑම කෙනෙක්ම අවබෝධ කරගන්න ඕනෑ. ඡන්දයක් ගන්න වෙලාවට උරුම ගැන කථා කරලා වැඩක් නැහැ. මේ ජනතාවට අයිති දේ. ජනතාවගේ උරුමය මෙතැන ආරක්ෂා කරන්න ඕනෑය කියන මතක තියා ගන්න ඕනෑ.

එහෙමනම් මම විශේෂයෙන්ම කියනවා. මේ ප්‍රාථමික පාසල් වශයෙන් කඩලා බිදලා දාපු මේ පාසල් පද්ධතිය නැවත සාමාන්‍ය පෙළ දක්වා, උසස් පෙළ දක්වා උගන්වන්න පුළුවන් ආකාරයට ගම්බද පාසල ගෙනි යන්නට ඕනෑ. ඒ ගම්බද පාසලේ පිවිතුරු දරුවෙක් තමයි සමාජයට උරුම කරන්නේ. එහෙම නැත්නම් ඇට්ට කුණා වුණු, කපටිකම්වලින් පිරුණු නගරයේ තිබෙන මත්ද්‍රව්‍ය වසංගතයට ගොදුරු වුණු දරුවෙක් නොවෙයි. බොහොම පිරිපුන්, බොහොම පිරිසිදු, ඒ වාගේම මනස පිරිසිදු දරුවෙක් තමයි සමාජයට දායාද කරන්නේ. ඒ අය තමයි සමාජ අසාධාරණය වෙනුවෙන් කවදා හරි පෙනී ඉන්නේ. එහෙම නැත්නම් වැල යන පැත්තට මැස්ස ගහන අය තමයි පාසල්වල බොහෝදුරට බිහි කරන්නේ. මොකද, යම්කිසි දෙයක් විවේචනය කරන්න, යම්කිසි දෙයක් වෙනුවෙන් පෙනී සිටින්න පිට කොන්දක් නැහැ. සමහර පාසල්වල පිට කොන්ද කඩනවා. ඉතින් අපි කියනවා, ඒ ගමේ පාසලෙන් පිට කොන්දක් ඇතිව ආපු අය තමයි බහුතරයක් මෙතැන ඉන්නේ. සියලුදෙනාටම මම කියනවා. තමුන්නාන්සේලාට ඒ ජවය දුන්නු පුංචි පාසල ගැන මතක් කරලා මේ පාසල් පද්ධතිය නගා සිටුවන්න සෑම කෙනෙක්ම අපේ යෝජනාව වෙනුවෙන් තමුන්ගේ අදහස දක්වන ගමන් තමුන්ට පුළුවන් දායකත්වයක් දීලා මේ සඳහා අපත් එක්ක ඒ ගමනට එකතු වෙන්න, මේ ගමනට සහාය දෙන්න කියන ඉල්ලීම කරමින් නිහඬ වෙනවා.

[ අ.භා. 01.00 ]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාවට වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. මෙම යෝජනාව සහ මීට පෙර යෝජනාව ගැන බලද්දී අපි දන්නවා පසුගිය අවුරුදු 20 තුළම තිබුණේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ රජයක්. ආණ්ඩුවක්. පළාත් සභාවක්. අද මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාවත්, මේ යෝජනාවත් අද අපි ගන්නේ අවුරුදු 20 ක් තිස්සේ මේ රජයන් තුළින් කරගන්න, පළාත් සභාව තුළින් කරගන්න බැරි වුණු දේවල් ගැන තමයි අද අපි මේ කථා කරන්නේ. අද අපි සන්තෝෂ වෙනවා, අඩුම ගණනේ පසුගිය පළාත් සභාව තුළ, අවුරුදු 20 තුළ, ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා අධ්‍යාපන ඇමතිකම හොබවමින් හිටපු කාලය තුළ ගොඩක් දේවල් අපට මේ පළාත් සභාවේ කිව්වා. පාසල්වලට මෙච්චර කළා. මේවා හැදුවා. බලන් යද්දී ඒගොල්ලෝම අද කියනවා. මේවාවල ගොඩක් දේවල්, ඉතාමත් අවම වශයෙන් ලැබෙන්න තිබෙන දේවල් ටිකත් අද වන කොට ලැබිලා නැහැයි කියන එක තමයි අද අපට පැහැදිලි වුණේ. කොහොම හරි දැන් මේකට අවධානය යොමු වෙලා තිබෙන අවස්ථාවක අපි දැනට දන්න තරමින් තව වැඩි කාලයක් යන්න ඉස්සෙල්ලා මේ අධ්‍යාපනයට විශාල මුදලක් ලැබෙන්න නියමිතව තිබෙනවා. අපි දන්නෙත් නැති වුණාට දැනටමත් අධ්‍යාපනය වෙනුවෙන් අපේ සමහර පාසල්වලට රේඛීය අමාත්‍යාංශය හරහා මුදල් ලැබිලා තිබෙනවා.

උදාහරණයක් වශයෙන් අපි කිව්වොත් පාසල්වල වැසිකිළි, කැසිකිළි පහසුකම්වලට විශාල මුදලක් දැනටමත් පාසල් පද්ධතියට ගිහිල්ලා තිබෙනවා. මේ හුඟක් දේවල් අද ලැබෙන්නේ මම හිතන්නේ මේ ඇති වුණු අර සමහර වේලාවට කිව්වානේ, ජනාධිපතිතුමා කියනවා, සල්ලි සඟවාගෙන කොහොමද කරන්නේ කියලා. දැන් මේකෙනුත් පැහැදිලි වෙන්නේ, මේ කෙරුවයි කිව්වාට මොනවද කළේ කියලා දැන් ගොඩක් දෙනෙක් දන්නේ නැහැ. අද වන කොට කොහොම හරි පාසල් පද්ධතිය තුළ යම්කිසි වර්ධනයක් දකින්න ලැබෙනවා. මම හිතන්නේ, ඉදිරියේදී ඉතාමත් සීඝ්‍රයෙන් ඒ අවශ්‍යතාවයන් ඉටු කරගන්න, ඒ අවශ්‍ය මුදල් ලැබෙනවයි කියන එක අපට විශ්වාසයක් තිබෙනවා. හැබැයි ප්‍රශ්නයකට තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා ක්‍රියාත්මක වෙද්දී, මේ පළාත් සභාව හරහා හුඟක් වෙලාවට මේ පළාත් සභාවල ඉන්න මන්ත්‍රීවරු ඒ අමාත්‍යාංශවල උපදේශක කාරක සභාවල හිටියාට මේවාට සහභාගී වෙන්නේ නැහැ. දැන් ජා-ඇළ කමිටුවට සහභාගී වෙන්නේ, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමයි, මමයි. අපේ ඩිල්ෂාන් ගරු මන්ත්‍රීතුමා ඉඳලා හිටලා සහභාගී වෙනවා. අනික් මන්ත්‍රීවරු ඇවිල්ලා කථා කළාට මේවාට සහභාගීත්වයක් නැහැ. මීගමුව කලාපය ගත්තත් එහෙමයි. ගොඩක් දෙනෙකුගේ සහභාගීත්වයක් මේවාට නැහැ. ඉතින් මන්ත්‍රීවරුන් මෙයට වඩා මේවාට අවධානය යොමු කළොත් මම හිතන්නේ, අපට අවශ්‍යතාවයන් ටික ඉෂ්ට කරගන්න පුළුවන්. මොකද, අපේ පාසල දියුණු කරගන්න අපට අවශ්‍යතාවයක් තිබෙන්න ඕනෑ. දැන් ජා-ඇළ පාසල්වල නම් මම හිතන්නේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් හැම තැනින්ම රිංගලා, කෑ ගහලා කොහොම හරි ඒ අවශ්‍ය මුදල් ගන්නවා. අපිත් කොහොම හරි දැන් ඒ අවශ්‍ය මුදල් ටික ලබා ගන්න කටයුතු කරගෙන යනවා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කථා කළාට අවුරුදු 20 ක් තිස්සේ තිබුණු මේ ආණ්ඩුව පෙරළිලා අවුරුද්දක්, එකහමාරක් යනතුරු ඉන්න ඕනෑ එතුමාට මේ ගැන කථා කරන්න. එතුමාට හිටපු පළාත් සභාවේදී මේක කරගන්න බැරි වෙලා තිබෙනවා. ඉතින් ඒකෙන් පැහැදිලිව පෙනෙන්නේ, ඒ තිබුණු පළාත් සභාව ඉතාමත් අසාර්ථක පළාත් සභාවක් කියලා අපට කියන්න තිබෙන්නේ. තවමත් මේ පළාත් සභාවේ බලය තිබෙන්නේ අපට නොවෙයි. ඉතින් මෙවැනි යෝජනාවක් ගෙනාවේ කුමන අරමුණකින්ද කියන එකත් අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. සද්භාවයෙන් යෝජනාවක් ගෙනෙනවා නම් මෙතුමන්ලාට තිබුණා - තමන්ගේ මහ ඇමතිතුමා හිටියා. අධ්‍යාපන ඇමතිකම හොබවපු ඇමතිවරයා. ප්‍රසන්න රණතුංග ඇමතිවරයා හැටියට අපි හිතුවා මේ කියපු විධියට පාසල්වල අඩුපාඩු කිසිවක් නැතිව ඇති කියලා. එවැනි පාසල් පද්ධතියක් අපට තිබෙන්නේ කියලා. නමුත් දැන් බලාගෙන යද්දී ගුරු හිඟය ඉතාමත් විශාල වශයෙන් මේ පාසල්වල පවතිනවා. අත්‍යවශ්‍ය පහසුකම් ටිකවත් අද සමහර පාසල්වලට නැහැ.

අපි දන්නවා, මොනවා කිව්වත් සමහර පාසල්වල මීට ඉස්සෙල්ලත් මම කිව්වා. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මේකට එහෙම නොවෙයි කියලා කිව්වා. අද සමහර පාසල්වල ළමයින්ට ඉඳගන්න ඩෙස් බංකු ටිකවත් නැහැ. මෙවැනි විශාල ප්‍රශ්න පළාත් සභා පාසල්වල තිබෙනවා.

ඉතින් මේවාට උත්තර සොයන්න අපේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය අවශ්‍ය වෙනවා. ඉතින් ඒක නිසා අද උදේ මේ විවාදය, මේ යෝජනා දෙක ගෙනෙද්දී අර මන්ත්‍රීවරයෙක් කිව්වා, මේක කඩාකප්පල් කරන්න ගණපූරණය ගෙනාවා කියලා. සමහර පක්ෂවලට කඩාකප්පල් කරන්නේ නැතිව පැවැත්මක් නැහැ. ඒ වාගේ කුඩා පක්ෂ ගොඩක් මේ රටේ තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණත් එහෙමයි. අර්බුදයක් ඇති කරලා තමයි තමන්ගේ මතවාදය රට තුළ ගෙනි යන්නේ. මේ රජය දිනවන්න වැඩ කළ ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවේ එක හවුල් කාරයෙක්. හැබැයි, ඒක පත් කරලා ඉවර වෙලා, ඒකට විරුද්ධව ගිහින් කථා කරනවා. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ ආණ්ඩුව කාලයේත් ආණ්ඩුවට හේත්තු වෙලා, ටික කාලයක් ගිහින් එළියට ඇවිල්ලා ඒක විවේචනය කරනවා. ඒකේ පැවැත්ම තිබෙන්නෙ එතකොටයි. නැත්නම් මේ පක්ෂවල පැවැත්මක් නැහැ. ඉතින් ඒක තමයි ඇත්ත කථාව. මේකට සහභාගී වෙලා, මේකත් එක්ක එකතු වෙලා ඒ ගමනට උදව් කරන්න නොවෙයි ඉන්නේ. කට්ටියක්ව පත් කරලා -

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යෝජනාවට අදාළව නොවෙයි කථා කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔව්. ඉතින් හප්පලා ගියාම අදාළ නැහැ නේ? කවුද හප්පලා ගියේ කියලා සොයා ගන්න බැහැ නේ?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ආ... ලංකාවේ පළමුවැනි Accident එක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පළමුවැනි Accident එකද? ඒ කියන්නේ වෙලා තිබෙනවා. මේක පළමුවැනි එකලු. පළමුවැනි එක වුණත්, දෙවැනි එක වුණත් හැප්පුවා නම් හැප්පුවා නේ? නීතිය කාටත් එකයි. ඔය නීතිය හෙළ උරුමයටත් එකයි. යූ.ඇන්.පී. එකටත් එකයි. ජනතා විමුක්ති පෙරමුණටත් එකයි. සන්ධානෙටත් එකයි.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

පුදුම අමාරුවක් නේ තිබෙන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් ඔබතුමියම තමයි කිව්වේ පළමුවැනි පාර තමයි වුණේ කියලා. ඔබතුමියම තමයි කිව්වේ පළමුවැනි පාර හැප්පුවේ කියලා. අපි නොවෙයි කිව්වේ. ඔබතුමියගේ නායකයා වෙනුවෙන් ඔබතුමියම තොප්පිය දා ගත්තා. ඒකට අපට කරන්න දෙයක් නැහැ. අපි දන්නවා, හෙළ උරුමයේ අය බොරු කියන්නේ නැහැයි කියලා. ඔබතුමියගේ අවංකභාවයට අපි ඉතාමත්ම ස්තූතිවන්ත වෙනවා. අවංක වෙලා වැරැද්ද පිළිගත්තා. ඒක හොඳයි. හැබැයි, එහෙම කරලා ඉවර වෙලා හැංගිලා හිටියා කියලා සමාවක් හම්බ වෙන්න විධියකුත් නැහැ.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

නීතිය ක්‍රියාත්මක වෙයි. ඔබතුමා කටවහගෙන ඉන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නීතිය ක්‍රියාත්මක වෙනවා නම් මෙලහකට ක්‍රියාත්මක වෙලා තිබෙන්න එපැයි. නීතිය මෙච්චර කල් ක්‍රියාත්මක වුණෙත් නැහැ. නීතිය අද හරියට ක්‍රියාත්මක වෙන්නෙත් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නීතිය ක්‍රියාත්මක වෙන්නේ කොහේද? මේ සුළුතරයක් ඉන්න ජේ.වී.පී. එකේ, හය දෙනෙක් ඉන්න පාර්ලිමේන්තුවක විපක්ෂයේ සංවිධායකකම ඒ අයට දුන්නාම කොහොමද නීතියක් තිබෙන්නේ. ඔබතුමන්ලාටත් ලැජ්ජා නැති වෙන්න ඕනෑ, ඔය වාගේ තනතුරක් ගන්න. හය දෙනෙක් ඉඳගෙන.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නීතිය ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. නැහැ. මෙතැන අපේ ආණ්ඩුවක් නැහැ. හොඳට මතක තියා ගන්න. අද ඇත්තටම වෙලා තිබෙන්නේ මේ ආණ්ඩුව කාගේද කියලා කවුරුවත් දන්නේ නැහැ. අද ඇත්ත කථාව ඒකයි. අද යූ.ඇන්.පී කාරයා අපට බණිනවා, ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් තියාගෙන වැඩ කරන්නේ නැහැයි කියලා. ශ්‍රී ලංකා මන්ත්‍රීවරුන්ට බණිනවා උඹලා ආණ්ඩුව අරගෙන අපට වැඩ කරන්නේ නැහැයි කියලා. අද ආණ්ඩුව කරන්නේ කවුද කියලා දන්නේ නැහැ. ඇත්ත කථාව ඒකයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ආණ්ඩුව හොයනවා කාගෙද කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇත්ත කථාව ඒකයි. ආණ්ඩුව හොයනවා කාගෙද කියලා. අපිත් හොයනවා කාගෙද කියලා.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ආණ්ඩුව ඉතින් ඉන්දියාවෙයි. ඇමරිකාවෙයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ආණ්ඩුවත් හොයනවා කාගෙද කියලා. අපිත් හොයනවා කාගෙද කියලා.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මේ ආණ්ඩුව ඉන්දියාවෙයි. ඇමරිකාවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මිනිස්සුත් හොයනවා කාගෙද කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම හිතන්නේ හෙළ උරුමයේ ඒ ඇමතිතුමයි, රාජිත ඇමතිතුමයි ඇරෙන්න කවුරුත් දන්නේ නැහැ, ආණ්ඩුව කාගෙද කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජනතාවත් හොයනවා ආණ්ඩුව කාගෙද කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් මම හිතනවා මෙහෙම ආණ්ඩුවක් තිබුණාට අඩුම ගණනේ අපට එක්සත් ජාතික පක්ෂය හැටියට තිබෙන ඇමතිකන් ටිකෙන් හරි අපි මේ අධ්‍යාපනය වෙනුවෙන් විශාල මුදලක් යොදවන්න දැනටමත් සැලස්මක් හදලා තිබෙනවා. ඒ මුදල් ටික එක්සත් ජාතික පක්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය හරහා මේ පළාත් සභාව හරහා වැඩි කාලයක් යන්න පෙර විශාල මුදල් ප්‍රමාණයක් ලැබෙනවා. ඒ ලැබෙද්දීත් ඒකත් යන්නේ මේගොල්ලන්ගේ අතින් තමයි. ඒකෙත් වාසිය අපට එන්නේ නැහැ. ඒකෙත් ලකුණු දාගන්නේ මේ අය. මොකද, පළාත් සභාව මේ අයගෙ නේ. අන්තිමට කියන්නේ අපි කළයි කියලා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

බෙහෙත් ටිකක් ගන්න. ඉරිසියාව තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කිසිම ඉරිසියාවක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න. වැඩි කාලයක් දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි කනගාටු වෙනවා. ඔබතුමිය වැනි කෙනෙක් අධ්‍යාපනය ගැන මෙවැනි යෝජනාවක් යද්දී මේක කඩාකප්පල් කරන්න, එදා තමන්ගේ සෞඛ්‍ය අමාත්‍යාංශයට විරුද්ධව ගණපූරණය ගෙනාවා කියලා, අද ඒ ඇමතිකම රැක ගන්න බැරි වුණු නිසා අද මේ මෙතැන අධ්‍යාපනය වෙනුවෙන් දුප්පත් දරුවන් වෙනුවෙන් -

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

අපේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාගේ සීට් එකට ගිහිල්ලා කථා කරන්න.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ජනතාව වෙනුවෙන් කථා කරන්න විනාඩි 05 ක් ඉල්ලුවා. එතකොට වෙලාව නැහැයි කිව්වා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දුප්පත් දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කථා කරද්දී ඒක කඩාකප්පල් කරන්න මේ හෙළ උරුමයේ ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත්වීම ගැන අපි කනගාටු වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොහොම ස්තුතියි.

[ අ.භා. 01.11 ]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මගේ කථාව පටන් ගන්න කලින් බස්නාහිර පළාත් සභාවේ මුලින්ම හිටපු අධ්‍යාපන ඇමති ගරු සුරනිමල රාජපක්ෂ මැතිතුමා පිළිබඳ ශෝක යෝජනාව ඉදිරියට ගෙනෙන තුරු කියන්න ඕනෑ, පසුගිය දවසක එතුමා අභාවප්‍රාප්ත වුණා. මේ පළාත් සභාවේ මුල්ම අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් සුරනිමල රාජපක්ෂ මැතිතුමා පාසල්වලට කරපු සේවය පළාත් සභාවට මතක් කරමින්, ඒ එක්කම මේ පළාත් සභාව වෙනුවෙන් එතුමාගේ අවමංගල්‍යය වේලාවේදී එක බැනර් එකක්වත් ප්‍රදර්ශනය කරන්න අපට හැකියාවක් ලැබුණේ නැහැ, බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන්වත්. නමුත් සුරනිමල රාජපක්ෂ මැතිතුමා බස්නාහිර පළාතට කරපු සේවය මම හිතන්නේ, ඉදිරියේදී සභාවට ශෝක යෝජනාවක් ගෙනැල්ලා එතුමා ගැන මතක් කරලා, එතුමාට ගෞරවය ප්‍රකාශ කරමුයි කියන ඉල්ලීම කරමින් මගේ කථාව පටන් ගන්නවා.

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ගෙනෙන ලද යෝජනාව ඉතාමත්ම කාලෝචිත යෝජනාවක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව ආරම්භ වෙලා අවුරුදු 27 ක්, 28 ක් විතර වෙනවා. මේ අවුරුදු 27, 28 පුරාවටම බස්නාහිර පළාතේ පාසල් අධ්‍යාපනය භාරව ක්‍රියා කරන - මෙම දිස්ත්‍රික්ක තුනේම ජාතික පාසල් තිබෙන්නේ 50 ක්, 60 ක් විතර ප්‍රමාණයක් තමයි. අනිකුත් සියලුම පාසල් අයිති වෙන්නේ පළාත් සභාවට. අවුරුදු 25 ක්, 30 ක් ප්‍රධාන අමාත්‍යවරු කිහිප දෙනෙක් යටතේ, අධ්‍යාපන අමාත්‍යවරු කිහිප දෙනෙක් යටතේ විශාල කාර්ය භාරයක් කළත් තවමත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ පාසල්වලට පහසුකම් දෙන්න අපි අසමත් වෙලා තිබෙනවා. පළාත් සභාවේ අයවැය ලේඛනයෙන් වෙන් කරපු මුදල්වත් පසුගිය අවුරුදුවල වියදම් කරන්න බැරිව ඒ මුදල් නැවත වතාවක් භාණ්ඩාගාරයට ගිහින් මේ පළාත් සභාවේ මුදල් නිසි ලෙස පරිහරණය කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේ අවස්ථාවලදී විවිධ දේශපාලන මහ ඇමතිවරු, අධ්‍යාපන ඇමතිවරු මේ පළාත් සභාවේ පාසල් දියුණු කරන්න යන ගමනේදී මම දැක්කා, පසුගිය කාල සීමාව තුළදී විවිධ යෝජනා ගේනවා. සුරනිමල රාජපක්ෂ මැතිතුමා නවෝදා පාසල් ව්‍යාපෘතිය ගෙනාවා. ඒ එක්කම අපේ හිටපු ගරු මහ ඇමතුමා මිතුරු ළමා පාසල් ව්‍යාපෘතිය ගෙනාවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සමහර පාසල්වල ව්‍යාපෘති ගේන කොට ඒකෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය දියුණු කරන්න හදනවා අපි දැක්කේ නැහැ. අපි දැක්කේ, පසුගිය කාලයේ ඒ ප්‍රධාන අමාත්‍යවරුන්ගේ, පළාත් සභා අධ්‍යාපන අමාත්‍යවරුන්ගේ මැතිවරණ ව්‍යාපාරවලට තමයි මේ සමහර සංකල්ප යොදා

[ගරු මංජුල ප්‍රසන්න සම්පත්]

ගත්තේ. මම දැක්කා, මිතුරු ළමා පාසල් ව්‍යාපෘතියේදී මගේ මැතිවරණ කොට්ඨාශයේ පාසල් කිහිපයක් මේ මිතුරු ළමා පාසල් ව්‍යාපෘතියට ඇතුළත් කරලා එක පාරටම ඒවා අහෝසි කළා. මම නියෝජනය කරන මගේ ගම්මානයේ පාසලක් තිබෙනවා. ඒක 1 සිට 10 දක්වා තිබුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රුපියල් ලක්ෂ 05 ක් දුන්නා - 1 සිට 5 දක්වා අඩු කළා. එතැන් සිට ඒ පාසල් ගැන සොයන්නේ නැහැ. ඉතින් ඒ වාගේම සමහර පාසල්වලට ගුරුවරුන් අඩුයි. සමහර පාසල්වලට පරිගණක අඩුයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා කිව්වා වාගේ මේ රටේ සියලුම දරුවන් මුහුණ දෙන්නේ එකම විභාගයකට. ශිෂ්‍යත්ව විභාගය. සාමාන්‍ය පෙළ විභාගය. උසස් පෙළ විභාගය. අපේ රටේ සියලුම පාසල් පද්ධතියේ ඉගෙන ගන්න දරුවන් මේ විභාගයට මුහුණ දෙන කොට ගමේ ඉන්න කුඩාම පාසලේ දරුවාට අසාධාරණයක් වෙනවා. කොළඹ ඉන්න ඉහළම ළමයාට සියලු පහසුකම් තිබෙනවා. නමුත් අපි, බස්නාහිර පළාත් සභාව වශයෙන් මෙයිට වඩා මේ පිළිබඳව සොයා බලා බස්නාහිර පළාත් සභාවේ පාසල්වලට විශාල අනුග්‍රහයක් දක්වන්න ඕනෑ.

ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි අපි දැක්කා. සමහර දෙමව්පියන්ගේ දරුවන්ට පාසල් යන්න ඇත්තටම ඒ දරුවා එක ෂර්ට් එකයි තිබෙන්නේ. ඒ දරුවාට එක ගවුමයි තිබෙන්නේ. ඒ වාගේ දුප්පත් අසරණ දෙමව්පියන්ගේ දරුවන්ට තමන්ගේ අධ්‍යාපනය දියුණු කරගන්නට මේ පළාත් සභාව හරහා යම්කිසි සහයෝගයක් ලබා දෙනවා නම් ඒක ඉතාමත්ම වටිනවා. ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දැක්කා මේ පළාත ඇතුළත වීදි දරුවන් 5000 ක් විතර ප්‍රමාණයක් ඉන්නවා. ඒ වීදි දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න පහසුකම් නැහැ. ඒ වාගේ පහසුකම් ලබා දෙන්නට මේ බස්නාහිර පළාත් සභාව හරහා ගරු මහ ඇමතිතුමා සහ පළාත් අධ්‍යාපන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන අතර, මේ අධ්‍යාපනය ලබා ගන්න බැරි වීදි දරුවන්ට අධ්‍යාපනය ලබා ගැනීමට ක්‍රමයක් සකස් කරලා මේ පළාත් සභාව හරහා ක්‍රමවත් සැලසුමක් ලබා දෙන්නය කියන ඉල්ලීමත් කරමින් - ඔබතුමා මගේ මුහුණ දිහා බලනවා. වැඩි වෙලාවක් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ඒ නිසා විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. කවුරු හරි මේ පළාත් සභාවේ කෙනෙක් අභාවප්‍රාප්ත වුණොත් මේ පළාත් සභාවේ නිලධාරී මහත්වරුන්ගේ හරි අවධානයට යොමු කරලා, අඩුම ගණනේ ඒ මනුෂ්‍යයාට කෘතගුණ සලකන්නට මේ පළාත් සභාව හරහා බැනර් එකක් හරි ප්‍රදර්ශනය කරන්නට අවස්ථාවක් ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරමින්, සපුගස්කන්ද විශාඛා විද්‍යාලය ආරම්භ කළේ, සුරනිමල රාජපක්ෂ මැතිතුමා සහ වර්තමාන අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා. ඒක නිසා අපි මේ පළාත් සභාවේදී සුරනිමල රාජපක්ෂ මැතිතුමාට මගේ ගෞරවය පුද කරමින්, මේ පළාත් සභාවේත් ගෞරවය පුද කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 01.15 ]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාවට වචනයක් හරි ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම අතිශය සන්තෝෂ වෙනවා. එතුමිය ඉතාමත් යහපත් යෝජනාවක්, යහපත් සිතුවිල්ලක් තුළ මේ සභාවට ඉදිරිපත් කළත් මගේ මතය එතුමියගේ මතයට පොඩ්ඩක් පරස්පර වීම ගැන පොඩ්ඩක් කනගාටු වෙනවා. මොකද, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විවිධ ගරු මන්ත්‍රීවරු විවිධ අදහස් ඉදිරිපත් කළා. පසුගිය ඉතිහාසයේ විශාල කාලපරිච්ඡේදයක් මේ පළාත් සභාව එක්සත් ජනතා නිදහස් සන්ධානය විසින් පාලනය කරලත් අධ්‍යාපනයේ ප්‍රශ්න විසඳිලා නැහැයි කියන තේමාව යටතේ තමයි වැඩිපුර කථා කළේ. අධ්‍යාපනය නොවෙයි ඕනෑම විෂයයක් දේශපාලනීකරණය කරගැනීමේ ස්වභාවය සාමාන්‍ය සිරිත. ඒක කථා කරන වචන ඇතුළේ දේශපාලන වශයෙන් තමන්ගේ ප්‍රතිවිරුද්ධ පිළට ගහන්න පුළුවන්ද කියන එක තමයි හැම තිස්සේම ඉව අල්ලලා බලන්නේ. නමුත් මේ වාගේ ගැඹුරු විෂයයක් ගැන කථා කරන කොට එය එතරම් වලංගු වන්නේ නැහැ. මොකද, රටේ අනාගතය පිළිබඳ දැවැන්ත භාර දූර තීන්දුවක්, තීරණයක් ගන්න විෂයයක් සම්බන්ධ කාරණාවක් නිසා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපනය පිළිබඳව වඩාත්ම කාලෝචිත, වඩාත්ම ප්‍රායෝගික ක්‍රමවේදය ඉදිරිපත් කළේ මේ රටේ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා. ඒක පිළිබඳ විවාදයක් නැහැ. ඒක එක්සත් ජාතික පක්ෂයටයි, අපටයි දෙපැත්තටම එකට ඉඳලා කථා කරන්න

පුළුවන් ප්‍රශ්නයක්. එතුමා එක්සත් ජාතික පක්ෂයේ ඉඳලා තමයි ඒ යෝජනාව, ඒ අධ්‍යාපන විප්ලවය මේ රටේ කළේ. මධ්‍ය මහ විද්‍යාල, අධ්‍යාපන ක්‍රමවේදය ඉතාමත් සාධාරණ විධියට දරුවාට සමාජයේ සම අවස්ථාවන් අධ්‍යාපනයෙන් ලබා දීම ඉතාමත් ප්‍රායෝගික වැඩ පිළිවෙළක්. ඒක කලකට පස්සේ වෙනත් විධියකට ද්විතික භාෂා සංකල්පය හැටියට අලුත් ආණ්ඩුව එදා ඉදිරිපත් කළා. ඒ ගොල්ලෝ පටන් ගත්තා. නමුත් මේ සංකල්පය සමානයි. මේකේ ඇති වෙනසක් නැහැ. 1 සිට 5 දක්වා වෙනම පාසල් පද්ධතියක්. ඉන් ඉහළ අධ්‍යාපනය සඳහා වෙනම පාසල් පද්ධතියක්. සාමාන්‍යයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන විද්‍යාවත්, ජීව විද්‍යාවත් අතර මහා දැවැන්ත සම්බන්ධයක් තිබෙනවා. මොකද, අධ්‍යාපනය හදාරන්නේ ජීවීන් නිසා. ජීව විද්‍යාව අනුව දරුවන්ගේ දැවැන්ත වෙනස්කම් වයස අවුරුදු 10 ත්, 14 ත්, 16 ත් අතර සිද්ධ වෙනවා. මේ කාල වකවානුව තුළ දරුවන් එක ගොඩේ තියලා අධ්‍යාපනයට යොමු කරනවාට වඩා එය වෙන්ව තබාගෙන අධ්‍යාපන ක්‍රියාවලියට යෙදවීම සාර්ථකයි කියන පිළිවෙත ලෝකයේ පිළිගත් පිළිවෙතක්. ඒ නිසා පස් වැනි වසරට දරුවෙක් ඇතුළත් වෙන කොට අවුරුදු 10 සම්පූර්ණ වෙනවා. වසර 10 ක් සම්පූර්ණ වෙනවා. ඒ වාගේම දරුවෙකුට ගමේ හරිත වර්ණ ගහ කොළ යට ලබන අධ්‍යාපනය තරම් ප්‍රායෝගික නැහැ, නගරයේ තදබදයක් එක්ක ලබන අධ්‍යාපනය. හැම දරුවෙකුටම පුළුවන් නම් තමන්ගේ ප්‍රදේශයේ තමන්ගේ ග්‍රාමීය පාසලේ මූලික අධ්‍යාපනය ලබන්න - මේ විශ්ව විද්‍යාල පද්ධතියට සහ විද්‍යාපීඨ පද්ධතියෙන් පිටවන ගුරුවරුන් තමයි මේ දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්නේ. එතකොට ඔවුන්ට අවශ්‍ය වෙන්නේ ප්‍රාථමික පාසලක් පවත්වාගෙන යාමට අවශ්‍ය පරිසරය සහ ඒකට අවශ්‍ය කරන ආම්පන්න ටික විතරයි. ද්විතික පාසල් සංකල්පය හොඳයි. නමුත් ඒකේ වැරැද්ද තිබෙන්නේ, ඒකේ විද්‍යාගාරයට මහින්දෝදය විද්‍යාගාරය කියලා දාපු එක. ඕකේ නම වෙනස් කරලා ඉස්සරහාට අරගෙන ගියා නම් වැඩේ හොඳයි. ඒක තමයි ටිකක් අමාරුවට ප්‍රශ්නයක්ව තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඉතිහාසයේ ගියේ අඩි පාරවල්වල. කැළෑ මැද්දෙන් අඩි පාරවල්වල ගියේ. ඊට පස්සේ ගොන් බානක් බැඳගෙන කරත්ත පාරක් හදාගෙන කරත්ත පාරේ ගියා. ඒක දක්වා ඇවිත් අද අධිවේගී මාර්ගවල යනවා. අනේ ලෝකය දියුණු වුණේ මෙහෙම. අවුරුදු ගණනාවක් තිස්සේ. මෙතුමාට ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ පළාත් සභා කාලය තමයි දරාගන්න බැරි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙම ප්‍රායෝගික නොවී කථා කිරීම කිසිසේත්ම විෂයය බද්ධ වන්නේ නැහැ. අපට අවශ්‍ය වන්නේ වත්මන් දරු පරපුරට අධ්‍යාපනික වශයෙන් ඇති වෙලා තිබෙන අභියෝගවලට, පළාත් සභාවක් හැටියට අපි කොහොමද මුහුණ දීලා ඒ දරුවන්ගේ අනාගතයේ යහපත් මගට ගෙනි යන්නේ කියන කාරණාවයි. කිසිම විකල්පයක් නැහැ. මේකට පැහැදිලිවම තිබෙන්නේ අධ්‍යාපනයේ සම අවස්ථා දරුවන්ට ලබා දෙන්න නම් ගමේ පාසල, ග්‍රාමීය පාසල පැහැදිලිවම ඒ ප්‍රදේශයේ තිබෙන ප්‍රාථමික පාසලත්, ඒ එක්කම ඒ ආසන්නයේ නගරයේ ද්විතික පාසලක් හැටියට උසස් පෙළ හදාරන්න දරුවන්ට පහසුකම් සම්පූර්ණ වුණු පාසලකුත් නිර්මාණය කිරීම පමණයි.

දැන් රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට තිබුණු ප්‍රශ්නය ප්‍රාථමික පාසලේ ඉගෙන ගන්න දරුවාට ඊළඟට යන්න තිබෙන්නේ කොහෙද කියන ප්‍රශ්නය. ශිෂ්‍යත්වය සමත් නොවුණොත් එහෙම බලාපොරොත්තු වන පාසලට යන්න බැරි වුණොත්, ඊට පස්සේ යන්න තිබෙන්නේ කොහෙද කියන ප්‍රශ්නය. දැන් ශිෂ්‍යත්වය කියන මේ කඩඉම සමහර විට අසමත් වුණොත් එහෙම, දරුවාගේ කුසලතා වර්ධනයක් එතැනින් එහාට සිද්ධ වෙන්නේ නැහැයි කියලා විද්‍යාත්මකව කාටද ඔප්පු කරන්න පුළුවන්. 5 වසරේ ලකුණු අඩුයි. ඒ නිසා මේ ළමයාට කවදාවත්වත් විශ්ව විද්‍යාලයට යන්න පුළුවන්කමක් ඇති දරුවෙක් නොවෙයි. මේ ළමයා උසස් පෙළ සමත් වෙන්න බැරි දරුවෙක් කියලා කොයි විද්වතාටද තීන්දුවක් ගන්න පුළුවන්. එහෙමනම් ඒ දරුවන් කොන් කරන ක්‍රමය තමයි මේ හදලා තිබෙන්නේ. ඒක සම්පූර්ණයෙන්ම වැරැදියි. හරි ක්‍රමය තමයි ද්විතීක පාසල. ප්‍රාථමික පාසල අවසාන කරලා ද්විතීක පාසලට දරුවා යොමු කරන්න. මේ පාසල් වැසී යාමේ තර්ජනයට කිසිම උත්තරයක් නැහැ. මේ පාසල් වැසී යාමේ ප්‍රශ්නයට තිබෙන එකම උත්තරය මේ රටේ කූඨ ලියවිලි සකස් කරමින් වංචා සහගත විධියට නගරයේ පාසල්වලට දරුවන් යොමු කිරීමේ මහා ප්‍රෝඩාව. සත්‍යවාදී වශයෙන් කිසිම හෙයකින් මේ ආණ්ඩුවට උවමනාවක් නැහැ, කොන්ද කෙලින් තියාගෙන මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න. ගමේ උපන් දරුවා ගමේ ප්‍රාථමික අධ්‍යාපනය ලැබිය යුතුයි කියන සංකල්පය පැහැදිලිව මේ හොරකම්, වංචා, දූෂණ නැතිව මේ රට තුළ ක්‍රියාත්මක කරන්න පාලකයින්ට - පරිපාලකයින්ට තිබෙන කොන්ද පණ නැතිකම නිසා

[ගරු ජගත් අංගගේ]

මේ මහා අවාසනාව සිද්ධ වෙලා තිබෙනවා මිසක් වෙන කිසිම වැරැද්දක් මෙතැන වෙලා නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙය නිවැරදි කිරීම සඳහා රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ මෙම යෝජනාව ඉවහල් වෙනවා නම් මම හිතන්නේ, මේ රටට යහපතක් වෙයි. ඒ ඇරෙන්න කිසිම විකල්පයක් නැහැ. ඔබතුමාට බොහොම ස්තුතියි.

[ අ.භා. 01.20 ]

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැරැණි සෝවියට් කියමනක් තිබෙනවා, හොඳම දේ දරුවන්ට කියලා. ඒ නිසා ඒ කියමන කෙසේ වෙතත් අද මේ සභාවේ විශේෂ අවධානයක් යොමු වෙලා තිබෙනවා, බස්නාහිර පළාතේ ජීවත් වන දුවා දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබඳව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා දැන් මෙතැන පාසල් පද්ධතිය ගැන බොහෝ දේවල් කථා කළා. අද විශේෂ අවධානය යොමු වෙලා තියෙන්නේ, අධ්‍යාපනය දෙසටමයි. අද ඉදිරිපත් වෙලා තිබෙන ප්‍රශ්න 12 න් 08 ක්ම තිබෙන්නේ අධ්‍යාපන ඇමතිතුමාගෙන් අසන ප්‍රශ්න. යෝජනා දෙකක් ඉදිරිපත් වුණා. දෙකම අධ්‍යාපනය හා සම්බන්ධයි. ඇමතිතුමා අසනීප තත්ත්වයෙන් පසු වුවත් මම හිතන්නේ මෙතැනට එතුමාගේ ලේකම්තුමා සම්බන්ධ වෙලා තිබෙනවා. එතුමා මගින් හෝ මේ සභාවේ අද කථා කරන සියලු දේ එතුමාට දැනුම් දීලා මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න හැකියාව තිබෙනවා නම් මම හිතන්නේ, මේකෙන් යම් හෝ දෙයක් මේ බස්නාහිර පළාතේ ඉගෙන ගන්න දුවා දරුවන්ට යහපතක් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරින් වර මේ පළාත් සභා මගින් නොයෙක් විට පාසල් සඳහා නියමු ව්‍යාපෘති ගෙනාවා. අපට මතකයි, පුරෝගාමී පාසල් ව්‍යාපෘතිය. නවෝද්‍යා පාසල් ව්‍යාපෘතිය. ඉසුරු පාසල් ව්‍යාපෘතිය. මිතුරු පාසල් ව්‍යාපෘතිය. පොකුරු පාසල් ව්‍යාපෘතිය. ඒ වාගේ ද්විතික පාසල් දහසේ සංකල්පය. ඊට පස්සේ මෑතකදී අපි දැක්කා, ළඟම පාසල හොඳම පාසල බවට පත් කරන ඒ ව්‍යාපෘතිය. මේ හැම එකක්ම බැලුවාට පස්සේ, මේ හැම ව්‍යාපෘතියකින්ම අපට අන්තිමට ඉතිරි වෙලා තිබෙන්නේ අසාර්ථක දේවල් තමයි. අපි දැක්කා, ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී මතු කළා, ද්විතික පාසල් දහසේ ව්‍යාපෘතිය පිළිබඳව. හොඳම දේ ද්විතික පාසල් දහසේ ව්‍යාපෘතිය කියන සංකල්පය එතුමා මතු කළා. ඒකේදී අපි අහලා තිබෙනවා, අපේ රටේ හිටපු අධ්‍යාපන අමාත්‍යවරයෙක් වන කන්නන්ගර ඇමතිතුමා ගෙනාපු සංකල්පය ඉතාම ප්‍රායෝගික සංකල්පයක්. හැබැයි එතුමා ඒ යෝජනා ගෙනැල්ලා ඒ සංකල්පය ක්‍රියාත්මක කිරීමේදී දේශපාලනය සම්බන්ධ කර ගත්තේ නැහැ. දේශපාලඥයාට ඕනෑ කරන තමන්ගේ ආසනයේ තිබෙන පාසල ඒ ව්‍යාපෘතියට ඇතුළත් කරන්න අවශ්‍යතාවය එතුමාට තිබුණේ නැහැ. අපි දැක්කා පසුගිය කාලයේ ද්විතික පාසල් සංකල්පය ගෙනැල්ලා ඒ ප්‍රදේශයේ ජීවත්වන ඇමතිවරයා තමයි පාසල තේරුවේ. ඒකේ හොඳම උදාහරණය එතුමා දන්නවා. අද මොරොන්තුඩුවේ ධම්මානන්ද පාසලට අත් වෙලා තිබෙන ඉරණම. මාවල ඉගෙන ගන්න දරුවා පහෙන් පස්සේ ධම්මානන්දයට යොමු කළාට පස්සේ ඒ දරුවාට මැස්ටියේ ඉඳලා මාවල හන්දියට ඇවිල්ලා මාවල හන්දියෙන් මොරොන්තුඩුව හන්දියට ඇවිල්ලා මොරොන්තුඩුව හන්දියෙන් තවත් බස් එකක නැඟලා ධම්මානන්දයට එන කොට ඒ මතු වෙලා තිබෙන ගැටලුව තුළ අද ළමයින් කිහිප දෙනෙක් පාසල් නොගොස් ගෙදර ඉන්න තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා එම සංකල්පය හොඳටම ක්‍රියාත්මක වුණු ස්ථානයක් තමයි වාද්දුව මධ්‍ය මහා විද්‍යාලය. එතුමා දන්නවා. ඒ නිසා ඒ සංකල්පය නිවැරදි කරන්න නම් දේශපාලඥයාට ඕනෑ පාසල හොඳම පාසල කරනවා වෙනුවට මොකක් හරි ජාතික ප්‍රතිපත්තියක් අනුව ක්‍රියාත්මක වුණොත් තමයි ඒ සංකල්පය අපට අපේ දරුවන් වෙනුවෙන් හොඳම දේ කරන්න පුළුවන් වෙන්නේ.

අපි දන්නවා, ගමේ පාසල් පද්ධතිය මේ වන විට සීඝ්‍රයෙන් කඩා වැටීමක් තිබෙනවා. පසුගිය කාලයේ බණ්ඩාරගම ආසනයේ ක්‍රීඩා උළෙලකට සම්බන්ධ වෙන්න මට අවස්ථාව ලැබුණා. ඒ පාසලට මේ වසරේ දරුවන් හත් දෙනෙක් තමයි ඇතුළත් වෙලා තිබෙන්නේ. ඒ පාසලේ විදුහල්පතිතුමිය කිව්වේ තව අවුරුදු කිහිපයක් යන කොට ඉතා ඉක්මණින් වැහෙන පාසලක් බවට මේ පාසල පත් වෙනවා කියලා. ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමනි, මාවල විද්‍යාලයේ මේ වසරේ ළමයින් 14 දෙනයි ඉන්නේ. මේ පාසලත් හෙට දවසේ වැසී යාමේ තර්ජනයට ලක් වෙමින් තිබෙනවා. අපි දැක්කා, පසුගිය කාලය තුළ කළුතර දිස්ත්‍රික්කයේ විතරක් පාසල් 64 ක් විතර වැසී ගිය පාසල් බවට පත් වෙලා තිබුණා. ඒ නිසා මේ කොයි දේ තුළින් වුණත් වෙන්නේ, බස්නාහිර පළාතේ ඉගෙන ගන්න දුවා දරුවන්ට, දුප්පත් දෙමව්පියන්ගේ දරුවන්ට තමන්ට දෙන්න දායාද නැහැ.

එකම දේ තමයි අධ්‍යාපනය. තමන් බලාපොරොත්තු වෙන ඒ අධ්‍යාපනය තුළින් ඉහළට නංවා තබන්න. එය තමයි ගමේ ජීවත්වන දුප්පත් දෙමව්පියන් බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා ඔවුන්ගේ දරුවාට යන්න තිබෙන පාසල් පද්ධතිය කඩා වැටෙනවා නම් ඉතාම ඛේදවාචකයක් තමයි තිබෙන්නේ.

අපි දන්නවා, මෙහිදී විශාල වශයෙන් නගරයේ තිබෙන මධ්‍යම ආණ්ඩුවෙන් පාලනය වන ජාතික පාසල්වල සමාන්තර පන්ති වැඩි කිරීම නිසා ප්‍රබල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා, ගම් මට්ටමේ තිබෙන පාසල් පද්ධතියට. වැඩිම පහසුකම් ප්‍රමාණයක් ඒ පාසල්වලට ලබා දෙන කොට ගමේ තිබෙන පාසල් පද්ධතියට අඩු පහසුකම් ප්‍රමාණයක් ලබා දෙන කොට සෑම දෙමව්පියෙක්ම උත්සාහ කරනවා තමන්ගේ දරුවා හොඳම පාසලට, නැත්නම් පහසුකම් තිබෙන පාසලට යවා ගන්න. ඒකේ ප්‍රතිඵලයක් මේ ප්‍රශ්නයේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහිදී මම තව උදාහරණයක් දෙන්නම්. වාද්දුව මධ්‍ය ප්‍රාථමික විද්‍යාලය තිබෙනවා. ළමයින් 650 ඉගෙන ගන්න පාසලේ වැසිකිළි හතරක් තමයි තිබෙන්නේ. ඒ පාසලේ ඇත්තටම විවේක කාලය තුළදීත් 650 ක් දරුවන් ඉගෙන ගන්න පාසලේ වැසිකිළියට යන්න අවස්ථාවක් නැතිව ඉතා අමාරුවෙන් දුක් විඳලා ගෙදර ඇවිල්ලා ඒ තමන්ගේ අමාරුකම දෙමව්පියන්ට කියන අවස්ථාවක් අපට පසුගිය කාලයේ අසන්න ලැබුණා. ළමයින් 650 ක් ඉගෙන ගන්න පාසලේ වැසිකිළි 04 යි තිබෙන්නේ. මෙවැනි තත්ත්වයක් තමයි අපට දකින්න තිබෙන්නේ. ඒ නිසා මම හිතන්නේ මේ ගම්බද පාසල් පද්ධතිය රැක ගැනීම බස්නාහිර පළාත් සභාවේ විශේෂම කාර්ය භාරයක් බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මෙම බස්නාහිර පළාත් සභාව තුළින් ක්‍රියාත්මක වන ගම්බද පාසල් පද්ධතිය රැක ගැනීමට විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියන රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අපි අපගේ පූර්ණ සහයෝගය ලබා දෙනවා.

[ අ.භා. 01.27 ]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වපු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම වැදගත් අදහස් රාශියක් ප්‍රකාශ කරන්න තිබුණත් මම හිතන්නේ තව දුරටත් අදහස් ඉදිරිපත් කරන්න ගරු මන්ත්‍රීතුමන්ලාට කාල වේලාව ප්‍රමාණවත් වුණේ නැහැ. අපි හැමෝගේම අවධානය මේ කෙරෙහි අද යොමු වෙලා තිබෙන කොට ඒ එක්කම ජගත් අංගගේ අපේ ගරු මන්ත්‍රීතුමා කථා කළා. මේ ප්‍රශ්නවලට උත්තරයක් නැහැ. ව්‍යාජ ලේඛන හදලා නගරයේ පාසල්වලට යෑමෙන් මේ පාසල් වැසී යනවා කියලා. උත්තර නැති ප්‍රශ්න ලංකාවේ නොවෙයි ලෝකයේවත් තිබෙන්න විධියක් නැහැ. ඕනෑම ප්‍රශ්නයකට උත්තරයක් තිබෙනවා.

ඒ නිසා මේ උත්තර හදන්න දක්ෂ මන්ත්‍රීවරු පිරිසක් අපේ සභාවේත් ඉන්නවා. ඒ නිසා මම කියන්න කැමැතියි. අර මම කිව්වේ ඒකයි. වැල යන පැත්තට මැස්ස ගහලා උත්තර නැහැයි කියලා ඉන්න පිරිසක් නොවෙයි අපි. අපි අභියෝග භාර ගන්න කැමැතියි. බැරි නම් භාර දෙන්න. අපි කරන්නම්. මේ පිටිපස්සේ විශාල වශයෙන් වැඩ කරන්න සූදානම් පිරිසක් ඉන්නවා. අපි කරන්නම්. ඒ නිසා මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. ගම්බද පාසල් වැසී යන්නේ නගරයේ පාසලට දුවන නිසා නොවෙයි. බඳවාගන්න ගුරුවරු ඉන්නවා. උගන්වන්න පිරිස ඉන්නවා. මෙතැන ගොඩනැගිල්ල තිබෙනවා. මේ ක්‍රමවේදය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. කළමනාකරණය සිද්ධ වෙන්නේ නැහැ. ඒකයි මේ වෙලා තිබෙන්නේ. එහෙම නැත්නම් ගම්බද පාසල් වහන්න අවශ්‍ය නැහැ. අපි එදා පාසල් ඇරියා මිසක් වැහුවේ නැහැ. ඒක අපේ කළමනාකරණයේ දෝෂයක් කියන එක අපි අවබෝධ කරගන්න ඕනෑ. එහෙමනම් මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම කියනවා, අපි කථා කරද්දී කෙනෙක්ගේ හිත රිදුනා නම් සමාව භජනය කරනවා. මොකද, අපි මේ සෑම දෙයක්ම විවේචනය කරන්නේ රට හොඳ තැනකට යන්න ඕනෑ, පළාත් සභාව හොඳ තැනකට යන්න ඕනෑය කියන පරම පවිත්‍ර චේතනාවෙන්. නමුත් ඒවා කියද්දී යම් යම් අයගේ හිත රිදෙනවා. මොකද, කිල්ලෝටවල මොනවා හරි හුණු තිබෙනවා නම් ඒවා පොඩ්ඩක් කකියනවා. ඒ නිසා ඒවා ගැන තමුන්නාන්සේලා සියලු දෙනාගෙන්ම සමාව භජනය කරමින් මේ යෝජනාවට අපි සියලු දෙනාම එක්සත්ව කටයුතු කිරීමෙන් අපේ අනාගත පරම්පරාවක් ආරක්ෂා කරමු. ඒ නිසා මේ සඳහා දායකත්වය දුන්නු සියලුම දෙනාටම, මේ රට ජාතිය වෙනුවෙන්, රටේ සැබෑ උරුමකරුවන් වෙනුවෙන් ස්තුතිය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ගෙනෙන ලද යෝජනාව මම හිතන්නේ කාලෝචිත යෝජනාවක්. ඒ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "*දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි*" යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.29 ට, 2016 අප්‍රේල් මස 05 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 01.29 p.m till 9.30 a.m. on 05.04.2016*